වාර්ෂික වාර්තාව
සහ
ගිණුම්
2022



ශ්‍රී ලංකා අග්නිදිග
විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මඟින් අධ්‍යයන කටයුතු සහ ජයග්‍රහණ සම්බන්ධව ආයතනික දළ විශ්ලේෂණයෙනි සවිස්තරාත්මක සාරාංශයක් සපයයි. මෙහි අඩංගු තොරතුරු අදාල පීඨ/ දෙපාර්තමේන්තු/ අංශ/ ඒකක මඟින් සපයන ලද අතර තොරතුරු හා සංඛ්‍යාන ඒකකය මඟින් සම්පාදනය කරන ලදී.

පටුන

ශීර්ෂය		පිටු අංකය
දැක්ම		03
මෙහෙවර		03
අරමුණු		04
උපකුලපතිවරයාගේ පණිවුඩය		05
විශ්වවිද්‍යාලයේ පාලනය		06
I	පාලක මණ්ඩලය	06
II	සනාථන සභාව	08
III	සංවිධාන සටහන	12
1.	විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය	13
1.1	කෙටි හැඳින්වීම	13
1.2	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පවතින අධ්‍යයන වැඩසටහන්	14
1.3	පශ්චාත් උපාධි අධ්‍යයන	17
1.4	ලෝක ශ්‍රේණිගත කිරීම්	19
1.5	ශිෂ්‍ය ප්‍රජාව	19
1.6	සේවක ප්‍රජාව	20
1.7	අධ්‍යයන කාර්යමණ්ඩලයේ විහිදීම	20
1.8	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල	21
1.9	ජයග්‍රහණ සහ පිළිගැනීම්	24
1.10	අසාර්ථකවීම් සහ ඊට හේතු	31
1.11	අනාගත සැලසුම්	32
2.	සිසුන් සහ සම්පත්	35
2.1	ශිෂ්‍ය ප්‍රජාව සහ ස්ථීර කාර්ය මණ්ඩලය	35
2.2	දේශීය සිසුන් පිළිබඳ විස්තර	36
2.3	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	41
2.4	උපාධිධාරීන් බිහි කිරීම	42
2.5	නේවාසිකාගාර	46
2.6	සේවා නියුක්ත සමීක්ෂණය 2022	48
3.	මානව සම්පත්	51
3.1	කාර්ය මණ්ඩල විස්තර	51
3.2	අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	52
3.3	පරිපාලන, මූල්‍ය හා වෙනත් විධායක	53
3.4	අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	53
4.	පර්යේෂණ හා සංවර්ධන	54
4.1	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	54
4.2	2022 වසරේ දී ශ්‍රී.අ.වි වෙත පැමිණි ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ තොරතුරු	70
4.3	2022 වර්ෂය තුල මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර	70
4.4	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	71
4.5	අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් ලද විදේශීය අධි සාමාජිකත්ව, ශිෂ්‍යත්ව/සම්මාන පිළිබඳ	72

	තොරතුරු (සම්මන්ත්‍රණ/ වැඩමුළු/ කාර්ය මණ්ඩල සංවර්ධනය/ පුහුණු/ කෙටි පාඨමාලා)	
4.6	විදෙස් උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/ දායක ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර.	73
4.7	පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (2022 දී දේශීය හා විදේශීය)	76
4.8	2022 වර්ෂයේදී අදාල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	77
4.9	වැඩසටහන්,සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	77
5.	ප්‍රාග්ධන වැඩ	82
5.1	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර	82
6.	තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම්	83
6.1	තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් වල ජයග්‍රහණ	83
6.2	පරිසරය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග	87
7.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර	89
7.1	ආදායම	89
7.2	උත්පාදිත ආදායම (විස්තීර්ණ වැඩසටහන් හා පශ්චාත් උපාධි අධ්‍යයන)	89
7.3	ප්‍රධාන වැඩසටහන් වල පුනරාවර්ථන වියදම	89
	7.3.1 අධ්‍යයන සේවා සඳහා පුනරාවර්ථන වියදම	89
7.4	ප්‍රාග්ධන වියදම්	90
7.5	වියදම්	90
7.6	මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණය – 2022	90
	7.6.1 සිසුවෙකුට පිරිවැය (පුනරාවර්තන සහ ප්‍රාග්ධන පිරිවැය)	90
7.7	වාර්ෂික ගිණුම් – 2022	91
7.8	විගණකාධිපති වාර්තාව	109
7.9	විගණකාධිපති වාර්තාව සඳහා නිරීක්ෂණ	118

දැක්ම

විද්‍යාව, තාක්ෂණය, සහ මානව ශාස්ත්‍රය පිළිබඳ උසස් අධ්‍යයනය සහ නවෝත්පාදන සඳහා වූ දකුණු ආසියාවේ ජාත්‍යන්තරව පිළිගත් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

කලාපීය සහ ජාතික අවශ්‍යතාවයන්, සාමාජීය සහයෝගීතාවය සහ සමාජ සමූහයන් සවිබල ගැන්වීම සහ තෘප්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින්, දැනුම සහ නව නිපැයුම් උත්පාදනය කිරීම හා බෙදා හැරීම තුලින්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ උසස් අධ්‍යාපනය සඳහා පුළුල් අවස්ථාවන් සලසාදීම .

අරමුණු

1. අධ්‍යයන ගුණාත්මකභාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

2. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම ව්‍යාප්ත කිරීමේ විශිෂ්ඨත්වය.

3. සමාජ හා කාර්මික අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමේ විශිෂ්ඨත්වය.

4. යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනයෙහි විශිෂ්ඨත්වය.

5. ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවයේ විශිෂ්ඨත්වය.

6. යහ පාලනය සහ තිරසාර භාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

උපකුලපතිවරයාගේ පණිවුඩය



මහාචාර්ය ඒ.රමීස්

සිසුන්ගේ, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජයග්‍රහණයන් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සමස්ත ජයග්‍රහණයන් සහ පැතිකඩ 2022 වාර්ෂික වාර්තාව තුලින් ඉස්මතු කරනු ලබයි. 2019 සිට 2024 දක්වා ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක වලට සමාන්තරව සමාජ, සංස්කෘතික, කලාපීය හා ජාතික සංවර්ධනයේදී විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද දායකත්වයන් වාර්තාව තුලින් ඉස්මතු කරයි. ඊට අමතරව, විශ්වවිද්‍යාලය මුහුණ දෙන අභියෝග සහ අඩුපාඩු, සාධාරණ හේතු සහිතව අවධාරණය කෙරේ.

වර්තමානයේදී, මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්ත අභියෝගවලට මුහුණ දී සිටියද උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාලය විසින් සාර්ථකව සිදු කර ඇත. තවද, භාණ්ඩාගාර අරමුදල් සහ AHEAD අරමුදල් වල සහයෝගයෙන් සිසුන් සඳහා සපයන සේවාවන්හි කාර්යසාධනය සහ ගුණාත්මකභාවය ශක්තිමත් කරන ලදී. එපමණක් නොව, විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් ඔවුන්ගේ පර්යේෂණ කෘතිවල ප්‍රකාශන වැඩි ප්‍රමාණයක් සුප්‍රකට දර්ශකගත සඟරාවල සිදු කර ඇති අතර, විශ්වවිද්‍යාලයේ මානව ප්‍රාග්ධනය මනා සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ වෙනත් වෘත්තිකයන් එකතු කිරීමත් සමඟ ශක්තිමත් විය. ඊට සමගාමීව, ආචාර්යවරුන් කිහිප දෙනෙකු මහාචාර්යවරුන් ලෙස උසස් කිරීම විශ්වවිද්‍යාලයේ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක භාවය සහ ප්‍රමාණය ඉහළ නංවා ඇත.

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කළ සියළුම දෙනාට සහ වාර්ෂික වාර්තාව සඳහා දායකත්වය සැපයූ සැමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මහාචාර්ය ඒ.රමීස්, PhD (NUS)
උපකුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

I. විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පාලනාධිකාරය සහ ප්‍රධාන විධායක ඒකකය වන්නේ විශ්වවිද්‍යාල පාලක සභාවයි. 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වැනි වගන්තියෙන් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තියට අනුව පිහිටුවන ලද විශ්වවිද්‍යාල පාලක සභාව, 2022 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී පාලක සභාවේ ලේකම්වරයා වේ.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

නම	තනතුර
මහාචාර්ය ඒ. රමීස්	උපකුලපති (සභාපති)
ආචාර්ය එස්.එම්. ජුනයිඩීන්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය (2022.08.18 දක්වා)
මහාචාර්ය එම්.ඒ.එල්.අබ්දුල් හලීම්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය (2022.08.18 සිට)
මහාචාර්ය එස්.එම්.එම්.මසාහීර්	පීඨාධිපති/ ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන් මිය.	පීඨාධිපති/කළමනාකරණ හා වාණිජ පීඨය
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2022.08.03 දක්වා)
ආචාර්ය එම්.එච්.හාරූන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය (2022.08.03 සිට)
මහාචාර්ය එම්.එම්.ෆාසිල්	පීඨාධිපති/ කලා හා සංස්කෘතික පීඨය
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති/ තාක්ෂණ පීඨය
ආචාර්ය එම්.එච්.හාරූන්	සනාථන සභා නියෝජිත (2022.05.24 දින දක්වා)
මහාචාර්ය එෆ්.එච්.ඒ.රාවුෆ් මිය.	සනාථන සභා නියෝජිත
මහාචාර්ය ඒ.එම්.රස්මි	සනාථන සභා නියෝජිත (2022.05.24 දින සිට)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව විසින් පත්කල සාමාජිකයින්	
අයි.එම්.හනීෆා මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ආචාර්ය අන්වර්.එම්.මුස්තාෆා	සභාපති/ නැගෙනහිර පළාත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මණ්ඩලය
ඉංජි.මුහීනුඩීන් අබ්දුල් කාදර්	ඉංජිනේරු/ කළමනාකරණ අධ්‍යක්ෂක- බෙටා (BETA) ජාත්‍යන්තර සමාගම, කොළඹ
වෛද්‍ය ටී.එස්.ආර්.ටී.ආර්.රජාබ්	වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, පොතුවිල්
ඉංජි . එන්.ටී. මොහමඩ් සිරජුදීන්	විශ්‍රාමික ප්‍රධාන ඉංජිනේරු/ මාර්ග සංවර්ධන අධිකාරිය, අම්පාර
එම්.සී.මොහමඩ් නවාස් මහතා	නීතීඥ
මහාචාර්ය කොලින්.එන්.පීරිස්	අධ්‍යක්ෂ/ අධ්‍යයන සංවර්ධන සහ තත්ත්ව ආරක්ෂණ, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
ජේ.එම්.නලීර් මහතා	ගණකාධිකාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මුතූර්
ඩී.එල්.එම්.බණ්ඩාරනායක මහතා	ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
මහාචාර්ය හේමා එම්.කේ.කේ.පතිරණ මිය	රසායන විද්‍යාව පිළිබඳ විශ්‍රාමික මහාචාර්ය රුහුණු විශ්වවිද්‍යාලය

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

II. විශ්වවිද්‍යාල සනාථන සභාව

1985 අංක 07 දරන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තියට අනුව පිහිටුවන ලද විශ්වවිද්‍යාල සනාථන සභාව, 2022 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

නිළ බලයෙන් පත්වූ සාමාජිකයින්

මහාචාර්ය ඒ.රමීස්	උපකුලපති (සභාපති)
ආචාර්ය එස්.එම්.ජුනයිඩීන්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය *(2022.08.18 දක්වා)*
ආචාර්ය එම්.ඒ.එල්.අබ්දුල් හලීම්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය *(2022.08.18 සිට)*
මහාචාර්ය එස්.එම්.එම්.මසාහිර්	පීඨාධිපති /ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන් මිය.	පීඨාධිපති /කළමනාකරණ හා වාණිජ පීඨය
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය *(2022.08.03 දක්වා)*
ආචාර්ය එම්.එච්.හාරූන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය *(2022.08.03 සිට)*
මහාචාර්ය එම්.එම්.ෆාසිල්	පීඨාධිපති /කලා හා සංස්කෘතික පීඨය
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති / තාක්ෂණ පීඨය
මහාචාර්ය එම්.ඒ.එම්.රමීස්	
මහාචාර්ය එෆ්.එච්.ඒ.රාවුෆ් මහත්මිය	
මහාචාර්ය ඒ.එල්.ඒ.රාවුෆ්	
මහාචාර්ය අබුබකර්.ජහුෆර්	අංශ ප්‍රධාන / ගණිත විද්‍යා
මහාචාර්ය ඒ.එම්.මුසාතික්	
මහාචාර්ය එම්.බී.එම්.ඉස්මයිල්	අංශ ප්‍රධාන / අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ආදම්බාවා ජහ්ෆර්	
මහාචාර්ය ඒ.එල්.එම්.රියාල්	අංශ ප්‍රධාන / සමාජීය විද්‍යා අධ්‍යයනාංශය *(2022.06.06 සිට)*
මහාචාර්ය ඒ.එම්.එම්.මුස්තාෆා	අංශ ප්‍රධාන / කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය ඒ.එම්.රස්මි	
මහාචාර්ය එම්.අයි.එම්.හිලාල්	අංශ ප්‍රධාන /අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
මහාචාර්ය එස්.ගුණපාලන්	
මහාචාර්ය කේ.එම්.මුබාරක්	
මහාචාර්ය එම්.අයි.එම්.කලීල්	
මහාචාර්ය එස්.සබ්‍රාස් නවාස්	අංශ ප්‍රධාන / කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
මහාචාර්ය එයි.එල්.එම්.මාහිර්	

මහාචාර්ය කේ.කනේසරාජා	
මහාචාර්ය එස්.එම්.අයූබ්	අංශ ප්‍රධාන / සමාජ විද්‍යා අධ්‍යයනාංශය *(12.07.2022 සිට)*
මහාචාර්ය එම්.ඒ.එම්.ෆවුසර්	දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
මහාචාර්ය එච්.එම්.එම්.නලීර්	අංශ ප්‍රධාන / පරිගණක විද්‍යා අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.අයි.එස්.සෆිනා මහත්මිය	
මහාචාර්ය ඒ.එෆ්.එම්.අෂ්රොෆ්	
මහාචාර්ය එම්.ඒ.එස්.එෆ්. සාදියා මිය	අංශ ප්‍රධාන / භාෂා අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.එච්.තවුෆික්	
එම්.එම්.රිෆවුදීන් මහතා	පුස්තකාලායාධිපති
ආචාර්ය ඒ.හලීම්	අංශ ප්‍රධාන /ගිණුම්කරණ හා මූල්‍ය දෙපාර්තමේන්තුව
මහාචාර්ය එම්.ඒ.එල්. අබ්දුල් හලීම්	අංශ ප්‍රධාන /අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන
ඉංජිනේරු එම්.අයි.ඉල්හාම් ජසීල්	අංශ ප්‍රධාන / අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන *(2022.08.18 දක්වා)*
ආචාර්ය ඒ.එම්.අස්ලාම් සාජා	අංශ ප්‍රධාන / අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන *(2022.08.18 සිට)*
ආචාර්ය ඒ.එම්.එම්.නවාස්	අංශ ප්‍රධාන /ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය
ආචාර්ය **එම්.එච්.හාරූන්**	අංශ ප්‍රධාන / රසායන විද්‍යා අධ්‍යයනාංශය *(2022.08.03 දක්වා)*
ආචාර්ය එම්.එන්.එම්.ෆර්හාත්	අංශ ප්‍රධාන / රසායන විද්‍යා අධ්‍යයනාංශය *(2022.08.03 සිට)*
ආචාර්ය ඒ.ඒ.එම්.නුෆයිල්	අංශ ප්‍රධාන / ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය අධ්‍යයනාංශය *(2022.05.06 දක්වා)*
එස්.සන්තිරකුමාර්	අංශ ප්‍රධාන / ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය අධ්‍යයනාංශය *(2022.05.06 සිට)*
ආචාර්ය එස්.අනුසියා	අංශ ප්‍රධාන / සමාජීය විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය වී.සුජාරාජිනී මිය	අංශ ප්‍රධාන / ජෛවීය විද්‍යා අධ්‍යයනාංශය
ඒ.එම්.රියාස් අහමඩ් මයා	අංශ ප්‍රධාන / ජෛවීය විද්‍යා අධ්‍යයනාංශය *(2022.01.07 සිට)*
එම්.එච්.එම්.රිනෝස් මයා	අංශ ප්‍රධාන / භූගෝල විද්‍යා අධ්‍යනාංශය
කේ.නජමීර් මයා	අංශ ප්‍රධාන / භූගෝල විද්‍යා අධ්‍යනාංශය *(2022.07.12 සිට)*
ඒ.එල්.හනීස් මයා	අංශ ප්‍රධාන / ගණිතමය විද්‍යා අධ්‍යනාංශය
එම්.ඒ.ඒ.එම්.ෆාහිම් මයා	අංශ ප්‍රධාන / ගණිතමය විද්‍යා අධ්‍යනාංශය

	(2022.08.16 සිට)
ආචාර්ය පී.එම්.කේ.අලහකෝන්	අංශ ප්‍රධාන / විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යනාංශය
ආචාර්ය ඒ.එම්.එන්.එම්.අධිකාරම් මිය	අංශ ප්‍රධාන / භෞතික විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය එම්.ජේ.එම්.ජෆීන්	අංශ ප්‍රධාන / භෞතික විද්‍යා අධ්‍යයනාංශය *(2022.08.25 සිට)*
ආචාර්ය ඩබ්.ජී.සී.ඩබ්.කුමාර	අංශ ප්‍රධාන / පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය
ආචාර්ය එම්.එන්.අජ්මාල් හිනාස්	අංශ ප්‍රධාන / පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය *(2022.08.21 සිට)*
ආචාර්ය යූ.ෆාරූක්	අංශ ප්‍රධාන / යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
මහාචාර්ය ඒ.එම්.මුසාතික්	අංශ ප්‍රධාන / යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
ඉංජි. පී.බල්තසාර්	අංශ ප්‍රධාන / යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය *(2022.10.01 සිට)*
කේ.මොහමඩ් රිෆ්ති මහතා	අංශ ප්‍රධාන / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය
ඉංජි. එම්.සී.රියාස්	අංශ ප්‍රධාන /සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
එම්.සී.එස්. ශාතිෆා මහතා	අංශ ප්‍රධාන /අරාබි භාෂා අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.එන්.එම්.මුබාරක්	අංශ ප්‍රධාන / ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය *(2022.02.20 දක්වා)*
ආචාර්ය එම්.එම්.මුනීබ්	අංශ ප්‍රධාන / ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය *(2022.02.20 සිට)*
ආචාර්ය ආර්.ඒ.සර්ජූන්	අංශ ප්‍රධාන /ඉස්ලාම් අධ්‍යයන අධ්‍යයනාශය
සී.එම්.එම්.මන්සූර් මහතා	අංශ ප්‍රධාන /තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය *(2022.03.28 සිට)*
එම්.එස්.ෆාතිමා ෆයාසා මිය	අංශ ප්‍රධාන / තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය / කලා හා සංස්කෘතික පීඨය *(2022.03.28 දක්වා)*
පත්කල සාමාජිකයින්	
ව්‍යවහාරික විද්‍යා පීඨය	
එම්.ඒ.ඒ.එම්.ෆහාම් මහතා	*(2022.08.17 දක්වා)*
ඒ.එම්.රියාස් අහමඩ් මහතා	*(2022.01.07 දක්වා)*
ආචාර්ය යූ.එල්.සයිනුඩීන්	*(2022.08.18 සිට)*
ආචාර්ය එම්.ඒ.සී.අක්මාල් ජහාන්	*(2022.08.18 සිට)*

කලා හා සංස්කෘතික පීඨය	
ඒ.වික්‍රමරත්න මහතා	
එම්.ඒ.එම්.සමීම් මහතා	
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	
ආචාර්ය ඒ.ආර්.නසාර්	*(2022.07.07 දක්වා)*
ආචාර්ය එස්.එම්.එම්.නෆීස්	*(2022.07.07 දක්වා)*
ආචාර්ය එච්.එම්.ඒ.හිල්මි	*(2022.07.07 සිට)*
කළමනාකරණ හා වාණිජ පීඨය	
ආචාර්ය එම්.එච්.තවුෆික්	*(2022.06.21 දක්වා)*
ආචාර්ය අයි.රයිසාල්	*(2022.12.13 දක්වා)*
එස්.එම්.මුර්ෂිතා මිය	*(2022.06.21 සිට)*
ඉංජිනේරු පීඨය	
ඉංජිනේරු ඒ.එල්.එම්.රිසාත්	*(2022.09.09 දක්වා)*
ආචාර්ය ජේ.ඒ.එස්.පී.ජයකොඩි	*(2022.09.09 දක්වා)*
ආචාර්ය එස්.එම්.ජුනයිඩීන්	*(2022.09.09 සිට)*
ඉංජි.එම්.එච්.ෆයාස් අහමඩ්	*(2022.09.09 සිට)*
තාක්ෂණ පීඨය	
ආර්.කේ.ඒ.රිෆායි කාරියප්පර් මහතා	
ආචාර්ය ඒ.එන්.ඩී.ටී.කුමාර	

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

SSSW- සේවා සහ සහාය ආයතන සහ සුභසාධන
OSPIM- ආයතනික සැලසුම්කරණ සහ මූල්‍යමය ප්‍රතිඵල කළමනාකරණ
RIC- පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය
CEDPL- ඉංජිනේරු උපාධි සහ වෘත්තීය ප්‍රගුණිය මධ්‍යස්ථානය
CCU- ව්‍යාපෘතිය මෙහෙයවීම් ඒකකය
SDC- ඝනකම මෙහෙයවීම් මධ්‍යස්ථානය
CGEE -ජාති ප්‍රැග්ම සාධාරණීකරණ හා සමානාත්මතා මධ්‍යස්ථානය
UBL Cell- විශ්වවිද්‍යාලීය සහාය ඒකකය
MIT- තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
CQA- ගුණාත්ම සහතික මධ්‍යස්ථානය

DR- ශිෂ්‍යත්ව මෙහෙයවුම්කරු
DB- ශිෂ්‍යත්ව ලේඛකාධිකාරී
SAB- සහාය ශිෂ්‍යත්ව මෙහෙයවුම්කරු
SAR- සහාය ශිෂ්‍යත්ව මෙහෙයවුම්කරු
SAIA- සහාය ශිෂ්‍යත්ව ආයතනික
සහායක
WE- වැඩ ඉංජිනේරු
AR- සහාය මෙහෙයවුම්කරු
AB- සහාය මෙහෙයවුම්කරු
AIA- සහාය ආයතනික සහායක
CSO- ප්‍රධාන ආරක්ෂක නිලධාරී

SALB- සහාය ශිෂ්‍යත්ව ලේඛකාධිකාරී
ALB- සහාය ශිෂ්‍යත්ව ලේඛකාධිකාරී
AS- සහාය ලංකාරාක්ෂ

ඉංජිනේරු විද්‍යාලීය ගුරුවරුන්ගේ සභාව
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
ශ්‍රී.ලං.ඉ.ආ.
ආයතන ප්‍රධානී
සහාය ආයතන
SAIA
AIA
DB/ ශිෂ්‍යත්ව හා අයවැය
AB/ ලේඛිකා
SAB/ විද්‍යුත්
AB/ CEDPL
DB
AB
DR/ පරිපාලන
DR/ ආගන්තුක අධ්‍යයන
DR / සංයෝජන අනධ්‍යයන
DR/ ගුණාත්මක පාලන හා ශිෂ්‍ය සුභසාධන
SAR/අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු
SAR/ ඉංජිනේරු හා ශිෂ්‍ය සුභසාධන
DR/විභාග
DR/ශිෂ්‍යත්ව
CSO/ ආරක්ෂක හා ආරක්ෂණ නිලධාරී
ඉංජිනේරු විද්‍යාලීය ගුරුවරුන්ගේ සභාව/ අධ්‍යක්ෂකවරු
කළමනාකරණ මණ්ඩලය
SSSW/ OSPIM RIC AHEAD ICT ආයතනික CEDPL CGU SDC CGEE
උපදේශක ආයතන
බාහිර විද්‍යා ආයතන
UBL Cell
HOD/ ඇප්ලිකී විද්‍යා හා සංවිධානය
HOD/ ඉංජිනේරු විද්‍යා
HOD/ භූගෝල විද්‍යා
HOD/ භාෂා
HOD/ ගණිත හා ඉලෙ
HOD/ මානව විද්‍යා
HOD/ ඉංජිනේරු විද්‍යා
HOD/ ගණිතය
HOD/ ඉංජිනේරු විද්‍යා
HOD/ කළමනාකරණ
HOD/ අලුතින් බිහිවන තාක්ෂණ
HOD/ ඉංජිනේරු විද්‍යා
HOD/ ඉංජිනේරු විද්‍යා
HOD/ ඉංජිනේරු විද්‍යා

1. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

1.1 කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 1995 වසරේ දී ස්ථාපිත කර ඇත. ප්‍රධාන විශ්වවිද්‍යාලය ඔලුවිල් හි වෙරළබඩ තීරයේ ස්ථාපිත කර අති අතර එය අක්කර 178.98 ක පමණ (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව) තෘණ භූමි භාගයක ව්‍යාප්තව ඇත. විශ්වවිද්‍යාලයේ (ඔලුවිල් පරිශ්‍රයේ) නැගෙනහිර කොටසේ පවතින අඛණ්ඩ මුහුදු බාදනය හේතුවෙන් භූමි ප්‍රමාණයෙන් අක්කර 25.45 ක ප්‍රමාණයක් මේ වන විට විශ්වවිද්‍යාලයට අහිමි වී ඇත. ව්‍යාවහාරික විද්‍යා පීඨය අක්කර 6.72 ක භූමිභාගයක සමන්තුරේ පිහිටා ඇත (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව). තාක්ෂණික පීඨය යටතේ වූ මල්වත්ත ගොවිපළ (2011 තක්සේරු කිරීම් අනුව,අක්කර 35.25) කෘෂි තාක්ෂණය සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදා ගනු ලබයි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් විශ්වවිද්‍යාලය විසින් අත්කරගෙන ඇත.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සහ විදේශීය රැකියා අවස්ථා සඳහා සරිලන ලෙස උපාධිධාරීන් බිහිකිරීම අරමුණුකොට ගෙන ඊට ගැළපෙන පරිදි විශිෂ්ඨ අධ්‍යයන මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කරන විශ්වවිද්‍යාලයකි. එසේම සමස්ථ ප්‍රජාවට සහ ඇල්මක් දක්වන පාර්ශ්ව සඳහා අවශ්‍යතාවයට අනුකූල වන පරිදි පහසුකම් සපයමින් බහුවිධ පර්යේෂණ සංස්කෘතියක් විශ්වවිද්‍යාලය තුල වර්ධනය කිරීමට කටයුතු කරමින් සිටියි. මීට අමතරව ප්‍රදේශයේ සාමය සහ සහජීවනය සඳහා ද විශ්වවිද්‍යාලය විශාල දායකත්වයක් සපයයි. වර්තමානයේ විශ්වවිද්‍යාලය සතුව පවතින පීඨ හය තුල අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 7,185 ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 531 ක් සිටියි. විශ්වවිද්‍යාලය සතුව ස්ථීර කාර්ය මණ්ඩලය 674 ක් සිටින අතර මේ තුල අධ්‍යයන කාර්ය මණ්ඩලය 223 දෙනෙකු සිටියි.

විශ්වවිද්‍යාලයේ නාමය ජාත්‍යන්තරයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය එහි විශිෂ්ඨ විද්වතුන් සමඟින් කැප වී සිටී.

1.2 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතුව පීඨ හයක් (06) ඇති අතර ඒවා නම්, කලා සහ සංස්කෘතික පීඨය, කළමනාකරණ සහ වාණිජ පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය, ඉංජිනේරු පීඨය සහ තාක්ෂණ පීඨය යන පීඨ වේ. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් මූලික උපාධි සහ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ විවිධ පුහුණු වැඩසටහන් සිදු කරයි.

දේශීය ප්‍රජාවගේ වුවමනාවන් සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් දේශීය හා විදේශීය සංවිධාන සමඟ වැඩමුළු පවත්වමින් සහයෝගිව කටයුතු කරයි. අධ්‍යයනාංශ, ඒකක සහ පීඨ මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

වගුව 1.1: ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ ඒකක පිළිබඳ විස්තර

කලා හා සංස්කෘතික පීඨය
සමාජීය විද්‍යාව
භාෂා
දේශපාලන විද්‍යාව
සමාජ විද්‍යාව
ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය
භූගෝල විද්‍යාව
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්
තොරතුරු හා තාක්ෂණය
පශ්චාත් උපාධි ඒකකය
කළමනාකරණ හා වාණිජ පීඨය
ගිණුම්කරණ හා මූල්‍ය
කළමනාකරණ
කළමනාකරණ තොරතුරු තාක්ෂණ
අලෙවි කළමනාකරණ
පශ්චාත් උපාධි ඒකකය
ව්‍යවහාරික විද්‍යා පීඨය
ජීව විද්‍යාව
ගණිත විද්‍යාව
භෞතික විද්‍යාව
පරිගණක විද්‍යාව
රසායනික විද්‍යාව

ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා
ඉස්ලාම් අධ්‍යයනය
අරාබි භාෂාව
අන්තර් ක්ෂේත්‍ර පාඨමාලා ඒකකය
පශ්චාත් උපාධි ඒකකය
ඉංජිනේරු පීඨය
සිවිල් ඉංජිනේරු
යාන්ත්‍රික ඉංජිනේරු
විදුලි සහ ඉලෙක්ට්‍රෝනික් ඉංජිනේරු විද්‍යාව
පරිගණක විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව
අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයනය
තාක්ෂණ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ජෛව පද්ධති තාක්ෂණය
පශ්චාත් උපාධි ඒකකය

1.2 වගුව. පීඨ විසින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා (අභ්‍යන්තර)

උපාධි පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍යය
කලා සහ සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ / ඉංග්‍රීසි
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව සහ මනෝ උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
හින්දු ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
ත්‍රිභාෂා අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ත්‍රෛභාෂා
කළමනාකරණ සහ වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ / ඉංග්‍රීසි
වාණිජවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	
ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		

උපාධි පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍යය
ව්‍යවහාරික විද්‍යා පීඨය				
විද්‍යාවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	ඉංග්‍රීසි
ව්‍යවහාරික ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	

උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
ඉස්ලාමීය චින්තනය සහ ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ
ඉස්ලාමීය බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
ඉස්ලාමීය නීතිය සහ නීති සම්පාදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		දමිළ
අරාබි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි සහ දමිළ
වාග් විද්‍යාව හා පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි, ඉංග්‍රීසි සහ දමිළ
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (කලා හා සංස්කෘතික පීඨය සමග සහයෝගී වැඩසටහනක් ලෙස)	6	විශේෂ		ඉංග්‍රීසි
ඉංජිනේරු පීඨය				
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (සිවිල් ඉංජිනේරු)	7	විශේෂ	අවුරුදු 4	ඉංග්‍රීසි
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (විදුලි සහ විදුලි සංදේශ ඉංජිනේරු)				
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (යාන්ත්‍රික ඉංජිනේරු)				
තාක්ෂණ පීඨය				
කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ	අවුරුදු 4	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි

1.3 වගුව: සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා (බාහිර)

සහතික පත්‍ර පාඨමාලා			
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**කාලසීමාව**	**මාධ්‍යය**
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍රය	-	මාස 06	ඉංග්‍රීසි
මානව හිමිකම් පිළිබඳ කෙටි පාඨමාලාව	-	මාස 03	දමිළ
සිංහල භාෂාව පිළිබඳ කෙටි පාඨමාලාව	-	මාස 03	සිංහල
ඩිප්ලෝමා පාඨමාලා (පශ්චාත් උපාධි නොවන)			
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**කාලසීමාව**	**මාධ්‍යය**
උපදේශනය පිළිබඳ වෘත්තීමය ඩිප්ලෝමාව	3	මාස 18	දමිළ
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	1	අවුරුදු 1	ඉංග්‍රීසි
ජනමාධ්‍යවේදී ඩිප්ලෝමාව	3	අවුරුදු 1	දමිළ
සිංහල ඩිප්ලෝමාව	3	අවුරුදු 1	සිංහල

1.3 වගුව: සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා (බාහිර)

මූලික උපාධි පාඨමාලා (බාහිර)				
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**විශේෂ/සාමාන්‍ය**	**කාලසීමාව**	**මාධ්‍යය**
කලා හා සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
කළමනාකරණ හා වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
වාණිජවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	

1.3 පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා / වැඩසටහන්

කලා හා සංස්කෘතික පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය, සහ ව්‍යවහාරික විද්‍යා පීඨය, ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය සහ තාක්ෂණ පීඨය විසින් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි. (1.5 වගුව). 2022 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් දර්ශණවේදී උපාධිධාරීන් 04ක් (දමිළ දර්ශණවේදී උපාධිය) දර්ශණපති උපාධිධාරීන් 01 ක් (දමිළ දර්ශණපති උපාධිය) බිහි කරන ලදී.

1.5 වගුව: පශ්චාත් උපාධි පාඨමාලා

පීඨය	පශ්චාත් උපාධි පාඨමාලාව	SLQF මට්ටම	පූර්ණ/අර්ධ කාලීන	කාලසීමාව	මාධ්‍යය
කලා හා සංස්කෘතික පීඨය					
දෙමළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		8	අර්ධ	අවුරුදු 01	දමිළ
දෙමළ ශාස්ත්‍රපති උපාධිය		10	අර්ධ	අවුරුදු 02	
දෙමළ දර්ශණවේදී		11	අර්ධ/පූර්ණ	අර්ධ කාලීන (මාස 36) පූර්ණ කාලීන (මාස 24)	
භූගෝල විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ		දමිළ/ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ		
දේශපාලන විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ		
සමාජ විද්‍යා දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ		
ආර්ථික විද්‍යා දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ		දමිළ/ඉංග්‍රීසි
දෙමළ ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	පූර්ණ කාලීන (මාස 54) පූර්ණ කාලීන (මාස 36)	දමිළ
භූගෝල විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ		දමිළ/ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ		
දේශපාලන විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ		
සමාජ විද්‍යා ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ		
ආර්ථික විද්‍යා ආචාර්ය උපාධිය			අර්ධ/පූර්ණ		දමිළ/ඉංග්‍රීසි
සමාජ විද්‍යා ආචාර්ය උපාධිය					
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDM)		8	පූර්ණ	අවුරුදු 01	ඉංග්‍රීසි
ව්‍යාපාර පරිපාලනපති උපාධිය (MBA)		10	පූර්ණ	අවුරුදු 02	
ව්‍යවහාරික විද්‍යා පීඨය					
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		8	අර්ධ	අවුරුදු 01	ඉංග්‍රීසි
භෞතික විද්‍යාව සහ පෘථිවි විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය		11	පූර්ණ කාලීන අර්ධ කාලීන	මාස 24 මාස 36	
පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශණවේදී උපාධිය					
උද්භිද විද්‍යාව සහ සත්ව විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය					
රසායන විද්‍යා දර්ශණපති උපාධිය					
ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය දර්ශණපති උපාධිය					
භෞතික විද්‍යාව සහ පෘථිවි විද්‍යාව පිළිබඳ දර්ශණසූරි උපාධිය		12	පූර්ණ කාලීන අර්ධ කාලීන	මාස 36 මාස 54	
පරිගණක විද්‍යා දර්ශණසූරි උපාධිය					
උද්භිද විද්‍යා සහ සත්ව විද්‍යා දර්ශණසූරි උපාධිය					
රසායන විද්‍යා දර්ශණසූරි උපාධිය					
ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය දර්ශණසූරි උපාධිය					
ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය					
ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ දර්ශනපති උපාධිය		11	පූර්ණ	මාස 24	දමිළ
ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ දර්ශනසූරි උපාධිය		12	පූර්ණ	මාස 36	දමිළ
තාක්ෂණ පීඨය					
ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ පර්යේෂණ දර්ශනපති උපාධිය		11	පූර්ණ / අර්ධ	අවුරුදු 2	ඉංග්‍රීසි
ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධිය (පර්යේෂණ උපාධි වැඩසටහන)		12	පූර්ණ / අර්ධ	අවුරුදු 3	ඉංග්‍රීසි

1.4 ලෝක ශ්‍රේණිගත කිරීම්

වෙබ් දර්ශක (Webometric) ශ්‍රේණිගත කිරීම් අනුව 2023 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 7908 වන ස්ථානයේ සිටී. (2022 වර්ෂයේදී වෙබ් දර්ශක ශ්‍රේණිගත කිරීම් අනුව 7941 වන ස්ථානයේ පසු විය.) අධ්‍යාපන ආයතන වඩා හොඳ සේවාවක් ලබා දීමට දැඩි උත්සාහයක් දරනා ඉතා තරඟකාරී ලොවක ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් තුල පවතින ස්ථානයෙන් ඉහල යාම සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදුකිරීමට පියවර ගෙන තිබේ.


1.5 ශිෂ්‍ය ප්‍රජාව

2022 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ජනගහනය 7185 කි. එක් එක් පීඨය අතර සිසුන්ගේ සමානුපාතික ව්‍යාප්තිය 1.6 වගුවෙහි දැක්වේ.

1.6 වගුව: 2022 දෙසැම්බර් 31 වන විට පීඨ අනුව ශිෂ්‍ය ව්‍යාප්තිය

පීඨය	සිසුන් සංඛ්‍යාව	ප්‍රතිශතය(%)
කලා හා සංස්කෘතික	1299	18.08
කළමනාකරණ හා වාණිජ	1868	26.00
ව්‍යවහාරික විද්‍යා	1024	14.25
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා	1746	24.30
ඉංජිනේරු	400	5.57
තාක්ෂණ	848	11.80


පීඨය සහ වර්ෂය අනුව ශිෂ්‍ය ප්‍රජාව රූප සටහන 1.1 හි දැක්වේ



රූපසටහන 1.1: ශිෂ්‍ය ප්‍රජාව

1.6 සේවක ප්‍රජාව


2022 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සේවක ප්‍රජාව (ස්ථිර කාර්ය මණ්ඩලය) 674 කි. කාණ්ඩය අනුව සේවකයින්ගේ සමානුපාතික ව්‍යාප්තිය රූප සටහන 1.2 හි දැක්වේ.




1.2 රූප සටහන: 2022 දෙසැම්බර් වන විට සේවක ප්‍රජාවේ (ස්ථිර කාර්ය මණ්ඩලය) සමානුපාතික ව්‍යාප්තිය

1.7 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය

තනතුර සහ අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විභිදීම් රූප සටහන 1.3 හා 1.4 මඟින් පෙන්නුම් කරයි.



1.3: රූපසටහන
2022 දෙසැම්බර් 31 දිනට තනතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විභිදීම



1.4 රූපසටහන: 2022දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විහිදීම

1.8 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ (SEUSL) පුස්තකාලය ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පුස්තකාලය සහ විශ්වවිද්‍යාල සංස්කෘතික කෞතුකාගාරය ඇතුළත් පුස්තකාල සහ කෞතුකාගාර ජාලයකි. SEUSL පුස්තකාලය උපායමාර්ගිකව ක්‍රියා කරමින් තත්ත්ව සහතිකය සඳහා ජාත්‍යන්තර හොඳම භාවිතයන් වෙත යොමු වෙයි. 2022 වර්ෂයේදී පුස්තකාලයේ ප්‍රධාන ජයග්‍රහණයන් වූයේ:

i) ***ඩිජිටල්කරණ වැඩසටහන*** : - ඩිජිටල්කරණ වැඩසටහන කළමනාකරණය කිරීම සහ SEUSL හි බුද්ධිමය ප්‍රාග්ධනය ආයතනික ගබඩාවේ (DSpace) සංරක්ෂණය කිරීම, එය විද්වත් බෙදා හැරීම් සඳහා පහසුකම් සපයන සහ ආයතනයේ අධ්‍යයන කටයුතු වල සමස්ත පැතිරීම ප්‍රදර්ශනය කිරීමට සහ විශ්වවිද්‍යාලයේ වෙබ්දර්ශක ශ්‍රේණිගත කිරීම් වැඩි දියුණු කරයි

ii) ***සහයෝගීතාව ශක්තිමත් කිරීම:*** බොහෝ පර්යේෂණ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්, රචනා උපුටා දැක්වීම් අනාවරණ සේවාව, සාහිත්‍ය විමර්ෂණය සහ ලේඛන බෙදාහැරීමේ සේවා පැවැත්වීම මගින් පීඨ සහ සිසුන් සමඟ සම්බන්ධ වීම ශක්තිමත් කිරීම සහ පර්යේෂණ සඳහා පුස්තකාල විද්වතුන්ගේ වැඩි දායකත්වයක් ප්‍රවර්ධනය කිරීම.

iii) ***සමාජ ව්‍යාප්ති වැඩසටහන් :***

- එළිදැක්වීම් - අග්නිදිග ප්‍රාදේශීය පුස්තකාලය සහ තොරතුරු ජාලය (SERLIN), ශ්‍රී ලංකාව.

- SERLIN පුස්තකාල ජාලය", 2022 ඔක්තෝම්බර් 25 වැනි දින පැවති නිර්මාතෘ දිනයේදී SERLIN හි සාමාජික ආයතනයේ සහභාගීත්වය සමඟ ප්‍රජා සත්කාරක මුලපිරීම් වලින් එකක් ලෙස උපකුලපතිවරයා විසින් නිල වශයෙන් දියත් කරන ලදී. අග්නිදිග විශ්වවිද්‍යාල පුස්තකාල විසින් කියවීම ප්‍රවර්ධනය කිරීම සඳහා SERLIN සාමාජික පුස්තකාලවලට ඔවුන්ගේ එකතූන් වැඩිදියුණු කිරීමට සහාය වීම සඳහා පොත් පරිත්‍යාග වැඩසටහනක් ද දියත් කර ඇත.
- YM Trust ඔස්ට්‍රේලියා සමඟ සහයෝගයෙන් පුස්තකාලයාධිපතිවරයෙකු විසින් ආරම්භ කරන ලද වැඩසටහනක් හරහා අග්නිදිග කලාපයේ SERLIN සාමාජික පුස්තකාලවලට පොත් 2399 ක් ලැබිණි.

- පොතුවිල් ප්‍රාදේශීය සභාව සහ නද්වතුල් උලමා අරාබි විද්‍යාලය වැනි පුස්තකාලවල කාර්ය මණ්ඩල වලට පුස්තකාල චාරිකා සඳහා සහාය වීම වැනි බොහෝ ප්‍රචාරක වැඩසටහන් පුස්තකාලයාධිපති විසින් සිදු කරන ලදී.

iv) RDHS සමඟ සහයෝගයෙන් සිදු කල ප්‍රජා වැඩසටහන:

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය, කල්මුණේ RDHS සමඟ සහයෝගීව, උපකුලපති මහාචාර්ය ඒ. රමීස් සහ කල්මුණේ RDHS හි අධ්‍යක්ෂ වෛද්‍ය රිෆාස් අතර මෑතකාලීන ගිවිසුමක් මත පදනම්ව, සෞඛ්‍ය කථිකාවන් සහ සාකච්ඡා මාලාවක් හරහා මහජන සෞඛ්‍යය පිළිබඳව උපාධි අපේක්ෂකයින්, කාර්ය මණ්ඩලය සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා නව වැඩසටහනක් සකස් කර ඇත.

- "යහපත් සෞඛ්‍ය" දේශන මාලාවේ පළමු දේශනය, "ආතති රහිත අනාගතය" යන මැයෙන්, කල්මුණේ RDHS හි ප්‍රාදේශීය මානසික සෞඛ්‍ය ඒකකයට අනුයුක්ත වෛද්‍ය එම්.ජේ. නවුෆල් විසින් සමාරම්භක වැඩසටහනෙන් පසුව 2022 මාර්තු 16 වැනි දින ශ්‍රී.ල.අ.වි පුස්තකාල සම්මන්ත්‍රණ ශාලාවේදී දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලදී.

v) ***ආයතනික ගබඩා වැඩිදියුණු කිරීම:*** ඩිජිටල්කරණ වැඩසටහන කළමනාකරණය කිරීම සහ විද්වත් බෙදා හැරීමට පහසුකම් සපයන ආයතනික සුරක්ෂිතාගාරයෙහි **(DSpace)** ශ්‍රී.ල.අ.වි හි බුද්ධිමය ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීම, ආයතනයේ

අධ්‍යයන කටයුතු වල සමස්ත පැතිරීම ප්‍රදර්ශනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ වෙබ්දර්ශක ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම. අපගේ විද්‍යුත් ගබඩාවේ **2021** දෙසැම්බර් **31** වන විට විද්වත් ලිපි 5733ක් සංරක්ෂණය කර තිබූ අතර ඉන් 826ක් 2022 වර්ෂය තුළ උඩුගත කරන ලදී. විදේශ රටවල නරඹන්නන් ඇතුළු විද්වත් ලිපි සඳහා නැරඹුම් 67,123 ක් ලැබී ඇත.

vi) ***උපදේශනාත්මක සේවා:*** පීඨ සභා, වාර්තාවන් සහ විශ්වවිද්‍යාල ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයට විශේෂඥ උපදෙස් සහ සංස්කරණ සහාය ලබා දී ඇත.

vii) *ඉගෙනුම් සහ ඇගයීම්:*

a. අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාලවල සියලුම විද්වතුන්, උපාධි අපේක්ෂකයින් වෙත "තොරතුරු සාක්ෂරතා වැඩසටහන්" පිළිබඳ දේශන පැවැත්වීමට සහ වෛකල්පිත සම්මාන පාඨමාලා ඇගයීමට සහභාගී විය.

b. AEE 31012-පර්යේෂණ ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පෛව පද්ධති තාක්ෂණ උපාධියේ 3 වන වසරේ සිසුන්ට දේශන පවත්වන ලදී.

c. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන "පුස්තකාල හා තොරතුරු සේවා පිළිබඳ ඩිප්ලෝමාව" සඳහා දේශන පැවැත්වීම.

viii) ***විශ්වවිද්‍යාලයෙන් පිටත පුස්තකාල සේවා:*** අපගේ පුස්තකාලයේ ඉගෙනුම් සම්පත්වලට දුරස්ථව ප්‍රවේශ වීමට අපගේ අනුග්‍රාහකයන්ට හැකිවන පරිදි පුස්තකාල සේවා මණ්ඩපයෙන් පිටත බෙදා හැරීම සඳහා සිසුන් ඇතුළු ප්‍රධාන විශ්වවිද්‍යාල පාර්ශවකරුවන් සමඟ සාමූහිකව සහ නිර්මාණාත්මකව කටයුතු කරන ලදී.

ix) ***නව අත්පත්කර ගැනීම්:*** සියළු පීඨයන්හි අවශ්‍යතා සඳහා 2022 වසර තුලදී පුස්තකාලය විසින් රු. 3,123,983.66 වටිනාකමින් යුත් මුද්‍රිත පොත් 335 ක් සහ විද්‍යුත් පොත් 75 ක් පමණක් මිලදී ගෙන ඇත.

x) ***පොත් සහ වාර සඟරා පරිත්‍යාග:*** **ශ්‍රී**.ල.අ.වි පුස්තකාල වෙත 2022 වර්ෂයේදී ත්‍යාග සහ පරිත්‍යාග වශයෙන් රුපියල් 365,263.90ක වටිනාකමින් යුත් පොත් 835ක් සහ වාර ප්‍රකාශන 71ක් ලැබී ඇත.

xi) ***අනුග්‍රාහකයින් සහ නව බඳවා ගැනීම්:*** 2022 දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි පරිශීලකයින් 4,338 ක් වාර්තා වී ඇති අතර ඔවුන් අතරින් සමාලෝචිත වර්ෂය තුළ නවක සිසුන් 2,114 ක් පුස්තකාල සාමාජිකයින් ලෙස බඳවා ගන්නා ලදී.

i) ***පුස්තකාල සාමාජිකයින්ගේ සංසරණය***: මේ සඳහා කොවිඩ් වසංගත තත්ත්වය සැලකිය යුතු ලෙස බලපාන ලදී. පුස්තකාල කළමනාකරණ පද්ධතියේ වාර්තා වී ඇති පරිදි පිරික්සුම් ඇතුලත්වීම් 14,809 ක් සහ පිරික්සුම් පිටවීම් 14,056ක් (මුළු පිරික්සුම් ඇතුලත්වීම්/ පිරික්සුම් පිටවීම් 28,865 ක්) තිබුණි.

xii) *දඩ:* 2022 වර්ෂය තුළ ප්‍රධාන පුස්තකාලයේ සිසුන්ගෙන් රුපියල් 25,035.00 ක් සහ විද්‍යා පුස්තකාලයෙන් රුපියල් 1,145.00 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගන්නා ලදී.

xiii) ***මාර්ගගත සමානතා අනාවරණ මෙවලම (Online Similarity Detection Tool)****:* විශ්වවිද්‍යාල පුස්තකාලය විසින් 2022 වසර සඳහා ඔවුන්ගේ පර්යේෂණවල අධ්‍යයන අඛණ්ඩතාව ප්‍රදර්ශනය කිරීමට පීඨවලට උපකාර කිරීම සඳහා සබැඳි සමානතා හඳුනාගැනීමේ මෙවලමක් වන "***Turnitin© Feedback Studio***" වෙත ග්‍රාහකත්වය අලුත් කර ඇත. 2022 වසර පුරාම ***Turnitin*** භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

1.9 ජයග්‍රහණ සහ පිළිගැනීම්:


- "ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව" නව උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමේ යෝජනාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන පැවැත්වීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

- බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානයේ වැඩසටහන් සමාලෝචනය (ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන) සඳහා ස්වයං ඇගයීම් වාර්තාව (SER) ඉදිරිපත් කරන ලදී.

- 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නව ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර අධ්‍යයන වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.


- ජාතික ප්‍රතිපත්තියට සමගාමීව උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි කිරීම මගින් විශ්වවිද්‍යාලයට නව සිසුන් බඳවා ගැනීම පුළුල් කළ හැකි විය. (රූපය 1.4).



රූපසටහන1.4: පීඨ මගින් පසුගිය වසර විසි හයේ වාර්ෂික සිසුන් බඳවා ගැනීම

- දෙමළ/ භූගෝල විද්‍යාව/ දර්ශනය/ දේශපාලන විද්‍යාව/ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රවල MPhil/PhD පර්යේෂණ වැඩසටහන් ආරම්භ කරන ලදී.

- නේවාසිකාගාර පහසුකම් සැලකිය යුතු ලෙස සංවර්ධනය කර ඇති අතර සුදුසුකම් ඇති සියලුම සිසුන්ට නවාතැන් සපයා ඇත.



රූපසටහන 1.5: නේවාසිකාගාරයන්හි පදිංචිය: 2015 - 2022

- ජාත්‍යන්තර සහ දේශීය පර්යේෂණ සම්මන්ත්‍රණ හයක් පැවැත්වීමට විශ්වවිද්‍යාලයට හැකිවිය.

- 2022 වර්ෂය තුළ සමස්තයක් වශයෙන් විශ්වවිද්‍යාලයට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සුචිගත කරන ලද සහ නිර්දේශිත සඟරා වල පර්යේෂණ පත්‍රිකා 111 ක් ප්‍රකාශයට පත් කළ හැකි විය.

- 2022 වර්ෂය තුල ප්‍රකාශයට පත්කරන ලද සමස්ත ප්‍රකාශන ගණන 300කි.

- උසස් තත්ත්වයේ පර්යේෂණ කරගෙනයාමට කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීමට සහ උසස් තත්ත්වයේ සඟරාවල ප්‍රකාශයට පත් කිරීම තුලින් ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් “උසස් බලපෑම් සහිත ප්‍රකාශන සඳහා සනාතන සභා ගෞරව” නමින් සම්මානයක් 2019 දී හඳුන්වා දෙන ලදී. 2022 දී ප්‍රදානය කරන ලද සනාතන සභා ගෞරව සම්මාන පිළිබඳ විස්තර 1.9වගුවේ දක්වා ඇත. 1.10 සහ 1.11 වගුව මගින් විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා නිකුතු සහ 2022 වර්ෂය තුළ සිදු කරන ලද වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර පෙන්වයි.

වගුව **1.9: 2020** වර්ෂය සඳහා සනාථන සභා ගෞරව සම්මාන

පීඨය	2022 වර්ෂයේ ඉහළ බලපෑමක් සහිත ප්‍රකාශන සඳහා සනාතන සභා ගෞරව සම්මාන ලාභීන් සංඛ්‍යාව			
	218 වන සනාතන සභාව (16.06.2022)	220 වන සනාතන සභාව (16.03.2022)	221වන සනාතන සභාව (17.08.2022)	223 වන සනාතන සභාව (19.08.2022)
කලා හා සංස්කෘතික	-	3	1	1
කළ.හා වාණිජ	10	1	-	-
ව්‍යාව.විද්‍යා	2	1	-	4
ඉස්ලාම් අධ්‍ය.හා අරාබි	4	1	1	5
ඉංජිනේරු	2	-	2	-
තාක්ෂණ	14	15	2	3
පුස්තකාලය	-	1	-	-
එකතුව	32	22	6	13

වගුව **1.10: 2022** දී විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත්කරන ලද සඟරා නිකුතු

පීඨය	සඟරා නිකුතු
කලා හා සංස්කෘතික	KALAM සඟරාව -වෙළුම XV, නිකුතු (01 සහ 02), 2022 මාර්ගගතව ප්‍රකාශයට පත් කරන ලදී.
	KALAM සඟරාව -වෙළුම XIV, නිකුතු (01 සහ 02), 2021 මාර්ගගතව ප්‍රකාශයට පත් කරන ලදී.
	KALAM සඟරාව -වෙළුම XI, නිකුතු (01 සහ 02), 2017 ප්‍රකාශයට පත් කරන ලදී.
	KALAM සඟරාව -වෙළුම XII, නිකුතු (01 සහ 02), 2021 මාර්ගගතව ප්‍රකාශයට පත් කරන ලදී.
කළ.හා වාණිජ	අලෙවි කළමනාකරණය පිළිබඳ සඟරාව වෙළුම VII, Issue I and II
	ව්‍යාපාර ආර්ථික විද්‍යා සඟරාව වෙළුම 4 නිකුතුව II
	ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ සඟරාව වෙළුම I නිකුතුව I
	කළමනාකරණ හා ආර්ථික විද්‍යා සඟරාව වෙළුම I නිකුතුව I
	උපාධි නිබන්ධනවල සාරාංශ සම්පාදනය, කළමනාකරණ අධ්‍යයනාංශය – 2022 (BBA, HRM & IS) CAUDDM-2022 වෙළුම II
ව්‍යවහාරික විද්‍යා	විද්‍යා සඟරාව වෙළුම: 03අංක: 01
තාක්ෂණ	SLJoT – අඛණ්ඩ නිකුතු – 02 (ජුනි/ දෙසැම්බර්)
	විශේෂ නිකුතු – 01 (ඔක්තෝබර්)
ඉස්ලාම් අධ්‍ය. හා අරාබි භාෂා	අරාබි සහ ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව වෙළුම 5, නිකුතුව. 1; 2022
	අරාබි සහ ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව වෙළුම. 5, නිකුතුව. 2; 2022
	අරාබි සහ ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව වෙළුම 5, (විශේෂ නිකුතුව I); 2022

වාර්ෂික පර්යේෂණ සම්මේලනයන් අඛණ්ඩව පවත්වන ලදී.

වගුව 1.11: විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද වාර්ෂික පර්යේෂණ සම්මේලන සහ සම්මන්ත්‍රණ

2022 දී පවත්වන ලද සම්මන්ත්‍රණය/සම්මේලනය	පවත්වන ලද්දේ :
10 වන අග්නිදිග විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කලා පර්යේෂණ සැසිය (SEUARS 2021)	FAC
11 වන අග්නිදිග විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කලා පර්යේෂණ සැසිය (SEUARS 2022)	
වාර්ෂික විද්‍යා පර්යේෂණ සැසිය - 2022	FAS
9 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	FIA
10 වන උපාධි අපේක්ෂක පර්යේෂණ කථිකාවත	
2 වැනි විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව **(ICST)**	FT

සිසු ජයග්‍රහණ

- විශ්වවිද්‍යාල මට්ටමේ කථික තරගයට කලා හා සංස්කෘතික පීඨයේ දෙවන වසරේ ඉගෙනුම ලබන ආර්.එම්.තන්සිම් සහභාගී වී තෙවැනි ස්ථානය ලබා ගැනීම.

- කලා හා සංස්කෘතික පීඨයේ පළමු වසරේ සිසුවියක වන එම්.අයි.ෆාතිමා රිස්කියා, මද්‍රාස් විශ්වවිද්‍යාලයේ "ඉන්දියාවේ ජල සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (Cwrm) විසින් සංවිධානය කරන ලද "ගංවතුර කළමනාකරණය සහ ගංවතුර පාලන පියවර පිළිබඳ ජාතික වැඩමුළුව" යන මැයෙන් වැඩමුළුවකට සහභාගී විය.

- කලා හා සංස්කෘතික පීඨයේ සිසුවෙකු වන ආර්.එම්.තන්සිම් සිසුවා *කරෙයිතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති ප්‍රාදේශීය සාහිත්‍ය තරගයට සහභාගී වී විවෘත මට්ටමේ කෙටිකතා තරගයෙන් 3 වැනි ස්ථානය දිනා ගැනීමට සමත් විය.*

- කලා හා සංස්කෘතික පීඨයේ 2 වන වසරේ ඉගෙනුම ලබන ෆෘතිමා මදීරා, "காய்ந்த சருகுகள் " නමින් පොතක් ප්‍රකාශයට පත් කරන ලද අතර ඉන්දියාවේ "Ahara Muthala Peravai" ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

- ස්වාධීන මාධ්‍ය සංගමය සහ "තිනමති" තලම් ප්‍රවෘත්ති මාධ්‍ය වැනි මාධ්‍යවේදීන්ගේ පුහුණුවීම් සඳහා රස්නි රහ්මතුල්ලා සහභාගී විය.

මාධ්‍යවේදියෙකු සහ අඩ්ඩාලවේනයි සම්බන්ධීකාරක ලෙස ඔහු තෝරාගෙන ඇත.

- පානදුරේ ෂෆියා නතීම් කලා හා සංස්කෘතික පීඨයේ අවසන් වසරේ සිසුවියකි. ඇය 2022 ජනවාරි මාසයේදී විවෘත වීදි සිතියම (OSM) සමූහයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දායකයා වූ අතර, ආසියා - පැසිෆික් කලාපයේ OSM ප්‍රජාව විසින් පවත්වනු ලබන SLSI (SHE LEADS SHE INSPIRES) නායකත්ව වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී. ඇය ජනවාරි මාසයේ සිට සෑම මසකම සිතියම්කරණ තරඟයට සහභාගී වූ අතර මාර්තු මාසයේ හොඳම සිතියම්කරුවෙකු ලෙස තෝරාගෙන ආසියා පැසිෆික් කලාපයේ 6 වන ස්ථානය ලබා ගත්තාය.

කාර්ය මණ්ඩල ජයග්‍රහණ

- 2022 රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවයේදී, කලා හා සංස්කෘතික පීඨයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවට අනුබද්ධ ඉතිහාසය පිළිබඳ කථිකාචාර්ය (පරිවාස) එච්.එෆ්.ෆර්දව්සියා මිය ‘‘හොඳම පරිවර්තන අධ්‍යයන හා පර්යේෂණ කාර්යය’’ සඳහා සම්මානයට පාත්‍ර විය. “இளம் பிறையும் இடைத்தராசும்” இலங்கை – அராபிய தொடப்புகள் பற்றிய ஆய்வு நூல் வூ சிංහල භාෂාවේ සිට දෙමළ භාෂාවට පරිවර්තනය වූ ඇයගේ පොත සඳහා එම සම්මානය පිරිනමන ලදී. (“Ilam Piraiym Idaitharasum: A Study of Sri Lankan-Arabian Relations”)

- භාෂා අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්.ඒ.එම්.රමීස් විසින් යාපනය විශ්වවිද්‍යාලයේදී ‘ලීලාවතී රාමනාදන් ආර්යාව අනුස්මරණ දේශනය - 2022’ පවත්වන ලදී.

- දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය /කලා හා සංස්කෘතික පීඨය විසින් ඉදිරිපත් කරන ලද දේශපාලන විද්‍යාවේ ශ්‍රී ලංකා සඟරාව පිළිබඳ වූ දෙපාර්තමේන්තු සඟරාවක් සනාථන සභාවේ අනුමැතිය ඇතිව ආරම්භ කරන ලදී.

- ප්‍රජා වැඩසටහන්, සීමාවාසික පුහුණුව, පීඨ මට්ටමේ ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානත්වය පිළිබඳ ක්‍රියාකාරකම් සහ කලා හා සංස්කෘතික පීඨයේ සියලුම ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශිෂ්‍ය ක්‍රියාකාරකම් සමාජය ස්ථාපිත කරන ලදී.

- බාහිර උපාධි හා වෘත්තීය ඉගෙනුම් මධ්‍යස්ථානයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන සඳහා වන ස්වයං ඇගයීම් වාර්තාව (SER) බාහිර උපාධි වැඩසටහන් සහ ව්‍යාප්ති පාඨමාලා වල තත්ත්ව සහතික කිරීම සඳහා වන අත්පොතෙහි දක්වා ඇති උපදෙස් අනුව සමාලෝචන ක්‍රියාවලිය සඳහා සකස් කරන ලද අතර, SER සහ අදාළ උපකාරක ලියකියවිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලයේ මාර්ගගත වේදිකාවට උඩුගත කරන ලදී.

- කලා (බාහිර) උපාධි වැඩසටහන පෝෂණය කරමින් පාඨමාලා අත්පොත් සහ වැඩසටහනේ විෂයමාලා සකස් කරන ලදී.

- කලා හා සංස්කෘතික පීඨයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයන් සහ TESL උපාධි වැඩසටහන සඳහා පවතින විෂයමාලා සංශෝධනය කරන ලදී.

- ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම (SCL) පෝෂණය කිරීම සඳහා සියලුම දේශන ශාලා තුළ ස්ථාවර නවීන තාක්ෂණයන් සහ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම.

- කලා හා සංස්කෘතික පීඨයේ දේශපාලන විද්‍යා, භාෂා, සමාජ විද්‍යා යන අධ්‍යයනාංශ වල පුස්තකාලය ශිෂ්‍ය ක්‍රියාකාරකම් සමාජයේ ස්ථාපිත කරන ලදී.

- කලා හා සංස්කෘතික පීඨයේ පුස්තකාලය, රැස්වීම් කාමරය, ස්මාර්ට් පන්ති කාමර 03, විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය සහ ගබඩා පිහිටුවීම සඳහා පරිගණක ඒකක ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් වෙනස් කිරීම.

- ඉගැන්වීම් සහ ඉගෙනුම් අරමුණු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිතය සාපේක්ෂ වශයෙන් ඉහළ ගොස් ඇති අතර ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම්වල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දියුණුව පවත්වාගෙන යාමට මුල පිරීම් සිදුවෙමින් පවතී.

- 2022 දෙසැම්බර් අවසානය වන විට, අධ්‍යයන කාර්ය මණ්ඩලය 82 (38%) (පුස්තකාල අධ්‍යයන කාර්ය මණ්ඩලය හැර) ඔවුන්ගේ ආචාර්ය උපාධි සම්පූර්ණ කර ඇත.

- 2022 දෙසැම්බර් අග වන විට මහාචාර්ය තනතුරට උසස් කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව 29 කි.

1.10 අසාර්ථකවීම් සහ ඊට හේතු

i. මුහුදු බෑදනය විශ්වවිද්‍යාලයේ නැගෙනහිර කොටසේ දිගටම පවතී. වර්තමාන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයත් සමඟ විශ්වවිද්‍යාලයට මෙම ගැටළුව වළක්වා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් මේ පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇති අතර, ගැටලුව වැළැක්වී සඳහා පියවර ගන්නා බවට ඔවුන් පොරොන්දු වී තිබේ.

ii. ගල් ඔය පිටාර ගැලීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වැසි සමයේදී ගංවතුර තර්ජනයට මුහුණ දෙමින් සිටී. මේ පිළිබඳව අවස්ථා කීපයකදී විශ්වවිද්‍යාලය විසින් අදාල බලධාරීන්ගේ අවධානයට යොමුකලද, ගංවතුර ආරක්ෂණ බැම්ම ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය.

iii. උපාධි අපේක්ෂක හෝ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීම. මෙයට හේතුව ශ්‍රී ලංකාවේ අගනුවර කොළඹ සිට කිලෝමීටර 360 කට ආසන්න දුරකින් විශ්වවිද්‍යාලය පිහිටා තිබීමයි. අභ්‍යන්තර ප්‍රවාහනය මෙහි ඇතුළත් වීමට කැමති සිසුන්ගේ අපේක්ෂාවන් සපුරාලන්නේ නැත. මෙයට හේතුව කොළඹ සිට ශ්‍රී.ල.අ.වි වෙත බස් රථයෙන් හෝ දුම්රියෙන් යාමට පැය 9 කට ආසන්න කාලයක් ගත වේ. අභ්‍යන්තර ගුවන් ගමන් තවදුරටත් ක්‍රියාත්මක නොවේ.

iv. රට තුළ සහ විදේශයන්හි සිටින බාහිර කථිකාචාර්යවරුන් සහ විද්වතුන් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීම. iii හි පෙන්වා දී ඇති තත්ත්වයම මෙයට හේතු විය හැක.

v. බඳවාගැනීම්:

පහත දැක්වෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය,

- සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා ස්ථිර වෛද්‍ය නිළධාරීන් – සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වැඩි වැටුපකට වඩා හොඳ අවස්ථාවන් ඇති බැවින් වෛද්‍යවරුන් විශ්වවිද්‍යාල සේවයට බැඳීමට අයදුම් නොකරයි. කෙසේ වෙතත්, අර්ධ කාලීන පදනමින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් සමඟ සෞඛ්‍ය මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

- ව්‍යාපෘති කළමනාකරු - අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ඉංජිනේරුවන් අඩු වැටුපකට විශ්වවිද්‍යාලයට සේවය කිරීමට අකැමැති බැවිනි.

1.11 අනාගත සැලසුම්

- විෂයමාලා සමාලෝචනය සඳහා ස්ථාවර සහ විස්තීර්ණ ප්‍රතිපත්තියක් මගින් දැනුම් දෙන ලද අධ්‍යයන වැඩසටහන් වල විෂයමාලා සංශෝධන සිදු කිරීම.

- රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව උපාධි වැඩසටහන් රැසක් පිරිනැමීමට ශ්‍රී.ල.අ.වි. පියවර ගෙන ඇත. 1.10 වගුව මඟින් පීඨ මගින් ආරම්භ කිරීමට නියමිත නව උපාධි පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා වල වර්තමාන තත්ත්වය පෙන්වයි.

වගුව 1.12: ආරම්භ කිරීමට නියමිත නව අධ්‍යයන වැඩසටහන්

පීඨය	උපාධි අපේක්ෂක / පශ්චාත් උපාධි/ සහතිකපත්‍ර/ ඩිප්ලෝමා වැඩසටහන්	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ (අදාළ නම්)	කාල සීමාව	මාධ්‍යය	වර්තමාන තත්ත්වය
කලා හා සංස්කෘතික	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව	6	ගෞරව	අවුරුදු 04	දමිළ	UGC අනුමැතිය බලාපොරොත්තු වෙන් සිටී.
	ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය සඳහා ප්‍රධාන විෂයයක් ලෙස "සංචාරක ව්‍යාපාරය" ආරම්භ කිරීම	-	ප්‍රධාන පාඨමාලාව සාමාන්‍යය	අවුරුදු 03	දමිළ/ඉංග්‍රීසි	වැඩ කෙරිගෙන යමින් සිටී.
	තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා	-	ඩිප්ලෝමා	අවුරුදු 01	**ඉංග්‍රීසි**	කොමිෂන් සභා උපදෙස් බලාපොරොත්තු වෙන්
	යෝගා කෙටි පාඨමාලාව	-	කෙටි පාඨමාලා	මාස 03	දමිළ	වැඩ කෙරිගෙන යමින් සිටී.
	පරිගණක යෙදුම් පිළිබඳ සහතික පාඨමාලාව	-	සහතික පත්‍ර	-	-	-
	භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති	10	පශ්චාත්	අවුරුදු 02	දමිළ/ඉංග්‍රීසි	-
ඉස්ලාම් අධ්‍ය. හා අරාබි භාෂා	තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමාව	3	-	අවුරුදු 01	ඉංග්‍රීසි	කෙරිගෙන යමින්
	අරාබි භාෂා සහතිකපත්‍රය	2	-	මාස 06	අරාබි	පාඨමාලා පිළිබඳ යෝජනාව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලදී
	අරාබි භාෂා ඩිප්ලෝමාව	3	-	අවුරුදු 01	අරාබි	
ව්‍යවහාරික විද්‍යා	පරිගණක රසායනාගාර තාක්ෂණය පිළිබඳ සහතිකය/ ඩිප්ලෝමාව	3	-		ඉංග්‍රීසි	යෝජනාව ක්‍රියාත්මක කිරීමට
	තොරතුරු හා සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව (DICT)	3	-	අවුරුදු 01		සනාථන සභාව විසින් යෝජනාව **CDC/** සනාථන සභාව වෙත යොමු කරන ලදී
	විද්‍යාවේදී උපාධිය (BSc) (ගෞරව) බහුවිධ ක්ෂේත්‍ර	6	ගෞරව	අවුරුදු 04		යෝජනාව ආරම්භ කිරීමට

	විද්‍යාවේදී උපාධිය (BSc.) (බාහිර උපාධිය): (FAS හි පවතින උපාධි බාහිර පිරිනැමීම)	5	සාමාන්‍යය	අවුරුදු 04		යෝජනාව ක්‍රියාත්මක කිරීමට
	ව්‍යවහාරික සහ පාරිසරික භූ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය	6	ගෞරව	අවුරුදු 04		පාඨමාලා පිළිබඳ යෝජනාව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලදී
	විශ්ලේෂණ / ඖෂධ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc.).	5	ගෞරව	අවුරුදු 04		යෝජනාව ක්‍රියාත්මක කිරීමට
	ශ්‍ර.ල.අ.වි.හි යුනානි වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය (BUMS).	6	ගෞරව	අවුරුදු 04		ප්‍රගතියේ තාර්කික සහ ශක්‍යතා අධ්‍යයනය විශ්ලේෂණය කිරීම
	පාරිසරික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති	10	-	අවුරුදු 02	ඉංග්‍රීසි	අන්තර්ගත සංවර්ධනය සහ පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ සමීක්ෂණය සිදු කරමින් පවතී
තාක්ෂණ	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය (බාහිර)	5	සාමාන්‍යය	අවුරුදු 03	ඉංග්‍රීසි	UGC හි සමාලෝචනය යටතේ පවතින අතර 2022 දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති	10	-	අවුරුදු 02		යෝජනාව සංවර්ධනය කිරීම සහ 2023 දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- භූගෝල විද්‍යා අංශය (කලා හා සංස්කෘතික පීඨය) සඳහා වෙනම ගොඩනැඟිල්ලක් ඉල්ලා සිටි අතර යෝජනාවක් ක්‍රියාත්මක විය.

- අධ්‍යයන වැඩසටහන් (කලා හා සංස්කෘතික පීඨය) පිළිබඳ පුළුල් පීඨ සමාලෝචනයක් පැවැත්වීම.

- ප්‍රවේශ්‍යතාව, ඉගැන්වීම්-ඉගෙනුම් ද්‍රව්‍ය ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් සහ විවිධ ආබාධ සහිත සිසුන් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම. ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් අවශ්‍ය ප්‍රවේශවීම්, වැසිකිලි සහ අනෙකුත් පහසුකම් ස්ථාපිත කිරීම.

- පීඨ ආපනශාලාව (කලා හා සංස්කෘතික පීඨය) දක්වා ස්ථිර කුස්සියක් ඉදිකිරීම සහ සිසුන්ගේ ආපනශාලා පහසුකම් පුළුල් කිරීම.

කැපීපෙනෙන සිදුවීම්

2023 පෙබරවාරි 07 වන දින පැවති 14 වන උපාධි ප්‍රදානෝත්සවය



කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ වැඩසටහන



රිදී ජුබිලි සමරුව 2022.02.23 දින නිල වශයෙන් එළිදැක්විණි.



කළමනාකරණ සහ වාණිජ පීඨය **(FMC)** විසින් සංවිධානය කරන ලද 10 වැනි වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ සමාරම්භක උත්සවය 2022.08.10 දින පැවැත්විණි.



2022.02.03 දින පැවති කලා හා සංස්කෘතික පීඨයේ 10 වැනි ජාත්‍යන්තර කලා පර්යේෂණ සම්මන්ත්‍රණය



E-Ablaze අවසන් ප්‍රසංගය සහ සහතිකපත් ප්‍රදානය 2022.09.25 දින ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.



2022.11.24 දින පැවැත්වුණු ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා වාණිජ පීඨය විසින් සංවිධානය කරන ලද වාර්ෂික ව්‍යාපාරික ප්‍රදර්ශනය - 2022



අන්තර් විශ්වවිද්‍යාල පාපන්දු ශූරතාවලිය **2022**



- නිත්‍ය සහ සම්මත සමාලෝචනය සඳහා සම්මත මෙහෙයුම් ප්‍රතිපත්ති විධිමත් කිරීම, සියලුම අධ්‍යයන වැඩසටහන් සඳහා විෂයමාලා වැඩිදියුණු කිරීම සහ සමාලෝචනය කිරීම.

- සියලුම අධ්‍යයන වැඩසටහන් සඳහා විෂයමාලා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීම වැඩි දියුණු කිරීම.

- සමාලෝචනයට භාජනය නොකල අධ්‍යයන වැඩසටහන් තත්ත්ව සහතිකකරණ සමාලෝචනයට භාජනය කිරීම.

- අපගේ පර්යේෂකයින්ගේ බලපෑම වැඩිකිරීමට පියවර ගැනීම.

- සමාජය හා කර්මාන්ත විසින් ඉල්ලා සිටින අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගැනීම.

- සම-සංවිධාන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා විස්තීරණ ව්‍යවසාය පර්යේෂණ සැලසුම් හඳුන්වා දීම.

- සහයෝගිතා පර්යේෂණ සඳහා අනෙකුත් ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ නව සම්බන්ධතා සඳහා සුදුසුකම් ලබා ගැනීම.

- විශ්වවිද්‍යාල ප්‍රදාන සහ අනෙකුත් තරඟකාරී ප්‍රදාන ලබා ගැනීමට කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

2. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

2.1. ශිෂ්‍ය ප්‍රජාව සහ ස්ථිර කාර්ය මණ්ඩලය

2021 වසරේ දෙසැම්බර් සහ 2022 වසරේ දෙසැම්බර් අවසානය වන විට ශිෂ්‍ය ප්‍රජාව හා සියළු කාණ්ඩ වල නිත්‍ය සේවකයින් පිළිබඳ විස්තර පහත 2.1 වගුව මගින් විස්තර කෙරේ.

වගුව **2.1: 2.1.** ශිෂ්‍ය ප්‍රජාව සහ ස්ථිර කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය/දෙපාර්තමේන්තුව/අංශය/ඒකකය	මුළු සිසුන් ගණන		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය		පරිපාලන හා වෙනත් විධායක කාර්ය මණ්ඩලය		අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	
	2021	2022	2021	2022	2021	2022	2021	2022	2021	2022
කලා හා සංස්කෘතික පීඨය	1258	1299	47	54	09	09	01	01	416	400
ව්‍යවහාරික විද්‍යා පීඨය	742	1024	36	41	02	02	01	01		
කළමනාකරණ හා වාණිජ පීඨය	1401	1868	33	38	02	02	01	01		
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	1308	1746	24	28	01	01	01	01		
ඉංජිනේරු පීඨය	479	400	29	32			02	02		
තාක්ෂණ පීඨය	655	848	25	25			01	01		
පුස්තකාලය			05	5	01	01	01	01		
පොදු පරිපාලනය							21	19		
බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය							01	01		
ශාරීරික අධ්‍යාපන ඒකකය					03	04				
තොරතුරු හා සංඛ්‍යාන ඒකකය					01	01				
වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය					01	02				
ජාල මෙහෙයුම් ඒකකය					01	01				
අනෙකුත් දෙපාර්තමේන්තු										
එකතුව	5843	7185	199	223	21	23	30	28	416	400

2.2 දේශීය සිසුන් පිළිබඳ විස්තර

වගුව **2.2:** අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් වල දේශීය සිසුන් (නවක සිසුන්)

පීඨය	අධ්‍යයන වැඩසටහන	බඳවාගැනී මේ වර්ෂය	එකතුවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය	බඳවාගැනී මේ වර්ෂය	එකතුවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය
		2021 දෙසැම්බර් 31 දිනට				2022 දෙසැම්බර් 31 දිනට			
කලා හා සංස්කෘතික පීඨය	කලා	2019/2020	421	384	380	2020/2021	406	387	385
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	2019/2020	188	183	183	2020/2021	178	178	175
	වාණිජ		152	149	142		152	134	124
	කළ.තොා.තා		170	159	159		170	169	166
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යා	2019/2020	223	146	136	2020/2021	218	161	130
	ජීව විද්‍යා		212	161	136		207	176	149
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	අරාබි භාෂා	2019/2020	225	206	199	2020/2021	225	226	216
	ඉස්ලාම් අධ්‍යයන		278	268	263		278	303	272
ඉංජිනේරු පීඨය	ඉංජිනේරු	2019/2020	145	130	130	2020/2021	130	106	106
තාක්ෂණ පීඨය	ජෛව පද්ධති තාක්ෂණය	2019/2020	109	105	105	2020/2021	109	108	107
	තොර. හා සන්නි. තාක්ෂණය		100	96	96		100	89	88
Total			**2223**	**1987**	**1929**		**2173**	**2037**	**1918**

* **2017/2018** අධ්‍යයන වර්ෂය කල් දමන ලද සිසුන් **06** ක් **2018/2019** දී සම්බන්ධ විය.

2.3 වගුව: අභ්‍යන්තර මූලික උපාධි පාඨමාලා සඳහා දේශීය සිසුන් ඇතුලත් කර ගැනීම. (මුළු සිසුන් ගණන)

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
			2021 දෙසැම්බර් 31 දිනට				2022 දෙසැම්බර් 31 දිනට			
කලා හා සංස්කෘතික පීඨය	කලා	1 වන වසර	2019/2020	37	343	380	2020/2021	44	341	385
	කලා	2 වන වසර	2018/2019	48	313	361	2019/2020	37	343	380
	කලා	3 වන වසර	2017/2018	33	321	354	2018/2019	48	313	361
	කලා (විශේෂ)	4 වන වසර	2016/2017	13	150	163	2017/2018	20	153	173
			උප එකතුව	**131**	**1,127**	**1,258**	**උප එකතුව**	**149**	**1150**	**1299**
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	1 වන වසර	2019/2020	66	117	183	2020/2021	59	116	175
	වාණිජ			50	92	142		32	92	124
	ක.තොා.නා (MIT)			28	131	159		31	135	166
	කළමනාකරණ	1 වන වසර					2019/2020	66	116	182
	වාණිජ							50	93	143
	ක.තොා.නා (MIT)							28	131	159
	කළමනාකරණ	2 වන වසර	2018/2019	56	67	123	2018/2019	56	67	123
	වාණිජ			28	79	107		28	79	107
	ක.තොා.නා (MIT)			20	88	108		20	89	109
	කළමනාකරණ	3 වන වසර	2017/2018	39	98	137	2017/2018	39	98	137
	වාණිජ			38	63	101		38	63	101
	ක.තොා.නා (MIT)			19	82	101		19	82	101
	කළමනාකරණ	4 වන වසර	2016/2017	51	76	127	2016/2017	51	77	128
	වාණිජ			38	74	112		38	74	112
			උප එකතුව	**433**	**967**	**1,400**	**උප එකතුව**	**555**	**1312**	**1867**
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව	1 වන වසර	2019/2020	73	63	136	2020/2021	59	71	130
	ජීව විද්‍යාව			30	106	136		22	127	149
	භෞතික විද්‍යාව	1 වන වසර					2019/2020	73	64	137
	ජීව විද්‍යාව							31	107	138
	භෞතික විද්‍යාව	2 වන වසර	2018/2019	44	51	95	2018/2019	44	51	95
	ජීව විද්‍යාව			14	97	111		14	97	111
	භෞතික විද්‍යාව	3 වන වසර	2017/2018	50	51	101	2017/2018	50	51	101
	ජීව විද්‍යාව			21	91	112		21	91	112
	භෞතික විද්‍යාව	4 වන වසර	2016/2017	5	9	14	2016/2017	5	9	14
	ජීව විද්‍යාව			6	31	37		6	31	37
			උප එකතුව	**243**	**499**	**742**	**උප එකතුව**	**325**	**699**	**1024**

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
				2021 දෙසැම්බර් 31 දිනට				2022 දෙසැම්බර් 31 දිනට		
ඉස්ලා අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය	අරාබි භාෂාව	1 වන වසර	2019/2020	64	135	199	2020/2021	72	144	216
	ඉස්ලාම් අධ්‍යයනය			38	225	263		44	228	272
	අරාබි භාෂාව	2 වන වසර	2018/2019	60	119	179	2019/2020	62	135	197
	ඉස්ලාම් අධ්‍යයනය			32	176	208		38	224	262
	අරාබි භාෂාව	3 වන වසර	2017/2018	61	121	182	2018/2019	60	118	178
මූසුෆ්, වයි., සහ ෆජිලා, එෆ්., (2022). Artificial Intelligence and Machine Learning in Education, In *Digital Transformation for the University of the Future, 2022, pp 121-141 from World Scientific Publishing Co. Pte. Ltd.*

කුමාර, ඒ.ඩී.එන්.ටී, සහ මුබාරක්, ඒ.එන්.එම්., (2022). Advances, Prospects and Limitations of Genetic Tools for Pest Management Strategies in Sri Lanka. *In Genetic Methods and Tools for Managing Crop Pests (pp. 285-302). Singapore: Springer Nature Singapore.*

මරික්කාර්, එන්., සහ මුස්තාෆා, එම්.එම්., (2022). The potential of coconut by-products to foster food security and sustainability in Sri Lanka. *In The Food Security, Biodiversity, and Climate Nexus (pp. 251-266). Cham: Springer International Publishing.*

නාසීම්, එම්.එම්.එම්., සුසීර්තා, වී., මුස්තාෆා, එම්.එම්., බෙයිග්, එම්.බී., සහ ස්ට්‍රැකඩයින්, ජී.එස්., (2022). "Managing Climate Change Impacts on Food Production and Security in Sri Lanka": *The Importance of Climate-Smart Agriculture. Food Security and Climate-Smart Food Systems (pp. 99-115). Springer, Cham.*

නර්මිපන්, ඒ., අස්මාත්, ඒ.එම්.එම්., සහ පුවනිතා, එන්., (2022). Impact Assessment and Adaptation Options for Climatic Change in Paddy Cultivation: A Case Study in Ampara District, Sri Lanka. *In Extreme Natural Events: Sustainable Solutions for Developing Countries (pp. 415-430). Singapore: Springer Nature Singapore.*

හලීම්, එස්.එල්.ඒ., (2022). "A Secured Node Authentication and Access Control Model for IoT Smart Home Using Double-Hashed Unique Labeled Key-Based Validation". *Cognitive Computing Models in Communication Systems*, 199.

පුස්තකාලය

දර්ශකගත නොවූ සඟරා වල ප්‍රකාශිත පත්‍රිකා

මශ්රූෆා, එම්.එම්., 2022. Contribution of academic libraries towards sustainable development goals. *Annals of Library and Information Studies 69 (1), 51-58*

සම්මන්ත්‍රණ වාර්තා වල ප්‍රකාශිත පූර්ණ පත්‍රිකා

සාජීර්, එස්.එල්.එම්., (2022), Monitoring Students In/ Out Management Using A Smart System At South Eastern University Of Sri Lanka Main Librar, *67th Annual Conference of Indian Library Association.*

මශ්රූෆා, ඩී.එම්., 2022. Transforming the libraries to adapt global changes through smart library system. *Etakam Research Conference – 2022.*

4.2 2022 වර්ෂය තුලදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයට පැමිණෙන ලද ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය

4.2 වගුව: 2021 වසරේ උපාධි අපේක්ෂක ඉගැන්වීම්/පශ්චාද් උපාධි ඉගැන්වීම්/ පර්යේෂණ/ සම්මන්ත්‍රණය/වැඩමුළුව සඳහා පැමිණි (හෝ අතථ්‍ය ලෙස සහභාගී වූ) ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

පීඨය	වැඩසටහනේ නම	රට	සේවක සංඛ්‍යාව
කලා හා සංස්කෘතික	ආරාධිත දේශන වැඩසටහන/TESL	ලන්ඩන්	01
කළමනාකරණ හා වාණිජ	ප්‍රධාන දේශනය/AIRC 2021	ඉන්දියාව	01
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා	**9** වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය /FIA	මැලේසියාව	01

4.3 2022 වර්ෂය තුල මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර

4.3 වගුව: මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර - 2022

පීඨය/ අංශය	කාණ්ඩය සහ වැඩසටහනේ මාතෘකාව (වැඩමුළු/ පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ/මාධ්‍ය වැඩසටහන්)	සහභාගී වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම
පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම			
පුස්තකාලය	සංවිධායක කමිටුවේ සහ සංස්කාරක මණ්ඩල සාමාජිකයෙකු ලෙස **SLLA** හි **NACLIS** පවත්වන ලදී.	150	දේශීය සහ ජාත්‍යන්තර **LIS** ප්‍රජාව
ප්‍රදර්ශන / මහජන ප්‍රසංග සංවිධානය කිරීම			
පුස්තකාලය	තිරසාර සංවර්ධනය සඳහා අද දවසේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	300	විශ්වවිද්‍යාල ප්‍රජාවන, අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා සංවර්ධන නිලධාරිනියන්
වැඩමුළු/වෙබිනාර්			
පුස්තකාලය	**පර්යේෂණ ඉදිරිපත් කිරීම**	45	SLLA හි සාමාජික
වෙනත්			
පුස්තකාලය	පළමු කතාව: 2022 මාර්තු 16 වැනි දින පැවති ආතතියෙන් තොර අනාගතය. (SEUSL, කල්මුණේ RDHS සමඟ එක්ව සෞඛ්‍ය සාකච්ඡා මාලාවක් හරහා ප්‍රජාවගේ මහජන සෞඛ්‍යය දැනුවත් කිරීම සඳහා වඩා හොඳ සෞඛ්‍ය දේශන මාලාවක් පවත්වන ලදී.)	200	මහජනතාව, SEUSL හි උපාධි අපේක්ෂකයින් සහ කාර්ය මණ්ඩලය
	2022.10.25 දින පැවති අග්නිදිග ප්‍රාදේශීය පුස්තකාලය සහ තොරතුරු ජාලය (SERLIN) (අග්නිදිග ප්‍රාදේශීය පුස්තකාල සහ තොරතුරු ජාලය (SERLIN) පළාත් පාලන, කලාප අධ්‍යාපන කාර්යාලය සහ විද්‍යාලවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රජා සත්කාරක වැඩසටහනක් ලෙස දියත් කරන ලදී)	250	මහජන පුස්තකාලයාධිපතිවරුන්, පාසල් සහ විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්

4.4 ලැබූ සම්මාන

4.4 වගුව: 2022 වර්ෂය තුලදී ලැබූ සම්මාන පිළිබඳ විස්තර

සම්මාන කාණ්ඩය	සම්මානයේ නම	ජාතික/ අන්තර්ජාතික	සම්මානය පිළිබඳ විස්තර	ප්‍රදානය කරන්නාගේ නම සහ රට	ලබන්නාගේ නම/නම්
පර්යේෂණ	NRC කුසලතා සම්මාන	ජාතික	-	ජාතික පර්යේෂණ කවුන්සිලය	ටී.ජසීතරන්, .ඒ.කේ.අයි.දිසානායක, ජී.කේ.ආර්.සේනාධීරී,සී.ඒ.තොටවත්තගේ/ ව්‍යවහාරික විද්‍යා පීඨය
පර්යේෂණ	සනාථන සභා ගෞරව	ජාතික	ඉහළ බලපෑමක් සහිත පර්යේෂණ ප්‍රකාශන සඳහා	ශ්‍රී.ල.අ.වි, ශ්‍රී ලංකාව	ආචාර්ය එම්.අයි.එස්.සෆිනා/ ව්‍යවහාරික විද්‍යා පීඨය
පර්යේෂණ	සනාථන	ජාතික	ඉහළ බලපෑමක් සහිත සහරා	ශ්‍රී.ල.අ.වි, ශ්‍රී ලංකාව	ආචාර්ය මුනීබ් බී.මුස්තාෆා, එම්.බී.එෆ්.ජමීසියා මිය, එස්.එල්.රස්මියා බේගම් මිය, ආචාර්ය එම්.ජී.එම්. තාරික්, ආචාර්ය ඒ.එන්.එම්.මුබාරක්, ආචාර්ය ඒ.ඩී.එන්.ටී. කුමාර / තාක්ෂණ පීඨය
පර්යේෂණ	උපකුලපති සම්මාන	ජාතික	ඉහළ විශිෂ්ඨත්වයක් සහිත ව්‍යාපෘති සඳහා		ආචාර්ය මුනීබ් බී.මුස්තාෆා, ආචාර්ය යූ.එල්.අබ්දුල් මජීඩ්, ආචාර්ය එම්.ජී.එම්.තාරික්, ආචාර්ය ඒ.එන්.එම්.මුබාරක්, ආචාර්ය ඒ.ඩී.එන්.ටී.කුමාර/ තාක්ෂණ පීඨය
ප්‍රජා ව්‍යාපෘති	මලායා විශ්වවිද්‍යාලය	අන්තර්ජාතික	පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ අතථ්‍ය සංචලතා ව්‍යාපෘති ප්‍රදානය	මලායා විශ්වවිද්‍යාලය මැලේසියාව	ආචාර්ය එම්.එම්.ෆාසිල් – ව්‍යාපෘති නායක මහාචාර්ය ඒ. රමීස් - ව්‍යාපෘති අධ්‍යක්ෂක මහාචාර්ය එම්.ඒ.එම්.රමීස් – ව්‍යාපෘති සහායක, එම්.ඒ.එම්. ෆවුසර් මහතා– ව්‍යාපෘති සහායක / කලා හා සංස්කෘතික පීඨය
ශාරීරික අධ්‍යාපන ඒකකය					

	ශූරතාවය	ජාතික	අන්තර් විශ්වවිද්‍යාල පාපන්දු	විශ්වවිද්‍යාල පාපන්දු කණ්ඩායම	එම්.ජේ.රොසාන් අහමඩ්, එස්.අස්කර්, එච්.අන්ෆාල් අහමඩ්, එච්.අන්ෆාල් අහමඩ්, කේ.රිමොන්, එම්.එච්.එම්.මුෆ්‍රි, ටී.මුස්තාක් අහමඩ්, එන්.එම්.අෆ්රාන්, එම්.තනුජාන්, එස්.තුසාන්තන්, එන්.එම්.සහන්, එම්.එන්.එම්.ෆර්හාන්, එම්.ඒ.එම්.අබ්සාර්, එච්.එම්.සමීර් මොහමඩ්, ඒ.ආර්.ඉම්රාන්, ආර්.එම්.රිහාන්, ඒ.තස්නීම් අහමඩ්, එම්.අයි.එම්.අල්ෆාර්, ජේ.එම්.අබ්රාර්, ඒ.එම්.අමාන්, එම්.ජේ.එම්.ජම්සිත්, එන්.එම්.මුස්තාක්, එම්.අයි.එම්.සිෆ්නාස්.
	ශූරතාවය	ජාතික	අන්තර් විශ්වවිද්‍යාල මාර්ග ධාවන	විශ්වවිද්‍යාල මාර්ග ධාවන කණ්ඩායම	එම්.තනුජාන්, ජේ.ඩබ්.සී.බියංකා වීරවර්ධන, ආර්.එම්.බෙසිල් බෙනාර්ට්, අයි.පී.පී.එම්.තරංගා, එච්.බී.එම්.ලංකාතිලක, ජේ.ජී.ඒ.විභූසිත, එස්.ඒ.අයි.සී.පෙරේරා
	2 වන ස්ථානය	ජාතික	අන්තර් විශ්වවිද්‍යාල මලල ක්‍රීඩා	අන්තර් විශ්වවිද්‍යාල මලල ක්‍රීඩා	ජී.ඩබ්.සී. බියංකා වීරවර්ධන
	3 වන ස්ථානය	ජාතික	අන්තර් විශ්වවිද්‍යාල කරාතේ	අන්තර් විශ්වවිද්‍යාල කරාතේ	පී.පී.ජී.ජේ.එම්.සී.අයි.එම්.රාජකරුණා

4.5 වෘත්තීය සංවර්ධනය සඳහා ලැබුණු විදේශ අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව / සම්මාන

4.5 වගුව: 2022 වර්ෂයේදී අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය (සම්මන්ත්‍රණ / වැඩමුළු / කාර්ය මණ්ඩල සංවර්ධන / පුහුණු / කෙටි පාඨමාලා) සඳහා ලැබුණු විදේශීය අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව / සම්මාන පිළිබඳ විස්තර

අනු අංකය	පීඨය/දෙපාර්තමේන්තුව/ අංශය/ඒකකය		තනතුර	වැඩසටහන් වර්ගය	ලද සේවක සංඛ්‍යාව
	පීඨය	දෙපාර්තමේන්තුව		((සම්මන්ත්‍රණ / වැඩමුළු / කාර්ය මණ්ඩල සංවර්ධන / පුහුණු / කෙටි පාඨමාලා ...වෙනත්)	
1	ඉංජිනේරු පීඨය [FE]	යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය	යාන්ත්‍රික ඉංජිනේරුකරණය පිළිබඳ මහාචාර්ය	පුහුණු	06
2			යාන්ත්‍රික ඉංජිනේරුකරණය පිළිබඳ කථිකාචාර්ය(ස්ථිර නොවූ)	පුහුණු	
3				වැඩමුළු	

4		විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය	විදුලි ඉංජිනේරුකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය (01 අයෙකු)	වැඩමුළු	
5				සම්මන්ත්‍රණ	
6		සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය	සිවිල් ඉංජිනේරු පිළිබඳ ආධුනික කථිකාචාර්ය	වැඩමුළු	
7		පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය	පරිගණක ඉංජිනේරුකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	වැඩමුළු	
8		සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය	සිවිල් ඉංජිනේරු පිළිබඳ පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	වැඩමුළු	
9	කලා හා සංස්කෘතික පීඨය	භාෂා අධ්‍යයනාංශය	හින්දු ශිෂ්‍යාචාරය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	සම්මන්ත්‍රණ	01
10	තාක්ෂණ පීඨය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය (කාර්ය මණ්ඩලය 02)	අධි ශිෂ්‍යත්ව	02
11	කළමනාකරණ හා වාණිජ පීඨය	අලෙවි කලමනාකරණ අධ්‍යයනාංශය	අලෙවි කලමනාකරණය පිලිබඳ මහාචාර්ය	සම්මන්ත්‍රණ	02
12		කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය	කළමනාකරණ හා තොරතුරු තාක්ෂණය පිලිබඳ මහාචාර්ය	පුහුණු	

4.6 2022 වසරේ දී විදේශීය උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාගශීලී නියෝජිතායතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර

4.6 වගුව: 2022 වසරේ දී විදේශීය උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාගශීලී නියෝජිතායතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර

විශ්වවිද්‍යාලය/පීඨය	ක්‍රියාකාරකමේ භූමිකාව (ශිෂ්‍ය හුවමාරුව/සේවක හුවමාරුව/ පර්යේෂණ ව්‍යාපෘතිය/පුහුණුව/පහසුකම් .....ආදිය)	රට
ඉන්දියානු අධ්‍යයන පර්යේෂකයින්ගේ	• ප්‍රථම හා පශ්චාත් උපාධි, සහ ආචාර්ය උපාධිය (PhD) සඳහා ඒකාබද්ධ පර්යේෂණ අධීක්ෂණය සිදු කිරීම.	ඉන්දියාව

සංගමය (IARA), ඉන්දියාව **2022 සැප්තැම්බර් 27 දින**	• **ආචාර්ය උපාධි දරන්නන් සඳහා පශ්චාත් ආචාර්ය උපාධි අවස්ථා සොයා ගැනීමට පහසුකම් සැලසීම.** • පර්යේෂණ සහ නවෝත්පාදන ශක්තිමත් කිරීම සඳහා, දෙපාර්ශ්වයම ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල පීඨ සාමාජිකයින්ගේ සහ පර්යේෂණ විද්වතුන්ගේ ශාස්ත්‍රීය ප්‍රවීණතාවය බෙදාගැනීමෙන් දර්ශක/පරාමිතීන්/වර්තමාන ගැටළු හඳුනා ගැනීමට එක්ව කටයුතු කරයි. • දෙපාර්ශවයේම අධ්‍යයන කාර්ය මණ්ඩලය පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධව කටයුතු කරයි. එය සිදු කිරීම සඳහා, පෙළපොත්, මොනොග්‍රෑෆ් සහ ලිපි ලිවීම සඳහා ඒකාබද්ධ කර්තෘ කණ්ඩායම් සාදනු ලැබේ. • ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, විද්‍යාත්මක සම්මන්ත්‍රණ, භාෂා වැඩසටහන් පැවැත්වීම, සංස්කෘතික උත්සව පැවැත්වීම සහ විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම ක්‍රියාත්මක කිරීම වැනි අධ්‍යයන/සමාජ ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා එකිනෙකාගේ සහභාගීත්වය.	
කාන්තාවන් සඳහා කලා සහ විද්‍යාව සඳහා වූ K.S.R විද්‍යාලය, ඉන්දියාව **2022** සැප්තැම්බර් **24** දින	• සහයෝගී ඉගැන්වීම්, පුහුණුව, පර්යේෂණ සහ නවෝත්පාදන සහ අනෙකුත් අධ්‍යයන කටයුතු සඳහා ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයට අනුකූලව සීමිත කාලයක් සඳහා දෙපාර්ශවය අතර පර්යේෂණ විද්වතුන් ඇතුළු කාර්ය මණ්ඩලය සහ සිසුන් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම. • දෙපාර්ශවයම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සමීපව කටයුතු කිරීම සහ විශ්වවිද්‍යාල අධ්‍යාපන සංවර්ධනය සඳහා අවශ්‍ය ඉගැන්වීම් ආධාර, පෙළ පොත් (මාර්ගගත මූලාශ්‍ර) වැනි සම්පත් හුවමාරු කර ගැනීම. • ප්‍රථම, පශ්චාත් උපාධි, සහ ආචාර්ය උපාධිය (PhD) සඳහා ඒකාබද්ධ පර්යේෂණ අධීක්ෂණය සිදු කිරීම. • පර්යේෂණ සහ නවෝත්පාදන ශක්තිමත් කිරීම සඳහා, දෙපාර්ශ්වයම ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල පීඨ සාමාජිකයින්ගේ සහ පර්යේෂණ විද්වතුන්ගේ ශාස්ත්‍රීය ප්‍රවීණතාවය බෙදාගැනීමෙන් දර්ශක/පරාමිතීන්/වර්තමාන ගැටළු හඳුනා ගැනීමට එක්ව කටයුතු කිරීම. • දෙපාර්ශවයේම අධ්‍යයන කාර්ය මණ්ඩලය පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධව කටයුතු කිරීම. එය සිදු කිරීම සඳහා, පෙළපොත් රචනය , මොනොග්‍රෑෆ් සහ ලිපි සඳහා ඒකාබද්ධ කර්තෘ කණ්ඩායම් සාදනු ලැබේ.	ඉන්දියාව

	• උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික/ප්‍රායෝගික පුහුණු වැඩසටහන ඒකාබද්ධව සංවිධානය කිරීම, පශ්චාත් උපාධි සිසුන් සඳහා ක්ෂේත්‍ර චාරිකා/අධ්‍යාපන චාරිකා සැලසුම් කිරීම සහ පළමු වසර සිසුන් සඳහා යොමු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සම්පත් දායකයින් සැපයීම. • උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා මෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළ ඉගැන්වීම් සහ පර්යේෂණ ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ආධුනික කථිකාචාර්යවරුන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටිකාලීන පුහුණු පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම. • ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, විද්‍යාත්මක සම්මන්ත්‍රණ, භාෂා වැඩසටහන් පැවැත්වීම, සංස්කෘතික සිදුවීම් සහ විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම ක්‍රියාත්මක කිරීම වැනි අධ්‍යයන/සමාජ ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා එකිනෙකාගේ සහභාගීත්වය.	
Chuvash I. Yakovlev State Pedagogical University **2022** දෙසැම්බර් **29** දින	• විශ්වවිද්‍යාලයේ විශේෂඥයින්, උපාධිධාරීන්, ශාස්ත්‍රපතිවරුන් සහ පශ්චාත් උපාධිධාරීන්ගේ පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරකම් පැවැත්වීම (සම්මන්ත්‍රණ, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, ඔලිම්පියාඩ්, නිර්මාණාත්මක ව්‍යාපෘති, අවසාන සුදුසුකම් ලැබීමේ පත්‍රිකා ආරක්ෂා කිරීම සඳහා සහභාගී වීම ආදිය). • ඒකාබද්ධ මුද්‍රිත ද්‍රව්‍ය ලේඛන කිරීම සහ ප්‍රකාශනය කිරීම. • අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පර්යේෂණ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය (සීමාවාසික) ප්‍රවර්ධනය කිරීම. • ගුරු කාර්ය මණ්ඩලයේ ඉගැන්වීම්, පර්යේෂණ, නිර්මාණාත්මක සහ අධ්‍යාපනික කටයුතු පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම. • ගුරුවරුන්ගේ අත්දැකීම් සාමාන්‍යකරණය කිරීම, නව්‍ය විෂයමාලා සැකසීම, නිර්දේශ සකස් කිරීම, විද්‍යාත්මක ලිපි, අධ්‍යයන මාර්ගෝපදේශ සහ වෙනත් විද්‍යාත්මක හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් සඳහා උපදේශන සහාය ලබා දීම.	රුසියාව

4.7 පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලය

4.7 වගුව: පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර (2021 දී දේශීය හා විදේශීය)

පීඨය/අධ්‍යයනාංශය	කාර්ය මණ්ඩලයේ නම සහ තනතුර	පශ්චාත් උපාධි	අරමුදල් මූලාශ්‍රය	රට
ව්‍යවහාරික විද්‍යා පීඨය	ආර්.තුසන්තනී මිය කථිකාචාර්ය (ආධුනික) - ගණිත	ගණිතය පිළිබඳ විද්‍යාපති	ස්වයං මූල්‍ය	කැනඩාව
කලා හා සංස්කෘතික පීඨය	එම්.ටී.ඒ.අස්සර් මයා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	දර්ශණවේදී HRM	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකාව
ඉංජිනේරු පීඨය	එෆ්.රෙහානා මුනාස් මිය කාර්මික ඉංජිනේරුකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	යාන්ත්‍රික ඉංජිනේරු පිළිබඳ ආචාර්ය උපාධිය	මූල්‍යයනය OWSD පශ්චාද් උපාධි අධි ශිෂ්‍යත්ව විසිනි	මැලේසියාව
ගබඩා හා සැපයුම් අංශය	එස්.එච්.සෆීක් මයා සහකාර මූල්‍යාධිකාරී	ව්‍යාපාර පරිපාලනපති	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකාව
ගෙවීම් අංශය	එස්.එල්.එම්.තාහීර් මයා සහකාර මූල්‍යාධිකාරී	CMA වෘත්තීයවේදී	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකා ශාඛාව හරහා CMA ඕස්ට්‍රේලියාව
ස්ථාවර වත්කම් කළමනාකරණ සහ වාර්තාකරණ අංශය	එස්.එම්.සහීත් මයා සහකාර මූල්‍යාධිකාරී	ව්‍යාපාර පරිපාලනපති	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකාව
ඉස්ලාම් අධ්‍ය.හා අරාබි භාෂා පීඨය	එස්.ප්‍රශාන්ත් මයා සහකාර ලේඛකාධිකාරී	ව්‍යාපාර පරිපාලනපති	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකාව
	එම්.එස්.ෆාතිමා සුලයිහා මිය කථිකාචාර්ය (ආධුනික)- ඉස්ලාම් බැංකුකරණය හා මූල්‍ය	ආචාර්ය උපාධිය - ඉස්ලාම් බැංකුකරණය	ස්වයං මූල්‍ය	මැලේසියාව
	එම්.එස්.ඉස්මියා බෙගම් මිය කථිකාචාර්ය (ආධුනික)- ඉස්ලාම් චින්තනය හා ශිෂ්ඨාචාරය	පශ්චාද් උපාධි - ඉස්ලාම් අධ්‍යයනය	ස්වයං මූල්‍ය	මැලේසියාව
විභාග අංශය	එම්.ඒ.සී.එම්.රමීස් මයා Deputy Registrar	දර්ශණවේදී HRM	විශ්වවිද්‍යාල	ශ්‍රී ලංකාව
තාක්ෂණ පීඨය	එස්.එල්.රස්මියා බෙගම් මිය කථිකාචාර්ය (ආධුනික)	දර්ශණවේදී - කෘෂිකාර්මික සහ ජෛව පද්ධති ඉංජිනේරු	ස්වයං මූල්‍ය	ශ්‍රී ලංකාව

4.8 පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.

වගුව 4.8: 2021 දී අදාළ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර

පීඨය/ දෙපාර්තමේන්තුව/ ඒකකය	නිලධාරියාගේ නම සහ තනතුර	පශ්චාත් උපාධිය	රට
ව්‍යවහාරික විද්‍යා පීඨය	ආර්.අර්වනා මිය සහකාර ලේඛකාධිකාරී	වයාපාර පරිපාලනපති	ශ්‍රී ලංකාව

4.9 වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

වගුව 4.9: 2022 වර්ෂය තුලදී ශ්‍රී.අ.වි.වි.යේ පීඨ සහ පුස්තකාල විසින් පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර.

පීඨය	වැඩසටහන් මාතෘකාව සහ කාණ්ඩය (වැඩමුළු/ පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ/ මාධ්‍ය වැඩසටහන්)	සහභාගී වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම්	දිනය
වැඩමුළු				
පුස්තකාලය	**පොත් බෙදාදීමේ වැඩසටහන** (ශ්‍රී.අ.වි.වි.යේ පුස්තකාලය YM Trust Australia සමඟ එක්ව අම්පාර දිස්ත්‍රික්කයේ පාසල්, විද්‍යාල සහ මහජන පුස්තකාල 25ක් සඳහා පොත් 2399ක එකතුවක් පරිත්‍යාග කරන ලදී.)	250	මහජන පුස්තකාලයාධිපතිවරුන්, පාසල් සහ විද්‍යාල පුස්තකාලයාධිපති	20.11.2022

4.10 වගුව: 2022 දී SEUSL හි වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) විසින් පවත්වනු ලැබූ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර.

අනු අංකය	වැඩසටහනේ මාතෘකාව	සහභාගී වූ ගණන	ඉලක්ක කණ්ඩායම		දිනය
වැඩමුළු					
01	ඔබේ විදේශ රැකියා සහ උසස් අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.	643	සියලුම උපාධි අපේක්ෂකයින්		20.08.2022
02	"නීති සාක්ෂරතාව": ශ්‍රී ලංකාවේ නීතිඥයෙකු වීමට මග පෙන්වීමක්	893	පළමු වන වසර සිසුන්	සියලු සිසුන්	03.09.2022
03	වැඩ ලෝකය	409	පළමු වන වසර සිසුන්		04.09.2022
04	සූදානම් කිරීමේ සැසිය (SLAS)	122	නවක උපාධිධාරීන්		06.03.2022
05	වෘත්තීය සැලසුම්	125	දෙවන වසර සිසුන්	FIA	01.01.2022
06	ඩිජිටල් ඉගෙනුම් සහ ඊ-පන්ති කාමරය තුළ සදාචාරාත්මක හැසිරීම	216	පළමු වන වසර සිසුන්	FIA	26.02.2022
07	ඔබේ විභාගය සූදානම් කර ලියන ආකාරය	190	පළමු වන වසර සිසුන්	FIA	27.02.2022
08	ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කිරීම සහ ඵලදායී ඉදිරිපත් කිරීමක් ලබා දීම	80	දෙවන වසර සිසුන්	FIA	05.03.2022
09	පශ්චාත් COVID-19 තත්ත්වය තුළ තරුණයින්ගේ අභියෝග සහ අපේක්ෂාවන්	188	දෙවන වසර සිසුන්	FIA	06.03.2022
10	වෘත්තීය සංවර්ධනය සහ ඒ සඳහා සූදානම් වීම රැකියා වෙළෙඳපොළ	93	තුන්වන සහ හතර වන වසර සිසුන්	FIA	12.03.2022
11	Covid 19 හි මානසික සහ මානසික බලපෑම්	102	තුන්වන සහ හකර වන වසර	FIA	19.03.2022

12	කාල කළමණාකරණය	134	දෙවන වසර සිසුන්	FIA	26.03.2022
13	චිත්තවේගීය බුද්ධිය	51	දෙවන වසර සිසුන්	FIA	28.05.2022
14	වෘත්තීය සැලසුම්	125	දෙවන වසර සිසුන්	FIA	01.01.2022
15	වෘත්තීය ගවේෂණය (අන්තර්ජාලය හරහා උපයන ආකාරය)	239	තුන්වන සහ හතර වන වසර සිසුන්	FIA	20.12.2022
16	පුද්ගලික SWOT විශ්ලේෂණය	44	දෙවන වසර සිසුන්	FAC	28.04.2022
17	වැඩ ලෝකය සඳහා පූර්ව සූදානම	120	දෙවන වසර සිසුන්	FAC	28.05.2022
18	ඉලක්ක සැකසීම	487	පළමු වන වසර සිසුන්	FAC	03.09.2022
19	ඔබේ වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීමට අභිප්‍රේරණයෙන් සිටින්න	85	දෙවන වසර	FAC	27.08.2022
20	මාර්ගගත ඉගෙනීම සහ අතථ්‍ය සන්නිවේදනය	538	පළමු වන වසර සිසුන්	FAC	10.09.2022
21	සිහින රැකියාව දිනා ගැනීමේ මාවත	534	පළමු වන වසර සිසුන්	FAC	11.12.2022
22	ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීමග	509	දෙවන වසර	FAC	18.12.2022
23	වෘත්තීය ගවේෂණය (අන්තර්ජාලය හරහා උපයන ආකාරය)	239	තුන්වන සහ හතර වන වසර සිසුන්	FAC	20.12.2022
24	නව වැඩ සම්මතයන් සඳහා මානව සම්පත්	232	FMC සියළු සිසුන්	FAC	16.03.2022
25	ඔබේ වෘත්තිය ඉලක්ක කරන්න	342	පළමු වන වසර සිසුන්	FMC	11.09.2022
26	මතකය වැඩිදියුණු කර ගන්නේ කෙසේද	131	පළමු වන වසර සිසුන්	FMC	19.09.2022
27	පුද්ගල දැක්ම වර්ධනය කර ගැනීම.	564	පළමු වන වසර සිසුන්	FMC	17.11.2022
28	රැකියා පුහුණුව සහ විදේශ රැකියා අවස්ථා සඳහා මාර්ගය	196	තුන්වන සහ හතර වන වසර සිසුන්	FMC	12.11.2022
29	ධනාත්මක ආකල්ප සහ අභිප්‍රේරණය	252	දෙවන වසර සිසුන්	FMC	06.12.2022
30	සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දීම	152	තෙවන වසර සිසුන්	FAS	12.03.2022
31	වෘත්තීය ගවේෂණය සහ සෙවුම් ශිල්පීය ක්‍රම	148	තෙවන වසර සිසුන්	FAS	12.03.2022
32	ඉලක්ක සැකසීම	245	පළමු වන වසර සිසුන්	FAS	04.09.2022
33	මතකය වැඩි දියුණු කරන්නේ කෙසේද	131	පළමු වන වසර සිසුන්	FAS	19.09.2022
34	විදේශ රැකියා ගවේෂණය	167	තුන්වන සහ හතර වන වසර සිසුන්	FAS	16.10.2022
35	ධනාත්මක ආකල්ප සහ අභිප්‍රේරණය	252	දෙවන වසර සිසුන්	FAS	06.12.2022
36	කණ්ඩායම් ගැටුම් සහ ගැටළු විසඳීම	177	දෙවන වසර සිසුන්	FAS	17.12.2022
37	පුද්ගලික දැක්ම වර්ධනය කිරීම	87	පළමු වන වසර සිසුන්	FT	20.09.2022
38	ඉලක්ක සැකසීම	334	පළමු වන වසර සිසුන්	FT	11.12.2022
39	ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම.	192	දෙවන වසර සිසුන්	FT	17.12.2022
40	පුද්ගලික දැක්ම වර්ධනය කිරීම	88	පළමු වන වසර සිසුන්	FE	29.09.2022
41	කණ්ඩායම් ගැටුම් සහ ගැටළු විසඳීම	177	දෙවන වසර සිසුන්	FE	17.12.2022
42	වෘත්තීය ගවේෂණය සහ සෙවුම් ශිල්පීය ක්‍රම	208	දෙවන වසර සිසුන්	EDP	02.10.2022
43	වෘත්තීය සැලසුම්	1050	පළමු වන වසර සිසුන්	EDP	19.09.2022
44	ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම.	134	දෙවන වසර සිසුන්	EDP	16.11.2022
45	පුද්ගලික සංවර්ධනය	182	තෙවන වසර සිසුන්	EDP	25.11.2022
46	වැඩ ලෝකයේ නැගී එන ප්‍රවණතා	102	තෙවන වසර සිසුන්	EDP	02.12.2022
47	මෘදු කුසලතා වර්ධනය කිරීම	817	පළමු වන වසර සිසුන්	EDP	16.12.2022
නම්නීකරණ වැඩසටහන්					
48	ආතති කළමනාකරණය	129	පළමු වන වසර සිසුන්	FMC	05.07.2022

49	ඉලක්ක සැකසීම	51	පළමු වන වසර සිසුන්	FMC	27.06.2022
50	උපාධි අපේක්ෂකයින් සහ වැඩ ලෝකය	133	පළමු වන වසර සිසුන්	FMC	05.07.2022
51	පුද්ගලික සංවර්ධනය	129	පළමු වන වසර සිසුන්	FMC	06.07.2022
උපදේශනය පිළිබඳ කෙටිකාලීන වැඩසටහන්					
52	මාර්ගෝපදේශ හා උපදේශනය පිළිබඳ හැඳින්වීම	201	දෙවන වසර සිසුන්	සියළු සිසුන්	18.06.2022
53	උපදේශන කුසලතා හැඳින්වීම	189			27.06.2022
54	පෞරුෂ සංවර්ධනය	154			01.07.2022
55	ඵලදායී ඉගෙනීම සඳහා මතක ශක්තිය වැඩි දියුණු කරන්න	136			15.07.2022
56	හැඟීම් කළමනාකරණය	90			23.07.2022
මෘදු කුසලතා පිළිබඳ කෙටි කාලීන වැඩසටහන					
57	ඵලදායී නායකත්ව කුසලතා	177	තුන්වන සහ හතර වන වසර සිසුන්	සියළු සිසුන්	13.08.2022
58	වෘත්තීය ආකල්පයක් තෝරන්න	74			21.08.2022
59	ගැටුම් කළමනාකරණය	181			24.08.2022
60	වැඩ ආචාර ධර්ම	77			28.08.2022
61	විවේචනාත්මක චින්තනය	239			02.09.2022
සන්නිවේදන කුසලතා පිළිබඳ කෙටිකාලීන වැඩසටහන්					
62	සන්නිවේදන ක්‍රියාවලිය	993	පළමු වන වසර සිසුන්	සියළු සිසුන්	08.10.2022
63	ඉදිරිපත් කිරීමේ කුසලතා	762			15.10.2022
64	ක්‍රියාකාරී සවන්දීම	627			16.10.2022
65	කණ්ඩායම් වැඩ	662			22.10.2022
66	ආක්‍රමණශීලීත්වය සමඟ කටයුතු කිරීම	364			23.10.2022
67	අන්තර් පුද්ගල කුසලතා	363			30.10.2022
68	සාකච්ඡා කිරීමේ කුසලතා	856			05.11.2022
69	නිර්මාණාත්මක ගැටළු විසඳීම	1065			05.11.2022
ස්වේච්ඡා වැඩසටහන					
70	සුහුරු අධ්‍යයන ක්‍රමවේද	456	සියළු උපාධි අපේක්ෂකයින්	සියළු සිසුන්	19.06.2022
71	ඔබේ විදේශ රැකියා සහ උසස් අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම.	643	සියළු උපාධි අපේක්ෂකයින්		20.08.2022
72	“ නීති සාක්ෂරතාව ”: ශ්‍රී ලංකාවේ නීතිඥයෙකු වීමට මාර්ගෝපදේශයක්	893	පළමු වන වසර සිසුන්		03.09.2022
73	වැඩ ලෝකය	409	පළමු වන වසර සිසුන්		04.09.2022
74	ඔබේ ප්‍රධානියා ඔබම වන්න	163	සියළු උපාධි අපේක්ෂකයින්		05.07.2022
75	වෘත්තීය ගවේෂණය සහ සෙවුම් ශිල්පීය ක්‍රම	208	දෙවන වසර සිසුන්	EDP	02.10.2022
76	රැකියා පුහුණුව සහ විදේශ රැකියා අවස්ථා සඳහා දොරටුව	196	තුන්වන සහ හතර වන වසර සිසුන්	FMC	12.11.2022
77	ඔබේ විභාගයට සූදානම් වී ලියන ආකාරය	190	පළමු වන වසර සිසුන්	FIS	27.02.2022
78	ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කිරීම සහ ඵලදායී ඉදිරිපත් කිරීමක් ලබා දීම	80	දෙවන වසර සිසුන්	FIA	05.03.2022
79	වෘත්තීය සංවර්ධනය සහ රැකියා වෙළෙඳපොළ සඳහා සූදානම් වීම.	93	තුන්වන සහ හතර වන වසර සිසුන්	FIA	12.03.2022
80	චිත්තවේගීය බුද්ධිය	51	දෙවන වසර සිසුන්	FIA	28.05.2022
ව්‍යවසායකත්ව වැඩසටහන					
81	වෘත්තීය මාර්ගෝපදේශ-වෙබිනාර් සැසිය	168	පළමු වන වසර සිසුන්	FIA	24.02.2022
82	වෘත්තීය ගවේෂණය (අන්තර්ජාලය හරහා උපයන ආකාරය)	239	තුන්වන සහ හතර වන වසර සිසුන්	FIA	20.12.2022
83	වෘත්තීය ගවේෂණය (අන්තර්ජාලය හරහා උපයන ආකාරය)	239		FIA	20.12.2022

84	ව්‍යවසායකයෙකු වන්නේ කෙසේද	168		FIA	26.09.2022
85	වෘත්තීය ගවේෂණය (අන්තර්ජාලය හරහා උපයන ආකාරය)	239		FAC	20.12.2022
86	උපාධි අපේක්ෂකයින් ව්‍යවසායකත්වය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	80	දෙවන වසර සිසුන්	FAC	06.08.2022
(උපාධිධාරී ව්‍යවසායක උදානය-2022)					
87	ඔබේ ව්‍යාපාර සැලැස්ම ලියන්නේ කෙසේද - I කොටස	35	දෙවන වසර සිසුන්	ඕනෑම සිසුවෙකු	07.08.2022
88	ඔබේ ව්‍යාපාර සැලැස්ම ලියන්නේ කෙසේද - II කොටස	40			11.08.2022
89	ඔබේ ව්‍යාපාර සැලැස්ම ලියන්නේ කෙසේද - III කොටස	17			12.08.2022
90	ඔබේ ව්‍යාපාර සැලැස්ම ලියන්නේ කෙසේද - IV කොටස (ගැටළු විසඳීමේ සැසිය)	28			15.08.2022
91	ව්‍යවසායකත්ව සහ අභිප්‍රේරණ වැඩසටහන (ව්‍යවසායකයෙකු වන්නේ කෙසේද)	168	තුන්වන සහ හතර වන වසර සිසුන්		26.09.2022

4.11 වගුව: 2022 දී ශ්‍රී.ල.අ.වි.යේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) විසින් පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) අනුග්‍රහය දක්වන ලද ක්‍රියාකාරකම්

අ. දේශීය වැඩමුළු/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්/කෙටිකාලීන පාඨමාලා				
අනු අංකය	වැඩසටහන	සහභාගී වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම	දිනය
පුහුණු වැඩසටහන්				
01	අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආරම්භක පුහුණු වැඩසටහන - 2022 - V - කණ්ඩායම	25	පරිවාස/ස්ථිර නොකළ අධ්‍යයන කාර්ය මණ්ඩලය	2022.03.04 (ආරම්භය) 2022.08.16 (සහතිකපත්‍ර ප්‍රදානය)
සම්මන්ත්‍රණ වැඩසටහන් පැවැත්වීම				
02	කළමනාකරණ සහකාර/කළමනාකරණ සහකාර (සරප්/පොත් තබන්නා/ගබඩා පාලක) III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා උසස් කිරීම සඳහා ලිඛිත විභාගයට සූදානම් වීම සඳහා පුහුණු සම්මන්ත්‍රණය - 2022	23	අනධ්‍යයන කාර්ය මණ්ඩලය (ලිපිකරු සහ ආශ්‍රිත ශ්‍රේණි)	2022 පෙබරවාරි 19, 20, 26 සහ 27 (දින 04)
03	කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත් කිරීම සඳහා වූ ලිඛිත විභාගය - 2021 සඳහා සූදානම් කිරීමේ පුහුණු සම්මන්ත්‍රණය. - 2021	17	ප්‍රාථමික මට්ටමේ සේවකයින් (අනධ්‍යයන කාර්ය මණ්ඩලය)	2022.03.27 සහ 2022.04.02
04	කළමනාකරණ සහකාර - III ශ්‍රේණියේ සේවය ස්ථිර කිරීම සඳහා වූ ලිඛිත විභාගයට සූදානම් වීම සඳහා වූ පුහුණු කිරීමේ සම්මන්ත්‍රණය	27	කළමනාකරණ සහකාර, III ශ්‍රේණිය / කළමනාකරණ සහකාර, III ශ්‍රේණිය (අනධ්‍යයන කාර්ය මණ්ඩලය)	2022.11.27
වැඩමුළු				
05	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	30	පරිපාලන කාර්ය මණ්ඩලය	2022.03.03
සූදානම් වීමේ සැසි				
06	සම්මුඛ පරීක්ෂණ වලට සාර්ථකව මුහුණ දීම සඳහා වූ උපක්‍රම පිළිබඳ සූදානම් වීමේ සැසිය	10	ප්‍රාථමික මට්ටමේ සේවකයින් (අනධ්‍යයන කාර්ය මණ්ඩලය)	2022.10.20

4.12 වගුව: 2022 දී ශ්‍රී.අ.ව.වි හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතා මධ්‍යස්ථානය (CGEE) විසින් පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර.

වැඩසටහන් මාතෘකාව	සහභාගී වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම	දිනය
කාන්තා දින සැමරුම			
තිරසාර හෙටක් සඳහා අද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	330	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය, සියලුම පීඨ සිසුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා සංවර්ධන නිලධාරිනියන්, අම්පාර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල කාන්තා ක්‍රියාකාරීන්	28.03.2022
මණ්ඩල සාකච්ඡාව			
තිරසාර හෙටක් සඳහා අද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය: පාරිසරික අංශය, තාක්ෂණික අංශය, කාන්තා ව්‍යවසායක අංශය, තිරසාර පරිභෝජනය, සහ සමාජීය පැතිකඩ	330	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය, සියලුම පීඨ සිසුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා සංවර්ධන නිලධාරිනියන්, අම්පාර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධානවල කාන්තා ක්‍රියාකාරීන්	28.03.2022
නවක නම්නීකරණය			
ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ තොරතුරු සැසියක් - අධ්‍යක්ෂ/GEE විසිනි	215	කලා හා සංස්කෘතික පීඨ නවකයින්	05.06.2022
ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය	105	කලමනාකරණ හා වාණිජ පීඨ නවකයින්	23.06.2022
ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ සවිඥානිකව ඉහළ නැංවීමේ වැඩසටහන	103	ව්‍යවහාරික විද්‍යා පීඨ නවකයින්	14.07.2022
පූර්ව අධ්‍යයන වැඩසටහන			
ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය	120	ඉංජිනේරු පීඨ නවකයින්	29.07.2022
සම්මන්ත්‍රණය			
කලා හා සංස්කෘතික පීඨය සමඟ සහයෝගීත්වයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතාවය පිළිබඳ සංකල්පීය චින්තනය	350	කලා හා සංස්කෘතික පීඨ සිසුන්	04.10.2022

4.13 වගුව: 2022 වසර තුළ පවත්වන ලද ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර

අනු අංකය	වැඩසටහන් මාතෘකාව	සහභාගී වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම	දිනය
ශාරීරික අධ්‍යාපන ඒකකය				
01	2022 අන්තර් පීඨ ක්‍රීඩා උළෙල සංවිධානය කරන ලදී.	සියළු සිසුන්	සියළු පීඨ	සැප්තැම්බර් 2022 - නොවැම්බර් 2022
02	2022 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලිය සඳහා සහභාගී විය	සිසුන් 250	සියළු රාජ්‍ය විශ්වවිද්‍යාල	2022 නොවැම්බර් 04, 2023 ජනවාරි 10

5.1 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර

දැනට ක්‍රියාත්මක වන එක් එක් ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතියේ සාරාංශ විස්තර සහ නවතම ඡායාරූපය 5.1 සහ 5.2 වගු වල දැක්වේ.

5.1 වගුව: පවුල් නිළ නිවාස

ප්‍රදානය කල වසර	2019
ප්‍රදානය කරන ලද ව්‍යාපෘතියේ විස්තරය	ශ්‍රී.අ.වි.වි.,ඔලුවිල් හි SEUSL හි සේවක නිල නිවාස (අධ්‍යයන/අනධ්‍යයන) සඳහා ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ බාර දීම.
ණය/ප්‍රදාන	ප්‍රදාන
අරමුදල් නියෝජිතායතනය	ශ්‍රී ලංකා රජය
TEC රු.	272,100,000.00
2022.12.31 දිනට සමුච්චිත වියදම්	237,432,582
භෞතික ප්‍රගතිය %	85%




5.2 වගුව: මල්වත්ත කෘෂි තාක්ෂණික උද්‍යානය

ප්‍රදානය කල වසර	2021
ප්‍රදානය කරන ලද ව්‍යාපෘතියේ විස්තරය	මල්වත්ත කෘෂි තාක්ෂණික උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධනය, ශ්‍රී.අ.වි.වි
ණය/ප්‍රදාන	ප්‍රදාන
අරමුදල් නියෝජිතායතනය	ශ්‍රී ලංකා රජය
TEC රු.	149,520,555.00
2022.12.31 දිනට සමුච්චිත වියදම්	57,482,642
භෞතික ප්‍රගතිය %	45%






6 තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම්

6.1 තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගැනීම

උපාය මාර්ගික සැලැස්මේ (2019-2023) තිරසාර සංවර්ධනයට අදාලව 6 වන ඉලක්කයේ 6.4 සහ 6.6 පරමාර්ථය යටතේ ඒකාබද්ධ කර ඇති උපාය මාර්ගයන්, මූලික කාර්යසාධන දර්ශක (KPIs) සහ ඉලක්කයන්, 2022වර්ෂය තුලදී ලබා කර ගත් ආකාරය පහත දක්වා ඇත

6 වන ඉලක්කය

අරමුණ 6.4: විවිධාංගීකරණය වූ ආදායම් මාර්ග නිර්මාණය කිරීම සහ හොඳ මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම තුළින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තිරසාරභාවය ඉහළ නැංවීම.

අරමුණ 6.6: තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා අපගේ කාර්ය මණ්ඩලය සහ ආයතනික කැපවීම් වැඩි දියුණු කිරීම.

6.1 වගුව: 6 වන ඉලක්කයේ 6.4 සහ 6.6 පරමාර්ථය යටතේ මූලික කාර්ය සාධන දර්ශකයට අදාලව 2022 වර්ෂයේදී ලබා ඇති ජයග්‍රහණ

යොමු අංකය	උපායමාර්ගයන්	මූලික කාර්යසාධන දර්ශක (KPIs)	ඉලක්කය	2022 දී ජයග්‍රහණ
6.4.1	ශ්‍රී.අ.වි.වි.යේ උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් රැස් කිරීමේ අරමුණින් විභව තරඟකාරී ආධාර සහ අනුග්‍රාහක ප්‍රභවයන් සෙවීම, ප්‍රචාරණය කිරීම සහ ලංසු තැබීම සඳහා විශ්වවිද්‍යාලයේ අරමුදල් රැස් කිරීමේ කමිටුවක් පිහිටුවීම.	මුළු ආදායමෙන් උත්පාදනය කරන ලද (ප්‍රදාන නොවන) වාර්ෂික ආදායමේ ප්‍රතිශතය	2023 වන විට මුළු ආදායමට වඩා ජනනය කරන ලද (ප්‍රදාන නොවන) වාර්ෂික ආදායමේ ප්‍රතිශතය අවම වශයෙන් 10% දක්වා වැඩි කරයි	පහත සඳහන් ප්‍රභවයන්ගෙන් 2022 වර්ෂය සඳහා ආදායම රු. 40,048,920.00 ක් විය: ලියාපදිංචි කිරීම, විභාග, පොලී, විකුණුම්, දඩ සහ වෙනත් ප්‍රභවයන්
6.4.2	උසස් අධ්‍යාපනයට වැඩි ප්‍රවේශයක් ලබා දීම සඳහා රජයේ ප්‍රතිපත්තිවල වැඩි ඉඩකඩක් ලබා දෙමින් අරමුදල් වැඩි කිරීම සඳහා රාජ්‍ය බලධාරීන්ට ඒත්තු ගැන්වීම.	කුවේට් අරමුදල් අවස්ථා භාවිතා කිරීම	2023 වන විට ප්‍රධාන සැලැස්ම යටතේ ඉතිරි ව්‍යාපෘතිවලින් අවම වශයෙන් 50% ක් සඳහා මුදල් යෙදවීම සඳහා කුවේට් අරමුදල් අවස්ථා භාවිතා කිරීම වැඩි කිරීම	
6.4.3	ප්‍රති ආයෝජනය සඳහා අතිරික්තයක් ඇති කරන	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන අනුපාතයට	බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන

	මූල්‍යමය වශයෙන් ශක්‍ය අධ්‍යයන වැඩසටහන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් හඳුන්වා දීමට පීඨ, බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ ඒකකය (CEDPL) සහ අනෙකුත් ක්‍රියාකාරී ඒකක දිරිමත් කිරීම.	අනුපාතයට වාර්ෂිකව රැස්කරන ලද තරඟකාරී ප්‍රදානය	වාර්ෂිකව රැස්කරන ලද තරඟකාරී ප්‍රදානය 2023 වන විට අවම වශයෙන් 0.3:1 දක්වා වැඩි කිරීම.	මධ්‍යස්ථානය විසින් සහ වෙනත් පශ්චාත් උපාධි පාඨමාලා මඟින් 2022 වසර තුලදී රු.මි.50.48ක් (මුළු ආදායම්) උත්පාදනය කර ඇත.
6.4.4	පවත්නා හා විභව බාහිර / අර්ධ-කාලීන වැඩසටහන් සඳහා වැඩි සිසුන් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි ඉගැන්වීම්, ඉගෙනුම්, කළමනාකරණ සහ අලෙවිකරණ උපායමාර්ග පුනර්ජීවනය කිරීම	අවශෝෂණ ධාරිතාව: ප්‍රාග්ධන ප්‍රදානයේ ප්‍රතිශත භාවිතය (බෙදා හැරීම)	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදානයේ ප්‍රතිශත භාවිතය (එනම් බෙදා හැරීම) අවම වශයෙන් 95% දක්වා වැඩි කිරීම	ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ශූන්‍ය වේ. සටහන: ස්වයං අරමුදල් උත්පාදනය බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් සිදු කරයි.
6.4.5	බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි ව්‍යාපාරික ආකෘතිය ප්‍රතිසංස්කරණය කිරීම මඟින් විවිධ පීඨ/ විශ්වවිද්‍යාලවල සහයෝගයෙන් මූල්‍යමය වශයෙන් ශක්‍යතාවය සහිත බහු කාර්ය අධ්‍යයන/ වෘත්තීය වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.	එක් සිසුවෙකු සඳහා වන පිරිවැය අඩු කිරීම	2023 වන විට එක් සිසුවෙකුගේ පිරිවැය 4% කින් අඩු කිරීම.	2021 වසර හා සසඳන විට එක් සිසුවෙකු සඳහා වන පිරිවැයේ අඩුවීමක් දක්නට ලැබේ
6.4.6	විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාවල ගුණාත්මය ඉහල නැංවීම සහ එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්වීම			මූල්‍ය වාර්තා සාමාන්‍යයෙන් මූල්‍ය කමිටුවට ඉදිරිපත් කරනු ලබන අතර එම වාර්තා සියළු පීඨයන්ට යවනු ලැබේ. මේ අතර, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.
6.4.7	පීඨ, ඒකක සහ සමස්තයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ කාර්තුමය මූල්‍ය / අයවැය ප්‍රගතිය අභ්‍යන්තරව ප්‍රකාශයට පත් කිරීම. එමඟින් විනිවිදභාවය, ගුණාත්මක මූල්‍ය පරීක්ෂාව සහ වගවීම බලාත්මක කිරීම			මෙහෙයුම් ගුණාත්මකභාවය සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා, වාර්තා පීඨාධිපතිවරුන් සහ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තු වෙත බෙදා හරිනු ලැබේ.

6.4.8	ආයතනික තිරසාරත්වයට පාදක වන ප්‍රාග්ධනය, පර්යේෂණ සහ මානව සංවර්ධන ක්‍රියාකාරකම් මත උපයන ලද ආදායම ප්‍රති ආයෝජනය කිරීම වැඩි කිරීම.			2022 වර්ෂය තුල පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධනය සඳහා මිලියන 1ක් වෙන් කරන ලදී.
6.4.9	අපගේ මූල්‍ය අවශෝෂණ ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලයේ අගය එකතු නොකරන පරිපාලන / ප්‍රසම්පාදන භාවිතයන් අහෝසි කිරීම.			කාර්යක්ෂම භාවිතය උදෙසා GRN , SRN හි සාම්ප්‍රදායික භාවිතයන් පරිගණක ගත කරන ලදී.
6.4.10	අනාගත සම්පත් ප්‍රතිපාදන දැනුම් දීම සඳහා පීඨ සහ ඒකකවල ව්‍යදම් ඉතිහාසය, වත්කම් උපයෝජනය සහ වගවීම භාවිතා කිරීම.			සාමාන්‍ය ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු විය.
6.4.11	කාර්යක්ෂම වත්කම් උපයෝජනය අධීක්ෂණය හා වැඩිදියුණු කිරීම සඳහා වත්කම් උපයෝගිතා සමීක්ෂණයක් සිදු කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.			වක්‍රලේඛ වලට අනුව, භාණ්ඩ සමීක්ෂණය සෑම වසරකම පවත්වනු ලැබේ.
6.4.12	පුනරාවර්තන ව්‍යදම් ඉතිරි කර සිසුන් හා කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම සහ සුභසාධන කටයුතු සඳහා එය භාවිතා කිරීම			උපදෙස් සහ පාලිත යාන්ත්‍රණය අදාළ ප්‍රධානීන් විසින් අනුගමනය කරනු ලැබේ. උත්පාදිත අරමුදල් වලින් යම් කොටසක් කාර්ය මණ්ඩලය සහ පීඨ සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබේ.
6.6.1.	තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය මගින් අපගේ ඉගැන්වීම්, ඉගෙනීම්, ප්‍රසම්පාදනය සහ කළමනාකරණ උපාය මාර්ග දැනුම් දීම සඳහා අපගේ ආයතනික ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපනය සඳහා සිසුන්ගේ ඇතුළත්වීම.	2023 වන විට තවත් 25%කින් ඇතුළත්වීම් වැඩි කර ගැනීම.	2019/2020 සහ 2020/2021 කණ්ඩායම් සඳහා ඇතුලත්වීම් වූයේ: පිළිවෙලින් 5843 (පාඨමාලාව හදාරන) සහ 7188 (පාඨමාලාව හදාරන) කි. 2022 වර්ෂයේ මුළු සිසුන් බඳවා ගැනීමේ ඉහළ

				යාමක් වාර්තා වී ඇත.
6.6.2	තිරසාර සංවර්ධන උපායමාර්ග විෂයමාලා තුලින් අපගේ ඉගෙනුම්, ඉගැන්වීම් හා ඇගයුම් ක්‍රමෝපායන් සමඟ ඒකාබද්ධ කිරීම.	බලශක්ති කාර්යක්ෂමතාව: ඒක පුද්ගල විදුලි පරිභෝජනය	2023 වන විට අවම වශයෙන් 5%කින් ඒක පුද්ගල විදුලි පරිභෝජනය අඩු කිරීම. (එක් සිසුවෙකුට විදුලි පරිභෝජනය)	සාමාන්‍ය මාසික පරිභෝජනය : ඒකක 18.72/ ශිෂ්‍යයෙකුට
6.6.3	වැඩිදියුණු කල සැලසුම්, අධීක්ෂණ සහ ඵලදායී වගවීමේ මිණුම් තුලින් විදුලිය හා ජල සම්පත් තිරසාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.	ඒක පුද්ගල ජල පරිභෝජනය	2023 වන විට අවම වශයෙන් 5%කින් ඒක පුද්ගල ජල පරිභෝජනය අඩු කිරීම. (එක් සිසුවෙකුට ජල පරිභෝජනය)	සාමාන්‍ය මාසික පරිභෝජනය : ඒකක 2/ ශිෂ්‍යයෙකුට
6.6.4	තිරසාරභාවය පිළිබඳ විධිමත් හා වෘත්තීය විගණනය තුළින් තිරසාරභාවය සඳහා වූ අපගේ කැපවීම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම			පහසුකම් සම්පාදනය කරන ලදී.
6.6.5	තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයින්, කාර්ය මණ්ඩලය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ මහජනතාව වෙත නිරන්තර දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.			OSPIM, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශිෂ්‍ය සහාය සේවා ඒකකය, පීඨ සහ පුස්තකාල සෑම වසරකම එවැනි වැඩසටහන් පවත්වනු ලැබේ.
6.6.6	පුනර්ජනනීය / පිරිසිදු බලශක්ති ප්‍රභවයන් සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම.			අපජලය පවිත්‍රාගාරයක් ඉදි කිරීම.

6.2 පරිසර සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

<u>අඛණ්ඩ පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්</u>

1. වාර්ෂික රුක් රෝපණ වැඩසටහන
   - විශ්වවිද්‍යාල නිර්මාතෘ දිනය
   - වසරේ පළමු දිනය
   - නිදහස් දිනය
   - රටේ ජාතික රුක් රෝපණ වැඩසටහන

     උදා: ශාක වල නම්: කුඹුක්, කායා බක් මී, කළුවර, බක් මී,කළුවර, මහෝගනී, මී, රඹුටන් සහ මදටිය.

2. කාලීන වැඩසටහන්
   - වැසි සමය ආරම්භ වීමට පෙර, බහු වාර්ෂික ශාක රෝපණය කිරීම සඳහා තෝරාගත් ස්ථානයක් සකස් කිරීම.
   - වෘක්ෂලතා ආදියේ සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කිරීම සඳහා ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීමට ගස් හා පඳුරු කප්පාදු කිරීම.
   - ගල්ඔය ගංතීරයේ කුඹුක් ගස් සිටුවීම.
   - විශ්වවිද්‍යාලයේ පවත්නා ජෛව විවිධත්වය පවත්වාගෙන යාම.

3. මාසික වැඩසටහන්
   - හිඩැස් පිරවීමේ රෝපිත ප්‍රදේශ උදා: මාර්ග පැත්ත සහ ගංගා පැත්ත
   - නව භූමි අලංකරණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.

4. දෛනික වැඩසටහන්
   - වියළී වැටෙන කොළ එකතු කිරීම සහ කොම්පෝස්ට් නිෂ්පාදනය
   - අනාගතයේ රෝපණය කිරීම සඳහා පැළ තවානක අළුත් පැළ ස්ථාපිත කිරීම.

- ආහාර අපද්‍රව්‍ය, පොලිතින් අපද්‍රව්‍ය සහ කඩදාසි අපද්‍රව්‍ය වෙන වෙනම එකතු කිරීම සඳහා විවිධ වර්ණ කුණු බඳුන් තබා ඇත. එකතු කරන ලද කසළ අඩිඩාලවිවේන ප්‍රදේශීය සභාවේ කුණු එකතු කිරීමේ මධ්‍යස්ථානය වෙත ගෙන යනු ලැබේ.
- ගල්ඔය ගඟ අසබඩ විශ්වවිද්‍යාලයේ නැගෙනහිර කොටසේ බාදනය පාලනය කිරීම සඳහා ගල් වැටි ඉදිකිරීම

- අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම: පිරිසිදු කරන ජලයෙන් කොටසක් විසිතුරු උද්‍යානය සඳහා යොදා ගනී. අපජල පවිත්‍රාගාරය සඳහා ජලය එකතු කිරීම පිළිබඳ විස්තර 6.2 වගුවේ දක්වා ඇත.

6.2 වගුව: අප ජල පවිත්‍රාගාරය සඳහා අප ජලය එකතු කිරීමේ විස්තර

අනු අංකය	ස්ථානය	දිනකට ජලය එකතු කිරීම (m3/දිනකට)	පෙහවුම් වල තුල පෙහවූ ජලයෙන් 35%	පවිත්‍රාගාරය සඳහා ජලය එකතු කිරීම. (m3/දිනකට)
01	හෙල බොජුන් ආපන ශාලාව	3.00	1.05	1.95
02	FVG - 01	31.00	සෘජුවම STP වෙත යවයි.	31.00
03	FVG - 01(A)	48.00	16.8	31.20
04	FVB - 01	21.00	7.35	13.65
05	FVB - 02	48.00	16.8	31.20
06	FVB - 03	48.00	සෘජුවම STP වෙත යවයි.	48.00
07	සේවක නිළ නිවාස	6.00	සෘජුවම STP වෙත යවයි.	6.00
දිනකට සමස්ත ජල එකතුව (m3/දිනකට)				163.00
රවුම් හතරක්		එකක 20.00 කි		-80.00
පවිත්‍ර කරන ලද ජල නිමවුමේ ඉතිරිය				83.00
උද්‍යාන වගා කටයුතු සඳහා නැවත යොදා ගත් පිරිපහදු කල ජලය				20.00

STP- අපජල පවිත්‍රාගාරය

- විශ්වවිද්‍යාලයේ සත්ව හා ශාක විවිධත්වය පවත්වාගෙන යන ලදී.

7 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර

7.1 ආදායම

(රු.මිලියන)

වර්ෂය	රජයේ ප්‍රදාන [1]	වෙනත් ආදායම් [2]	එකතුව
2021	1,861.68	22.22	1,883.90
2022	1,816.68	40.05	1,856.73

සටහන:
(1) "රජයේ ප්‍රදාන" යනු පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම්, මහපොළ හා ශිෂ්‍යාධාර යන අංශ සඳහා ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන වේ.
(2) "වෙනත් ආදායම්" යනු, පොලී, ගාස්තු, විකුණුම් හා විවිධ ලැබීම් වලින් ලැබෙන ආදායම සහ ව්‍යාජ්ති වැඩසටහන් සහ වෙනත් ක්‍රියාකාරකම් වලින් උපයා ගත් ආදායමයි.

7.2. ඉපයූ ආදායම (ව්‍යාජ්ති වැඩසටහන් සහ පශ්චාත් උපාධි අධ්‍යයන)

විෂය	2021 දී එකතුව (රු.)	2022 දී එකතුව (රු.)
උපාධි අපේක්ෂක අධ්‍යයන	38,170,202.00	40,548,058.00
ඩිප්ලෝමා වැඩසටහන්	1,914,050.00	588,920.00
සහතිකපත්‍ර වැඩසටහන්	--	871,500.00
පශ්චාත් උපාධි වැඩසටහන්	9,310,320.00	14,070,305.00
Total	**49,394,472.00**	**56,078,783.00**

7.3. ප්‍රධාන වැඩසටහන් වල පුනරාවර්තන වියදම

(රු.මිලියන)

වර්ෂය	පොදු පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා	අධ්‍යයන සේවා (2)	සුභසාධන සේවා (3)	නඩත්තු සේවා	වෙනත් (1)	මුළු පුනරාවර්ථන වියදම
2021	361.71	1,077.17	118.34	79.14	22.38	1,658.74
2022	441.80	1,197.45	112.12	95.19	24.35	1,870.92

(ක්ෂය හැර)

සටහන:
1) "වෙනත්" යනු, බාහිර විභාග, අනුකූල ක්‍රියාකාරකම්, ව්‍යාජ්ති පාඨමාලා, ශාරීරික අධ්‍යාපනය ආදිය වේ.
(2) " අධ්‍යයන සේවා" සඳහා ඉගැන්වීම් සම්පත්ද ඇතුළත් වේ.
(3) "සුභ සාධන සේවා" යන්නට මහපොළ හා ශිෂ්‍යාධාර වියදම් ද ඇතුලත් වේ.

7.3.1 අධ්‍යයන සේවා මත දරන ලද පුනරාවර්තන වියදම්

(රු.මිලියන)

වර්ෂය	කලා හා සංස්කෘතික පීඨය	කළමනාකරණ සහ වාණිජ්‍ය පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	ඉංජිනේරු පීඨය	පරිගණක පීඨය	සෞඛ්‍ය විද්‍යා පීඨය	පූර්වකාල සේවා	විභාග	එකතුව
2021	234.34	189.69	176.68	116.33	188.71	93.47	56.90	21.05	1,077.17
2022	261.76	202.96	205.41	124.11	209.64	110.77	61.45	21.35	1,197.45

7.4. ප්‍රාග්ධන වියදම

(රු.මිලියන)

වර්ෂය	ඉදිකිරීම්	ඉඩම්,උපකරණ,ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත්, වාර සඟරා සහ වාහන	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම.	අනෙකුත් ප්‍රාග්ධන ව්‍යාපෘති (1)	මුළු ප්‍රාග්ධන වියදම
	රජයේ ප්‍රදාන				
2021	124.75	22.23	8.84	10.77	166.59
2022	91.21	38.44	26.03	12.73	168.41

සටහන:

(1) "අනෙකුත් ප්‍රාග්ධන ව්‍යාපෘති" යනු තාක්ෂණ විෂයය, පශ්චාත් උපාධි පර්යේෂණ, දැනුම වැඩිදියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය ආදිය සඳහා වූ ප්‍රදානයන්ය.

7.5. වියදම් (ක්ෂය සහ මහපොළ හා ශිෂ්‍යාධාර හැර)

විෂය	වෙන්කිරීම		වියදම		ඉතිරිය / අතිරික්තය රු.	
	2021(රු.)	2022 (රු.)	2021(රු.)	2022 (රු.)	2021(රු.)	2022 (රු.)
ව්‍යාපෘති හැර පුනරාවර්ථන	1,665,000,000.00	1,662,000,000.00	1,571,016,532.04	1,792,732,503.20	93,983,467.96	(130,732,503.20)
ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	250,000,000.00	130,000,000.00	166,595,426.27	168,409,076.69	83,404,573.73	(38,409,076.69)
Total	**1,915,000,000.00**	**1,792,000,000.00**	**1,737,611,958.31**	**1,961,141,579.89**	**177,388,041.69**	**(169,141,579.89)**

7.6 මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණය – 2022

7.6.1 සිසුවෙකුට පිරිවැය (පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම)

පීඨය	සිසුන් සංඛ්‍යාව		සිසුවෙකුට පිරිවැය (රු.)	
	2021	2022	2021	2022
කලා හා සංස්කෘතික	1,258	1,299	394,806.58	380,595.42
කළමනාකරණ හා වාණිජ	1,402	1,868	343,831.58	287,742.47
ව්‍යවහාරික විද්‍යා	742	1,024	446,636.75	379,689.66
ඉස්ලාම් අධ්‍ය. හා අරාබි භාෂා	1,308	1,746	297,462.49	250,175.04
ඉංජිනේරු	479	400	602,503.31	703,186.11
තාක්ෂණ	655	848	351,237.90	309,715.23

7.7: වාර්ෂික ගිණුම්– 2022

2022 වර්ෂය සඳහා වූ ගිණුම් වාර්තා පිළිබඳව
ගණන්දීමේ නිළධාරියාගේ සහතිකය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අවසාන ගිණුම් වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 සහ 107 වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුව පිළියෙල කර, ආදායම් වියදම් ගිණුමට සහ ශේෂ පත්‍රයට අදාල සටහන් සහ උපලේඛන සමඟින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

ගනුදෙනු වල භිමිකාරිත්වය සහ වියදම්වල කාර්යක්ෂමතාවය තහවුරු කරනු වස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශිත මූල්‍ය රීති සහ ක්‍රමවේදයන් අනුගමනය කර ඇති අතර, වඩාත් ප්‍රායෝගික වන ආකාරයට පාලන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

මාගේ උපරිම දැනීමට අනුව, 2022 වර්ෂය සඳහා ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන සෑහීමකට පත්විය හැකි ආකාරයට සකස් කර ඇති බවට හා ඒ මගින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිඹිබු වන බව ප්‍රකාශයට පත් කරමි.

Prof. A. Ramesh
VICE-CHANCELLOR
EASTERN UNIVERSITY OF SRI LANKA

මහාචාර්ය ඒ.රමීස්
උපකුලපති (ගණන්දීමේ නිළධාරී)
2023.02.28

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට

	සටහන	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	01	4,742,355,126	5,016,976,728
කෙරීගෙන යන වැඩ	02	297,123,366	205,915,709
ආයෝජන			
මූල්‍ය වත්කම්	03	57,944,923	27,098,555
මුළු ජංගම නොවන වත්කම්		**5,097,423,414**	**5,249,990,992**
ජංගම වත්කම්			
භාණ්ඩ/තොග	04	13,572,115	7,968,611
ලැබිය යුතු ගිණුම්	05	104,380,572	73,667,679
ස්ථාවර තැන්පතු / ස්වයං මූල්‍ය වැඩස	06	180,529,960	167,348,075
ලැබිය යුතු පොළී	07	3,546,774	1,058,929
මුදල් හා මුදල් සමාන දෑ	08	88,425,295	223,626,405
මුළු ජංගම වත්කම්		**390,454,715**	**473,669,700**
මුළු වත්කම්		**5,487,878,130**	**5,723,660,692**
අරමුදල් සහ වගකීම්			
අරමුදල්			
සීමාකාරී අරමුදල්	09	80,287,495	74,405,122
ප්‍රාග්ධන ප්‍රදාන	10	4,830,494,755	5,061,017,304
සංචිත			
සමුච්චිත අරමුදල්/ පොදු සංචිත	11	(653,447,340)	(522,032,127)
ප්‍රත්‍යාගණන සංචිතය	12	530,887,790	530,887,790
ස්වයං මූල්‍ය වැඩසටහන් අරමුදල්	13	23,771,737	13,476,429
විලම්භීත ආදායම		2,092,346	2,888,156
මුළු අරමුදල් සහ වගකීම්		**4,814,086,783**	**5,160,642,673**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	14	468,403,721	425,897,567
		468,403,721	**425,897,567**
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	15	161,381,293	115,177,097
උපචිත වියදම්		44,006,333	21,943,356
		205,387,627	**137,120,452**
මුළු අරමුදල් සහ වගකීම්		**5,487,878,130**	**5,723,660,692**

මෙම වාර්ෂික ගිණුම් ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (1) සහ 107 (1) (b) වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර ඇත.

Bursar
South Eastern University of Sri Lanka
University Park, Oluvil

Signed for and on behalf of the Council

Vice Chancellor
SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

Registrar
Registrar
South Eastern University of Sri Lanka

Council Member
South Eastern University of Sri Lanka

02

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	2022 රු.	2021 රු.
ආදායම			
පුනරාවර්ථන ප්‍රදාන		1,628,500,000	1,561,000,000
මහපොල සහ ශිෂ්‍යාධාර ප්‍රදාන		78,185,400	87,730,700
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		517,337,021	558,894,951
වෙනත් ආදායම්	16	40,048,920	22,220,181
ස්වයං මූල්‍ය වැඩසටහන් ආදායම	17	50,486,904	45,194,023
		2,314,558,245	**2,275,039,855**
වියදම			
පුද්ගල වේතන		1,459,685,534	1,338,492,735
ගමන් වියදම් හා යැපීම් දීමනා		436,586	428,016
සැපයුම්		53,424,197	21,873,319
නඩත්තු		32,700,815	16,122,402
කොන්ත්‍රාත්ගත සේවා		152,881,342	116,777,112
වෙනත් පුනරාවර්ථන වියදම්		47,770,707	31,096,538
ක්ෂය		527,515,552	560,044,143
පාරිතෝෂික		49,766,951	46,226,410
සිසුන් සඳහා මූල්‍ය සහාය		78,185,400	87,730,700
ස්වයං මූල්‍ය වැඩසටහන් වියදම්	18	42,647,992	23,271,969
		2,445,015,076	**2,242,063,344**
වියදමට අතිරික්තව ඇති ආදායම		**(130,456,831)**	**32,976,512**
පෙර වර්ෂ ගැලපුම්		-	(27,979,710)
කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		**(130,456,831)**	**4,996,801**

නිවැරැදි බවට සහතික කළේ.,

Certified Correct
Bursar
Bursar
South Eastern University of Sri Lanka
University Park, Oluvil

Registrar
Registrar
South Eastern University of Sri Lanka

Vice Chancellor
VICE-CHANCELLOR
SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

Council Member
Council Member
South Eastern University of Sri Lanka

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත අතිරික්තය / (ඌණතාවය)	(130,456,831)	4,996,801
ගැලපීම්		
වර්ශය සඳහා පොළී	(25,238,590)	(6,715,660)
පෙර වර්ශ ගැලපීම් හි ක්ෂය	-	32,953,731
උප ඒකක ගනුදෙනු හිලව් කිරීම්	-	156,710
ආදායම් බෙදාහැරීම්	12,305,208	1,844.352
සේවා සැපයීමට නොහැකි ගිවිසුම් විකිණීම	(900,500)	(60,300)
පෙර වර්ෂ ගැලපීම්	(632,250)	-
මූල්‍ය නොවන වෙනස්වීම්		
ක්ෂය	527,515,552	560,044,143
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	42,506,154	34,536,260
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(517,337,021)	(558,894,951)
පෙර වර්ෂ ගැලපීම්	-	2,108
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)	**(92,238,278)**	**68,863,194**
ලැබිය යුතු ගිණුම් වැඩිවීම/ අඩුවීම	(30,712,893)	(4,982,228)
තොග වැඩිවීම/ අඩුවීම	(5,603,504)	1,146,068
ජංගම වගකීම් වැඩිවීම/ අඩුවීම	68,267,174	4,998,409
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(60,287,501)**	**70,025,443**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	(168,409,077)	(166,957,226)
ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීම්	(197,300,149)	(60,774,827)
ස්ථාවර තැන්පත්/ පොළී ආපසු ගැනීම්	156,951,318	22,903,918
සේවා සැපයීමට නොහැකි ගිවිසුම් විකිණීම	900,500	60,300
ලද පොළී	19,071,325	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(188,786,083)**	**(204,767,835)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	110,000,000	212,953,390
සීමාකාරී අරමුදල	5,882,374	48,978,934
ස්වයං මූල්‍යකරණ පාඨමාලාවන්හි අරමුදල් උපයෝජනය	(2,009,900)	(800,000)
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට සහ උපකුලපති අරමුදලට මාරුකිරීම්	-	(20,857,988)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**113,872,474**	**240,274,336**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	(135,201,110)	105,531,944
කාලච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	223,626,405	118,094,461
කාලච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**88,425,295**	**223,626,405**

ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ශය සඳහා

විස්තරය	වියදම් කල හා නොකල ප්‍රාග්ධන ප්‍රදාන	සීමාකාරී අරමුදල	ත්‍යාග හා පරිත්‍යාග	ප්‍රත්‍යාගණන අතිරික්ත	සමුච්චිත අරමුදල/පොදු සංචිත	ස්වයං මූල්‍යකරණ පාඨමාලා අරමුදල්	විලම්භීත ආදායම්	එකතුව
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,463,375,073**	**74,405,122**	**3,597,642,230**	**530,887,790**	**(522,032,127)**	**13,476,429**	**2,888,156**	**5,160,642,673**
වියදම් කල හා නොකල ප්‍රාග්ධන ප්‍රදාන වල ශුද්ධ වෙනස්වීම	110,000,000	-	-	-	-	-	-	**110,000,000**
ප්‍රාග්ධන ප්‍රදාන/පරිත්‍යාග/විලම්භීත ආදායම්හි ක්‍රමක්ෂය	(470,309,218)	-	(46,231,993)	-	-	-	**(795,810)**	**(517,337,021)**
සීමාකාරී අරමුදලේ වෙනස්වීම් / (මාරු කිරීම්)	-	5,882,374	-	-	-	-	-	**5,882,374**
පෙර වර්ෂ ගැලපීම්	-	-	-	-	(958,382)	-	-	**(958,382)**
පරිත්‍යාග වල ශුද්ධ වෙනස්වීම	-	-	1762,018,662	-	-	-	-	**176,018,662**
ප්‍රවර්ථන වර්ෂයේ ස්වයං මූල්‍යකරණ පාඨමාලාවන්හි ආදායම් බෙදාහැරීම්/ අරමුදල් මාරු කිරීම.	-	-	-	-	-	12,305,208	-	**12,305,208**
කාලවිඡේදය න1ල උපයෝජනය කිරීම්	-	-	-	-	-	(2,009,900)	-	**(2,009,900)**
කාලවිඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය	-	-	-	-	(130,456,831)	-	-	**(130,456,831)**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,103,065,855**	**80,287,495**	**3,727,428,899**	**530,887,790**	**(653,447,341)**	**23,771,737**	**2,092,346**	**4,814,086,782**

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

1. සංස්ථාපිත තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (SEUSL) ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ඔලුවිල් හි පිහිටා ඇත.

1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ප්‍රධාන වශයෙන් රජයේ අරමුදල් වලින් ක්‍රියාත්මක වන දේශීය විශ්වවිද්‍යාලයක් වන අතර ඉංජිනේරු විද්‍යා, සමාජ විද්‍යා, ව්‍යවහාරික විද්‍යා, ඉස්ලාම් සහ අරාබි භාෂා, වාණිජ හා කළමනාකරණ සහ තාක්ෂණ යන ක්ෂේත්‍ර වල පර්යේෂණ සහ උසස් අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරයි.

2. සකස් කිරීමේ පදනම

2.1. අනුකූලවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට සහ ඉන් පසුව එයට කරන ලද සංශෝධනයන්ට අනුකූල වන පරිදි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒවාට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් පිළියෙල කර ඇත. වාර්ෂික ගිණුම් වාර්තා තුල 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අන්තර්ගත වේ.

2.2. ඇගයීමේ පදනම

වෙනත් අයුරකින් සඳහන් කර නොමැත්තේ නම්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල

ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල වන ශ්‍රී ලංකා රුපියල් (SLR) මගින් මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇති අතර, වෙනත් අයුරකින් සඳහන් කර ඇති අවස්ථාවන්හිදී හැර සියළුම මූල්‍ය අගයන් ආසන්න රුපියලට වටයා අගය කර ඇත.

2.4. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ශයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවන්හිදී සංසන්දනාත්මක අගයන් නැවත සකස් කර ඇත. එසේම, සන්සන්දනාත්මක කටයුතු සඳහා පසුගිය වසරේ අගයන් පෙන්වා ඇත.

2.5. ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී , වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි වාර්තා කරන ලද අගයන් වලට සහ ගිණුම්කරන ප්‍රතිපත්තීන්ට බලපාන පරිදි විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගැනීමට කලමනාකාරීත්වයට සිදු වේ. එබැවින් සත්‍ය ප්‍රතිපලය මෙම ඇස්තමේන්තුගත සහ විනිශ්චිත තත්ත්වයන්ගෙන් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පනයන් අඛණ්ඩ පදනම නිරීක්ෂණය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධනයන් ඉදිරිපත් කල විටකදී එම සංශෝධනය ප්‍රවර්තන සහ අනාගත කාලපරිච්ඡේදයන්ට බලපාන්නේ නම්, සංශෝධිත සහ අනාගත කාලපරිච්ඡේදයන්ට ද, සංශෝධනය එම සංශෝධිත කාලපරිච්ඡේදයට අදාල වන විටකදී එම සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට ද ලෙස හඳුනා ගැනේ.

3. **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

3.1. දේපළ, පිරියත හා උපකරණ

(a) **හඳුනා ගැනීම සහ අගය කිරීම**

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයට වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය එහි මිලදී ගැණුම් හෝ ඉදිකිරීම් පිරිවැය සහ ඊට අදාල ආනුශාංගික වියදම් වලින් සමන්විත වේ.

(b) **පිරිවැය**

දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය යනු ඒවායේ මිලදී ගැණුම් හෝ ඉදිකිරීම් පිරිවැය සහ එය ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කිරීමට සෘජුව දායක වූ පිරිවැයයි.

(c) **ක්ෂය**

වාර්ෂික ක්ෂය සරල මාර්ග ක්‍රමය යටතේ වත්කමේ පිරිවැය එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරාවට ලියා හරිමින් පහත සඳහන් වාර්ෂික ක්ෂය අනුපාතයන්ට අනුව ගණනය කර ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත. වර්ශය තුල මිලදී ගන්නා ලද/ ඉදිකරන ලද/ ඉවත් කරන ලද වත්කම් සමානුපාත පදනම මත ක්ෂය කිරීම සිදු කර ඇත.

ගොඩනැගිගි	5%
ලී බඩු සහ සවිකිරීම්	10%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
මෝටර් රථ	20%
ජල සැපයුම් ජාල	10%
පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
උපාධි ලෝගු	20%
මාර්ග	20%
විදුලි සම්ප්‍රේෂණ ජාල	10%
අස්පෘශ්‍ය වත්කම්	20%
වෙනත්	20%

ඉඩම්

පහත සඳහන් කර ඇති පරිදි විවිධ ප්‍රදේශයන්හි පිහිටි අක්කර 224ක පමණ භූමි ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය සතුව පවතී.

ඔලුවිල්	178.98	අක්කර
සමන්තුරේ	6.72	අක්කර
මල්වත්ත	35.25	අක්කර
වීරමුණේ	3.00	අක්කර
ගල්කිස්ස APC	17.64	පර්චස්

ඉඩම් 2011 වසරේදී සාධාරණ අගය මත ඌව පළාත් සභාවේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇති අතර ගල්කිස්ස අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථානය පිහිටි ඉඩම 2016 වසරේදී තක්සේරු කර ඇත.

(d) **දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය**

විශ්වවිද්‍යාලය සතු ඉඩම් 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කර ගිණුම් පොත් වලට හඳුනාගෙන ඇත.

විශ්වවිද්‍යාලයේ ඉල්ලීම මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ගිණුම් පොත් වල සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති ගොඩනැගිලි නැවත අගය කරන ලද අතර ප්‍රත්‍යාගණිත අගයන් 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ගිණුම් තුල ඇතුලත් කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ඇතිව, දැනටමත් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති හා භාවිතා වෙමින් පවතින ගෘහ භාණ්ඩ හා උපකරණ හා ක්‍රීඩා උපකරණ නැවත තක්සේරු කිරීම සඳහා කණ්ඩායම් තුනක් පත් කරන ලදී. ඒ අනුව 2020 ජූලි 01 දින සිට විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ඇතිව උපකරණ සහ ක්‍රීඩා උපකරණ වල ප්‍රත්‍යාණිත අගයන් ගිණුම් වලට ඇතුළත් කර ඇත.

3.2. බදු

(a) ආදායම් බදු

පවත්නා බදු ප්‍රතිපත්තිය අනුව විශ්වවිද්‍යාලය එහි ශුද්ධ ආදායම මත ආදායම් බදු ගෙවීමේ වගකීමෙන් නිදහස් වේ.

(b) උපයනවිට ගෙවීමේ බදු

ආදායම් බදු වගකීමට යටත් වන සේවකයින්ගේ මාසික වැටුපෙන් අදාල උපයනවිට ගෙවීමේ බදු අඩුකර ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන අතර එය විශ්වවිද්‍යාලයේ වියදමට ඇතුලත් නොවේ. එබැවින් උපයනවිට ගෙවීමේ බදු විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් තුලින් හෙළිදරව් නොවේ.

3.3. තොග

2022 දෙසැම්බර් මස 31 වන දිනට විශ්වවිද්‍යාලය සතු තොග භෞතිකව ගණනය කර පිරිවැයට අගය කර ඇත. තොග වර්තමාන ස්ථානයට ගෙන ඒමට දරණ ලද පිරිවැය මීට ඇතුලත් අතර, FIFO ක්‍රමය මත තොග ගිණුම්ගත කර ඇත.

3.3.1

ශ්‍රී.ල.අ.වි.වි යේ උපකුලපති (ගණන් දීමේ නිලධාරී) විසින් පත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මඟින් 2022.12.31 වන දිනට තොග සත්‍යාපනය සිදු කරන ලදී.

භෞතික ප්‍රමාණයන් සත්‍යාපනය කර අගයන් ගණනය කරන ලදී. ශ්‍රී.ල.අ.වි.වි / ඔලුවිල් පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන ගබඩාවෙහි (නඩත්තු අයිතමයන්ද ඇතුළුව), සමන්තුරේ ව්‍යවහාරික විද්‍යා පීඨ උප ගබඩාවෙහි තොග වල සහතික කල අගයන් සත්‍යාපනය කර අගයන් ගිණුම් පොත් වලට ලබා ගන්නා ලදී.

3.4. වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

වාර්තා කරන දින සිට මාස 12ක් ඇතුලත පියවිය යුතු වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ SLPSAS 01 අනුව ඇස්තමේන්තු කර දක්වා ඇත. බොල් සහ අඩමාණ ණය සඳහා වෙන්කිරීම් සිදු කර නැත.

3.4.1 බැඳුම්කර කඩ කිරීම සහ නොගෙවූ ණය

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ නොපියවූ ණය ශේෂය රු. 29,058.00 ක් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු තනතුරු අතහැර යෑම හේතුවෙන් බැඳුම්කර කඩකිරීමේ වටිනාකමේ එකතුව රු. 1,043,137.22 ක් පවතී.

ඉහත සඳහන් ශේෂයන් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

I. නීග මුදල් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත.
II. නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.5. ස්ථාවර තැන්පතු මත ආයෝජන

ස්ථාවර තැන්පතු මත ආයෝජන වර්තමාන පිරිවැයට (රු.) පෙන්වා ඇත.

3.6. මුදල් සහ මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ යන්නට ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් වල ඇති මුදල් ශේෂ සහ අතැති මුදල් අයත්වේ.

3.7. වගකීම් සහ වෙන්කිරීම්

ශේෂපත්‍ර දිනට හඳුනාගන්නා ලද සියළු වගකීම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇති අතර, වටිනාකම නිවැරැදිව හඳුනාගත නොහැකි නමුත් සත්‍ය වශයෙන්ම පවතින බව හඳුනාගත් වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කර ඇත.
ඉල්ලූවිට ගෙවීමට බැඳී සිටින වගකීම් හෝ ශේෂපත්‍ර දින සිට වසරක් ඇතුලත ගෙවීමට බැඳී සිටින වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂපත්‍රය තුල හඳුනාගෙන ඇත. ශේෂපත්‍ර දිනෙන් වසරකට පසුව ගෙවීමට බැඳී සිටින වගකීම් ජංගම නොවන වගකීම් ලෙස ශේෂපත්‍රය තුල හඳුනාගෙන ඇත.

3.7.1 අසම්භාව්‍ය වගකීම්

2022.12.31 දිනට පවත්නා වූ උසාවි නඩු ලැයිස්තුව පහත දැක්වෙන සටහනෙහි දක්වා ඇත.

නඩු අංකය	අධිකරණ තොරතුරු	නඩු පිළිබඳ තොරතුරු	පුරෝකථනය කල ප්‍රතිඵලය
2879/B/PC/21	MC/AKP	ජනන යන්ත්‍ර ධාවන රථයේ රියදුරු කලා හා සංස්කෘතික පීඨය වෙනින් විදුලි ජනක යන්ත්‍රයට සිදු වූ හානියට වන්දි ඉල්ලා සිටියි.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
DCA/M/1251/19	DC/AKP	ඒ.ආර්.එම්.ඉම්තියාස් මහතා (හිටපු කථිකාචාර්ය – ආධුනික) – බැඳුම්කර වටිනාකම අයකර ගැනීම.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
LT/BT/362/2018	කම්කරු විනිශ්චය සභාව, මඩකලපුව	අලිෆ් මහතා (හිටපු ජෝෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී.ල.අ.වි) – සේවය අවසන් කිරීම අභියෝගයට ලක් කිරීම.	ඔහුගේ වේතනය නැවත ගෙවීමට සිදු විය හැකිය.
LT/44/707/2020	කම්කරු විනිශ්චය සභාව, අම්පාර	සේවා නියුක්තිය අවසන් කිරීම අභියෝගයට ලක් කරමින් දෛනික වැටුප් පදනම මත සේවයේ යොදවා ඇති හිටපු සේවකයෙකු විසින් ගොනු කරන ලදී.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
LT/44/709/2020	කම්කරු විනිශ්චය සභාව, අම්පාර	සේවා නියුක්තිය අවසන් කිරීම අභියෝගයට ලක් කරමින් දෛනික වැටුප් පදනම මත සේවයේ යොදවා ඇති හිටපු සේවකයෙකු විසින් ගොනු කරන ලදී.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
USAB/1028/21	USAB, කොළඹ	එම්.බී. මුර්ෂිඩ් (හිටපු කථිකාචාර්ය - පරිවාස) - සාමාන්‍ය උසස්වීම සහ ස්ථීර කිරීම අභියෝග කිරීම.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
USAB/ Appeal No.1061/2022	USAB, කොළඹ	ආචාර්ය එස්.එම්.එම්. ඉස්මයිල් (හිටපු උපකුලපති) - නැවත සේවයේ පිහිටුවීම අභියෝගයට ලක් කිරීම.	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
CA(W) A No.464/2019	CA, කොළඹ	එම්.එස්.එම්. නජීම් - තනතුර අවසන් කිරීමට එරෙහිව	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය
CA(W) A No.179/2021	USAB, කොළඹ	එම්.ඒ.ජේ.රොසාන් අහමඩ් - භාණ්ඩාගාරය විසින් තාක්ෂණික නිළධාරී (II ශ්‍රේණිය), "B" කොටස පත් කිරීම තාවකාලිකව අත්හිටුවීම අභියෝග කිරීම.	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය
CA(W)A No.405/2021	CA, කොළඹ	එම්.අයි.එම්. ජසීල් - බාහිර විභාග ප්‍රශ්න පත්‍රය සහ සම්මන්ත්‍රණ ගැටළුව	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය
CA(W)A No.149/2022	CA, කොළඹ	ආචාර්ය එම්. ජසීල් (අධ්‍යාපන විද්‍යාලයේ කථිකාචාර්ය) - අධ්‍යාපන පත්වීම් අභියෝගයට ලක් කිරීම. , කලා හා සංස්කෘතික පීඨය	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය
CA(W)A No.261/2022	CA, කොළඹ	ඒ.එල්.එම්. අස්ලාම් මහතා (ADP) – ආර්ථික විද්‍යා පත්වීම් අභියෝගයට ලක් කිරීම, කලා හා සංස්කෘතික පීඨය	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය
CA(W)A No.457/2022	CA, කොළඹ	ඒ.ආර්.එෆ්.එස්. ෆැනූන් මහත්මිය. (හිටපු තාවකාලික නිරූපක) - ICT/FT හි කථිකාචාර්ය (ගැනි) පත් කිරීම අභියෝගයට ලක් කිරීම	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය

SC/FR Application No. 166/2021	ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ	සී.එම්. තවිෆික් - ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම් අභියෝගයට ලක් කිරීම	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය

MC: **මහේස්ත්‍රාත් අධිකරණය**/AKP: **අක්කරේපත්තු**/USAB: **විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය**/CA: **අභියාචනාධිකරණය**/ CA(W)A: අභියාචනාධිකරණ (රිට්) අයඳුම්පත

අනාගතයේදී සිදු විය හැකි දෙයක් වෙනුවෙන් මෙම අවස්ථාවේදී වන්දි ඇස්තමේන්තු කිරීමට නොහැකි බැවින්, ගිණුම්වල ප්‍රතිපාදන කිසිවක් සිදු කර නැත.

3.8. පාරිතෝෂික

පාරිතෝෂික සඳහා වෙන්කිරීම් 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව සිදුකර ඇත. පාරිතෝෂික වගකීම බාහිරව මූල්‍යනය කර හෝ සත්‍ය වශයෙන් අගය කර නොමැති නමුත් ප්‍රතිපාදන වෙන් කර ඇත. පාරිතෝෂික අරමුදල් ගිණුම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති අතර සෑම සේවකයෙකුගේම සේවය ආරම්භ කරන ලද දිනයේ සිට සේවය සම්පූර්ණ කරන ලද සෑම වර්ශයක් සඳහාම මූල්‍ය වර්ශයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් පදනම් කරගෙන පාරිතෝෂිකය සකසා ඇත.

3.9. විශ්වවිද්‍යාල අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල

අදාල තත්ත්වයන් සහ රෙගුලාසීන්ට අනුකූල වෙමින් විශ්වවිද්‍යාල සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ඒ අනුව සේවකයාගේ දල වැටුපෙන් 15%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද, 03%ක් සේවක භාරකාර අරමුදලට ද නියමිත පරිදි ප්‍රේෂණය කෙරේ.

3.10. ප්‍රදාන ගිණුම්ගත කිරීම

විශ්වවිද්‍යාලයේ වියදම් දැරීම සඳහා ලැබෙන ප්‍රදාන අදාල වියදම හඳුනාගන්නා ලද කාලපරිච්ඡේදයේදීම ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලබයි. වත්කම් වල පිරිවැය දැරීම සඳහා විශ්වවිද්‍යාලය වෙත ලද ප්‍රදානයන් අදාල වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනය තුල බෙදා හැරේ

3.11. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළු ප්‍රමාණාත්මක බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් හෝ හෙලිදරවු කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර ඇත.

3.12. ඒකකවල ගිණුම්කරණ තොරතුරු හෙලිදරවු කිරීම

බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (CEDPL)

බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනම අවසන් ගිණුම් පිළියෙල කරන අතරම, එම ගිණුම් විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සමග ඒකාබද්ධ කරනු ලබයි.

පශ්චාත් උපාධි ඒකක (FMC, FAC, FT, FAS, FIA)

පශ්චාත් උපාධි ඒකක (කළමනාකරණ හා වාණිජ පීඨය, කලා හා සංස්කෘතික පීඨය, තාක්ෂණ පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය) සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනම අවසන් ගිණුම් පිළියෙල කරන අතර, එම ගිණුම් විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සමග ඒකාබද්ධ කරනු ලබයි.

<u>විශ්වවිද්‍යාලයේ ඒකකයන්හි ගිණුම් ඒකාබද්ධ කිරීම.</u>

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් (CEDPL) සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් /පශ්චාත් උපාධි ඒකක (FMC, FAC, FT&FAS) වලින් ලැබිය යුතු රු. 14,128,640.31 ක්, සහ බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයට සහ කළමනාකරණ හා වාණිජ පීඨයට ගෙවිය යුතු රු. 5,067,640.00 සහ රු. 10,000,000.00 හිලවු කරන ලදී.

3.13. ආදායම් ප්‍රකාශනය

3.13.1. ආදායම් හඳුනාගැනීම
ආදායම් හඳුනාගනු ලබන්නේ කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් සහිත වීම සහ නිශ්චිතව මැනිය හැනි වීමේ පදනම මතයි.

(a) **ශිෂ්‍යයින්ගෙන් ලැබෙන බඳවා ගැනීමේ ගාස්තු ඒවා ලැබෙන අවස්ථාවේදී ආදායමක් ලෙස හඳුනා ගනී.**
(b) **විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ අනෙකුත් අධ්‍යාපන සහ ක්‍රියාකාරකම් වලට අදාල ගාස්තු අදාල ක්‍රියාකාරකම සම්පූර්ණ වීමත් සමඟ ආදායම ලෙස හඳුනා ගැනේ.**
(c) **ගාස්තු අයකරමින් සිදු කරන පාඨමාලා වලට අදාල ගාස්තු එක් එක් පාඨමාලාව සම්පූර්ණ වන අදියරේ වසර අවසානයේදී ආදායම් ප්‍රකාශනයට හඳුනා ගැනේ. ඉදිරි කාලපරිච්ඡේදය සඳහා ලද දේශන ගාස්තු සහ ගෙවීම් ශේෂ පත්‍රය තුල සංචිත සහ සීමා කරන ලද අරමුදල් යටතේ පෙන්වනු ලබයි.**
(d) **පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.**
(e) **ප්‍රදාන මඟින් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ දායකත්වය පාලනයේ හෝ දායකත්වය ලැබීමට හිමිකම තහවුරු වූ පසුවය.**
(f) **අනුග්‍රාහකත්වයට අදාල ක්‍රියාකාරකම් ආදායම ලද විගස හඳුනා ගැනේ.**
(g) **අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.**

3.13.2. **වියදම් හඳුනාගැනීම**

නිශ්චිත අයිතමයකට අදාලව ආදායම ඉපයීම සහ එහි දරණ ලද වියදම අතර ඇති ඍජු සම්බන්ධතාවය මත ආදායම් ප්‍රකාශනය තුල වියදම් හඳුනා ගනී. විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාමට දරන ලද සියළු වියදම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමට දරන ලද වියදම් වසරේ අතිරික්තය/ ඌණතාවය ගණනය කිරීමේදී ආදායමට එරෙහිව කපා හැරේ. විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ අනෙකුත් අධ්‍යාපන සහ ක්‍රියාකාරකම් වලට අදාල වියදම් අදාල ක්‍රියාකාරකම අවසන් වීමත් සමඟ ආදායම් ප්‍රකාශනයට හඳුනා ගැනේ.

3.14. **වාර්තා කරන දිනට පසු සිදුවීම්**

ශේෂපත්‍ර දිනට පසුව සිදුවන සිදුවීම් ඒවායේ ප්‍රමාණාත්මකභාවය මත සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල ගැලපීම් ගිණුම් තුල සිදු කරනු ලබයි

සටහන **01** - දේපළ, පිරියත, උපකරණ හා මානව සම්පත් සංවර්ධනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022.01.01 දිනට පිරිවැය	මුළු එකතු කිරීම්	2022.12.31 දිනට පිරිවැය	2021.12.31 දිනට සමුච්චිත ක්ෂය	2022 වර්ශය සඳහා ක්ෂය	2022.12.31 දිනට සමුච්චිත ක්ෂය	2022.12.31 දිනට ශුද්ධ අගය
ඉඩම්	1.01	450,330,000	-	450,330,000	-	-	-	450,330,000
ගොඩනැගිලි	1.02	5,601,354,610	26,026,358	5,627,380,968	1,742,426,059	258,229,963	2,000,656,022	3,626,724,946
ලී බඩු	1.03	527,838,747	42,676,126	570,514,873	288,725,899	47,201,068	335,934,714	234,580,159
උපකරණ	1.04	1,630,711,672	165,412,315	1,796,123,987	1,250,924,148	184,506,562	1,439,600,638	356,523,349
පොත් සහ වාර සඟරා		201,368,432	3,489,248	204,857,679	189,612,341	7,696,933	197,309,274	7,548,405
වාහන	1.05	114,363,388	-	114,363,388	112,818,874	1,522,075	114,340,949	22,439
මෘදුකාංග	1.06	6,588,505	1,577,000	8,165,505	3,800,904	1,361,771	5,162,674	3,002,831
මාර්ග	1.07	209,727,402	-	209,727,402	182,404,022	11,941,501	194,345,524	15,381,879
දුරකථන සහ ජාල	1.08	47,672,367	-	47,672,367	47,672,367	-	47,672,367	-
විදුලි සම්ප්‍රේෂණ ජාල	1.09	50,396,903	-	50,369,903	27,729,953	4,561,617	32,291,570	18,078,333
ජල සැපයුම් ජාල	1.10	13,882,615	-	13,882,615	9,980,655	1,388,262	11,368,917	2,513,698
උපාධි ලෝගු	1.11	3,690,803	1,305,000	4,995,803	3,690,803	714	3,691,517	1,304,286
අධ්‍යයන ප්‍රකාශන/ජාත්‍යන්තර සම්මන්ත්‍රණ		19,862,888	2,113,210	21,976,098	15,703,035	2,075,263	17,778,298	4,197,800
අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිපුණතා සංවර්ධනය		31,308,339	7,568,996	38,877,336	22,234,211	3,616,756	25,850,967	13,026,369
තත්ත්ව සහතික හා පිළිගැනීම්		11,704,167	945,500	12,649,667	6,305,728	2,341,352	8,647,080	4,002,587
පර්යේෂණ හා අධ්‍යයන සංවර්ධන		4,128,315	2,106,329	6,234,644	284,000	997,962	1,281,962	4,952,682
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට සහභාගී වීම්		291,962	-	291,962	91,249	58,392	149,641	142,321
අවසන් වසර ව්‍යාපෘති		76,808	-	76,808	38,404	15,362	53,766	23,042
එකතුව		**8,925,270,923**	**253,220,082**	**9,178,491,005**	**3,904,442,651**	**527,515,552**	**4,436,135,878**	**4,742,355,126**

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022 රු.	2021 රු.
සටහන 02 - කෙරීගෙන යන වැඩ			
අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සේවක නිල නිවාස		237,432,582	160,973,272
තාක්ෂණ පීඨයේ කෘෂි තාක්ෂණ උද්‍යානය සඳහා යටිතල පහසුකම් සැපයීම		57,482,642	41,577,093
ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව විද්‍යාගාර පහසුකම්		-	3,365,344
ප්‍රධාන පිවිසුම සඳහා ආලෝකය සැපයීම		807,939	-
භූ දර්ශන දෙපාර්තමේන්තුවට නාන කාමර සහ වැසිකිළි පහසුකම් සැපයීම.		1,400,203	-
		297,123,366	**205,915,709**
සටහන 03 - ඔලප්‍ය වත්කම්			
ස්ථාවර තැන්පතු	3.01	57,944,923	27,098,555
		57,944,923	**27,098,555**
සටහන 04 - භාණ්ඩ/තොග			
ගබඩා අත්තිකාරම් ගිණුම - සැපයුම්	4.01	10,443,943	5,593,352
ගබඩා අත්තිකාරම් ගිණුම - නඩත්තු	4.02	3,128,173	2,375,259
		13,572,115	**7,968,611**
සටහන 05 – ලැබිය යුතු ගිණුම්			
ආරක්ෂක තැන්පතු	5.01	5,227,429	5,227,429
ආපදා ණය	5.02	27,610,649	25,458,742
සේවක ණය	5.03	96,560	99,620
වාහන ණය	5.04	122,000	62,000
පරිගණක ණය	5.05	335,800	444,400
යතුරුපැදි ණය	5.06	249,053	344,852
උත්සව අත්තිකාරම්	5.07	297,082	420,830
වැටුප් අත්තිකාරම්	5.08	-	32,159
විශේෂ අත්තිකාරම්	5.09	-	4,800
බැඳුම්කර කඩකිරීම්	5.10	15,547,369	18,337,779
විවිධ අත්තිකාරම්	5.11	140,535	90,900
තැපැල් ෆ්‍රෑන්කිං යන්ත්‍ර අත්තිකාරම්		71,740	270
පර්යේෂණ අත්තිකාරම්	5.12	-	207,492
ශ්‍රී.අ.වි.වි.ට ගෙවිය යුතු	5.13	52,142,941	19,983,617
CEDPL මඟින් ලැබිය යුතු		11,527,145	27,576,589
ලැබිය යුතු වැටුප්	5.14	2,450,637	2,927,789
MA සහ MBA පශ්චාත් උපාධි ඒකක වලින් ලැබිය යුතු		2,347,472	8,729172
තාක්ෂණ පීඨ පශ්චාත් උපාධි ඒකකයෙන් ලැබිය යුතු		96,932	33,570
සැපයුම් අත්තිකාරම් (මිලදී ගැනුම්)		88,777	25,000
PGU- FIA මඟින් ලැබිය යුතු		34,869	16,445
PGU-FASc මඟින් ලැබිය යුතු		122,222	70,953
අන්තර් ඒකක ගනුදෙනු හිලව් කිරීම්		(14,128,640)	(36,426,730)
		104,380,572	**73,667,679**

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022 රු.	2021 රු.
සටහන 06 – ස්ථාවර තැන්පතු ස්වයං මූල්‍ය පාඨමාලා			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		178,677,074	161,536,609
SFA/පශ්චාත් උපාධි ඒකකය - FMC		1,766,250	5,668,897
SFA/ පශ්චාත් උපාධි ඒකකය – FAC		86,635	142,569
		180,529,960	**167,348,075**
සටහන 07- ලැබිය යුතු පොළී			
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය		1,309,998	242,759
බාහිර උපාධි හා වෘත්තීය මධ්‍යස්ථානය		2,186,959	751,067
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FMC		47,487	63,505
SFA/ පශ්චාත් උපාධි ඒකකය -FAC		2,329	1,597
		3,546,774	**1,058,929**
සටහන 08 – මුදල් සහ මුදල් සමාන දෑ			
මහජන බැංකුව - 228 1001 7000 1696		7,293,122	10,233,836.14
මහජන බැංකුව - 228 1001 7000 1700		140,121	34,665,004.15
මහජන බැංකුව - 228 1001 9000 1704		30,314,144	7,826,004.46
මහජන බැංකුව - 228 1001 0000 1708		1,276,144	211,772.55
මහජන බැංකුව - 228 1001 5000 1715		9,112,266	17,351,343.56
මහජන බැංකුව - 064 1001 7000 0025		289,539	1,080,065.25
මහජන බැංකුව - 064 1001 6000 0950		289,433	367,973.20
මහජන බැංකුව - 228 10014004 2429		-	28,937,824.04
මහජන බැංකුව - 228 1001 6000 1692 (CEDPL)		22,452,755	16,300.00
මහජන බැංකුව - 228 1001 2003 2544 (FMC)		7,748,990	14,346,141.99
මහජන බැංකුව - 228 1001 5004 0340 (FAC)		6,589,954	2,368,721.08
මහජන බැංකුව - 228 1001 6005 2714 (FT)		1,579,690	689,475.00
මහජන බැංකුව – 064 1012 4004 6778 (FAS)		194,937	-
මහජන බැංකුව – 064 1001 4005 4083 (FIA)		1,144,200	
		88,425,295	**223,626,405**
සටහන 09 - සීමාකාරී අරමුදල්			
අනුස්මරණ ත්‍යාග	9.01	348,000	348,000
කෙටිකාලීන ICIT පාඨමාලාව		434,454	434,454
විදෙස් සිසුන් සඳහා ශිෂ්‍යත්ව		564,600	684,600
UNDP ප්‍රදාන		165,078	165,078
පර්යේෂණ ප්‍රදාන		12,323,452	12,830,200
ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය		598,155	598,155

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022 Rs	2021 Rs
සටහන 09 - සීමාකාරී අරමුදල්			
ව්.ව්.ප්‍ර.කොං. විසින් පවත්වන ලද සිසුන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන		600,000	600,000
අවසාදිත සමීක්ෂණය සහ භූ රූප සමීක්ෂණය		863,539	863,539
NCAS ප්‍රදාන – උසස් අධ්‍යාපන		-	1,424,826
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල		28,808,341	21,622,731
උපකුලපති අරමුදල		6,290,872	8,840,815
පීඨ සංවර්ධන අරමුදල- FAC		8,149,753	7,160,203
පීඨ සංවර්ධන අරමුදල- FMC		5,027,950	4,196,116
පීඨ සංවර්ධන අරමුදල- FE		105,915	105,915
පීඨ සංවර්ධන අරමුදල- FASc		59,049	9,049
පීඨ සංවර්ධන අරමුදල– FT		44,360	2,660
පීඨ සංවර්ධන අරමුදල – FIA		12,287	-
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල – FAC		8,275,385	7,302,885
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල – FMC		7,599,333	7,214,035
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල – FT		2,460	1,860
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල – FIA		14,514	-
		80,287,495	**74,405,122**
සටහන 10 - ප්‍රාග්ධන ප්‍රදාන			1,509,829,170
වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	10.01	1,364,541,370	94,798,402
ප්‍රාග්ධන දායකත්වය – MRR	10.02	90,161,460	72,507,285
වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන – IRQUE	10.03	65,414,084	1,870,583,456
ප්‍රාග්ධන දායකත්වය – Kuwaith fund	10.04	1,779,086,269	1,091,411,894
ප්‍රාග්ධන දායකත්වය – MOHE	10.05	1,038,026,884	125,318,542
ප්‍රාග්ධන ප්‍රදාන - වැය නොකල		66,909,465	296,568,555
පරිත්‍යාග	10.06	426,355,224	
		4,830,494,755	**5,061,017,304**
සටහන 11– සංචිත			
සමුච්චිත අරමුදල්		(522,032,127)	(502,486,976)
ක්‍රමක්ෂය ශුද්ධ වටිනාකම සහ ක්ෂය (පෙර වර්ෂ ගැලපීම්)		-	(20,857,988)
කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌණතාවය		(130,456,831)	4,996,801
විලම්භීත ආදායමට මාරු කිරීම		-	(3,683,965)
පෙර වර්ෂ ගැලපීම්		(958,382)	
		(653,447,341)	**(522,032,127)**
සටහන 12- ප්‍රත්‍යාගණන සංචිත			
ප්‍රත්‍යාගණන සංචිත	12.01	530,887,790	530,887,790
		530,887,790	**530,887,790**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022 රු.	2021 රු.
සටහන 13 - ස්වයං මූල්‍යකරණ පාඨමාලා අරමුදල්			
CEDPL සංවර්ධන අරමුදල		21,876,867	11,601,767
SFA/PGU සංවර්ධන අරමුදල -FMC		1,691,250	1,766,250
SFA/PGU සංවර්ධන අරමුදල -FAC		139,135	86,635
SFA/PGU සංවර්ධන අරමුදල -FT		3,530	2,730
SFA/PGU සංවර්ධන අරමුදල -FAS		46,825	19,047
SFA/PGU සංවර්ධන අරමුදල -FIA		14,130	-
		23,771,737	**13,476,429**
සටහන 14 - පාරිතෝෂික			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	14.01	468,403,721	425,897,567
		468,403,721	**425,897,567**
සටහන 15 – ගෙවිය යුතු ගිණුම්			
ආපසු ගෙවිය යුතු තැන්පතු -විද්‍යාගාර	15.01	657,800	657,800
ආපසු ගෙවිය යුතු තැන්පතු -පුස්තකාල	15.02	163,400	163,400
ආපසු ගෙවිය යුතු තැන්පතු - නේවාසිකාගාර	15.03	4,806,100	3,331,600
ආපසු ගෙවිය යුතු තැන්පතු - කොන්ත්‍රාත්කරුවන්	15.04	56,000	425,000
ආපසු ගෙවිය යුතු තැන්පතු - සැපයුම්කරුවන්	15.05	562,000	390,000
රැඳවුම් මුදල් - කොන්ත්‍රාත්කරුවන්	15.06	14,180,993	13,484,431
රැඳවුම් මුදල් - සැපයුම්කරුවන්	15.07	6,977,372	6,061,723
ශ්‍රී.අ.වි.වි. විසින් ගෙවිය යුතු	15.08	56,268,839	21,651,245
කලින් ලැබීම් - ස්වයං මූල්‍යකරණ පාඨමාලා		91,482,275	81,746,050
ගෙවිය යුතු - ස්වයං මූල්‍යකරණ පාඨමාලා		1,291,155	265,848
අන්තර් ඒකක ගනුදෙනු හිලවු කිරීම්		(15,067,640)	(13,000,000)
		161,381,293	**115,177,097**
සටහන 16 - වෙනත් ආදායම්			
ලියාපදිංචි ගාස්තු		4,558,080	2,497,750
විභාග ගාස්තු		264,950	410,700
පොළී		7,750,077	2,533,518
කුලී		5,472,341	2,756,942
විකුණුම්		2,294,561	1,988,198
දඩ		1,410,156	147,484
විවිධ ආදායම්		18,298,755	11,885,589
		40,048,920	**22,220,181**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2022 රු.	2021 රු.
සටහන **17- ස්වයං මූල්‍යකරණ පාඨමාලා ආදායම්**			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		35,235,075	35,599,772
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FMC		10,618,495	6,852,221
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FAC		3,255,528	2,269,565
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FT		471,500	10,000
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FAS		516,750	446,020
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FIA		389,555	16,445
		50,486,904	**45,194,023**
සටහන **18 -** ස්වයං මූල්‍යකරණ පාඨමාලා වියදම්			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		29,803,496	14,264,203
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FMC		8,277,164	6,696,257
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FAC		3,231,178	1,840,333
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FT		459,983	9,286
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FAS		498,032	445,445
SFA/ පශ්චාත් උපාධි ඒකකය - FIA		378,139	16,445
		42,647,992	**23,271,969**

7.8 විගණකාධිපති වාර්තාව

EPCG/AM/D/SEUSL/FA/01/22/01 2023 ජූලි මස 31

උප කුලපති,
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

-

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශණය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණය, මාගේ විධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව , 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 1978 විශ්වවිද්‍යාල පනත් අංක 16 හි 107(5) පරිච්ඡේදය මත මාගේ අදහස් හා නිර්දේශයන් විශ්වවිද්‍යාල පනතේ 108(1) පරිච්ඡේදය අනුව වාර්ෂික වාර්තාව මඟින් ප්‍රකාශයට පත්කළ යුතු බව මාගේ අදහසයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මාගේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීමට නියමිතය.

මාගේ විගණන මතය අනුව තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා හේතු වන කරුණුකාරණා විස්තර කර ඇති පරිච්ඡේදයට පරිබාහිරව, අනෙකුත් මුල්‍ය ප්‍රකාශණ සත්‍ය හා සාධාරණ ලෙස 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට මුල්‍ය තත්ත්වය පෙන්නුම් කරන අතර එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව අවසන් වර්ෂය සඳහා පෙන්නුම් කෙරේ.

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පරිච්ඡේද 65 ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර ඇති සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට ලක් වූ අයිතමයන් නැවත අගය කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොමැත. 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පිරිවැය රු.2,081,685,748 දේපළ පිරියත හා උපකරණ තවදුරටත් භාවිතයට ගනු ලබන අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙම ඇස්තමේන්තු ගත දෝෂය නිවැරදි කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොමැත.

(b) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 හි පරිච්ඡේද 47 ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ සෑම වසර 03කට හෝ 05කට වතාවක් නැවත අගය කල යුතු වේ. කෙසේ වුවද, විශ්වවිද්‍යාලය සතු ඉඩම් 05ක් 2011 වසරෙන් පසු නැවත අගය කිරීමට කටයුතු කර නොමැත. .

(c) 2022 මැයි මස 02 වන දින විශ්වවිද්‍යාලය වෙත වැඩ නිමකොට භාරදෙනු ලැබූ රු. 1,400,203 වටිනාකමකින් යුත් ගොඩනැගිල්ල, දේපළ පිරියත හා උපකරණ ලෙස ප්‍රාග්ධනිත නොකර ඒ වෙනුවට කෙරී-ගෙන-යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශණ තුල හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මා විසින් විගණන කටයුතු සිදු කරනු ලැබීය. මූල්‍ය කටයුතු වෙනුවෙන් ප්‍රමිතීන් ප්‍රකාරව මාගේ විගණන වගකීම, මාගේ වාර්තාවේ විගණකාධිපතිගේ යන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇත. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත යන බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයෙහි 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් අනෙකුත් තොරතුරු.

2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවෙ හි සඳහන් තොරතුරු අනෙකුත් තොරතුරු තුල අන්තර් ගත කොට ඇත. එහෙත් එහි, විගණන වාර්තාවට ප්‍රථම මා විසින් ලබා ගත් ගිණුම් වාර්තා සහ මාගේ විගණන මතය සහිත වාර්තාවන් ඉදිරිපත් කර නොමැත. කළමණාකරණය විසින් අනෙකුත් තොරතුරු සම්බන්ධව වගකීම දැරිය යුතු වේ.

ගිණුම් වාර්තා පිළිබඳ ව වන මාගේ විගණන මතය තුලින් අනෙකුත් තොරතුරු සම්බන්ධ මතයන් ආවරණය නොවන අතර ඒ සම්බන්දව කිසිදු ප්‍රකාශිත සහතිකයක් ලබා දෙනු නොලැබේ.

ගිණුම් වාර්තා සමඟ මාගේ විගණනයන් පිළිබඳව මාගේ වගකීම වනුයේ, ඉහත හඳුනා ගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ සිදු කිරීමේ දී මාගේ විගණන කටයුතු සම්බන්ධව ලබා ගත් දැනුම මත අනෙකුත් තොරතුරු ගිණුම් ප්‍රකාශණ සමඟ ප්‍රමාණාත්මක නොවන විට දී හෝ නොඑසේ නම් ප්‍රමාණාත්මක ලෙස වැරදි අයුරින් ප්‍රකාශ කර ඇත්නම් පමණි.

2022 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා පරිශීලනය කිරීමේ දී, මා විසින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණ පිලිබඳ සඳහනක් තබන්නෙ නම්, ඒ සම්බන්ධයෙන් රාජ්‍යය පාලන අධිකාරිය වෙත එය නිවැරදි කිරීම සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දැක්විය යුතුය. තවදුරටත් එහි නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශණ පවතින්නෙ නම් එම කරුණු මා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මාගේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීමට නියමිතය.

1.4 මූල්‍ය ප්‍රකාශණ සඳහා කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත්වන අයුරින්, මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරීම කළමණාකරණයේ වගකීම් වන අතර, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ද කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම්, හෙළි දරව් කිරීම්, උචිත තත්ත්වයන්, අඛණ්ඩ පැවැත්ම සඳහා බලපාන තත්ත්වයන් සහ ගිණුම්කරණ කටයුතු අඛණ්ඩ පැවැත්ම මත පදනම් ව සිදුකිරීම ආදිය තහවුරු කර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. එනම්, කළමණාකරනයේ අභිමතය විශ්වවිද්‍යාලයේ කටයුතු ඈවර කිරීම හෝ විශ්වවිද්‍යාල කටයුතු නවතාලීම නොවන්නේ නම්, මීට පරිබාහිරව කිසිදු තාත්වික විකල්පයක් නොමැති අතර එය එලෙස සිදු කළ යුතු වේ. මූල්‍ය ප්‍රකාශණ වාර්තාකරණය පිළිබඳ ව රාජ්‍යය පාලන අධිකාරිය වගකීමට යටත් වේ.

විශ්වවිද්‍යාලයෙහි මූල්‍ය වාර්තා ක්‍රියාවලිය අධීක්ෂණය සම්බන්ධයෙන් රාජ්‍යය පාලන අධිකාරිය වගකීමට බැඳී ඇත.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳව නිසියාකාරව වාර්තාවන් පොත් තැබීම සිදුකළ යුතු අතර මෙමඟින් විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා ආවර්තිත මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සඳහා උපකාරී වේ.

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්, එනම් වැරදි හා වංචාවලින් තොර ද යන්න මත විගණන මතයන් විගණන වාර්තාව තුලින් එළි දැක්වීම හා එමඟින් සාධාරණ සහතික වීමක් ලබාදීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් යන්න ඉතා උසස් සහතික වීමක් වන නමුත්, එමඟින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන් පවතින සෑම විටම විගණනයන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව සිදු කල ද, එම සාවද්‍ය ප්‍රකාශණ අනාවරණය කර ඇති බව සහතික නොකෙරේ. සාවද්‍ය ප්‍රකාශයන් වැරදි හා වංචා මත පැන නැගිය හැකිවන අතර, ඒවා ප්‍රමාණාත්මක ද යන්න තීරණය වනුයේ, පෞද්ගලික හෝ සමස්තයක් වශයෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පරිහරණය තුලින්, මූල්‍ය ප්‍රකාශන භාවිතයට ගනු ලබන්නන් විසින් ඔවුන්ගේ ආර්ථික තීරණයන් කෙරෙහි මෙමඟින් බලපෑම් කර ඇති තත්ත්වයන් තුලය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව, මාගේ විගණනය, වෘත්තීය විනිශ්චයභාවයක් සහ වෘත්තීය සංදේහවාදයකින් යුක්තව ක්‍රියාත්මක කිරිමට කටයුතු කෙරුණි. මා විසින් තව ද:

- වැරදි හා වංචා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයන් හී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පැවතීමේ අවදානම හඳුනා ගැනිම සහ තක්සේරු කිරිම සිදු කරන අතර එමඟින් විගණන සැලැස්ම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මේ සඳහා මාගේ විගණන මතය ඉදිරිපත් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කෙරේ. වංචා හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, වැරදි හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, අනාවරණය නොවීමට වඩා අනාවරණය නොවීමේ අවදානම වැඩිය. මන්ද කුමන්ත්‍රනයන්, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා අත් හැරීම, වරදවා විස්තර කිරීම, අභ්‍යන්තර පාලනයන් ප්‍රතික්ෂේප කිරීම ආදිය වංචාවන් මඟින් සිදුවේ.
- අවස්ථාවන් වෙනුවෙන් සිදුකරන විගණනයන් උචිත ව සිදුකිරීම සඳහා වන විගණන සැලැස්ම නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් පිළිබඳව අවධානය යොමු කිරීම. එහෙත් මෙමඟින් විශ්වවිද්‍යාලයේ

අභ්‍යන්තර පාලනයන්ගේ කාර්යසාධනය පිළිබිඹු කරන මතයන් ඉදිරිපත් කිරීම අරමුණු නොකෙරේ.

- කළමනාකරණය විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හී උචිත බව, ගිණුම්කරණ ඇස්තමේන්තුන් හී සාධාරණ බව හා අදාල හෙළිදරව් කිරීම් පිළිබඳව ඇගයීමට ලක් කිරීම.

- විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගෙන යාම උදෙසා බලපෑම් කරනු ලබන සිදුවීම් හා තත්ත්වයන් මඟින් ප්‍රමාණාත්මක අවදානමක් ඇතිවන්නේ ද යන්න, ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම හා ලබා ගත් විගණන සාක්ෂි මත මෙන්ම කළමනාකරණයේ භාවිතයේ උචිත බව මත තීරණය කිරීම. මා විසින් ප්‍රමාණාත්මක අවධානමක් පවතින්නේ යැයි හඳුනා ගත් විට හා එය මාගේ විගණන මතය වෙනස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශණ මත පදනම් ව විගණන වාර්තාවේ හෙළි දරව් කිරීම සඳහා මා විසින් අවධානය යොමු කළ යුතු වේ. විගණන වාර්තාව නිකුත් කරනු ලබන දින දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත මාගේ නිගමනය ලබා දී ඇත. කෙසේ වුව ද, අනාගතයේ සිදුවන සිදුවීම් හා තත්ත්වයන් මඟින් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන්නට බලපෑම් එල්ල වීමේ හැකියාවක් පවතී.

- මූල්‍ය ප්‍රකාශණයන් ඉදිරිපත් කිරීම සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් අපක්ෂපාති ලෙස ඉදිරිපත් කර ඇත් ද යන්න සහ මූල්‍ය ප්‍රකාශණයන් හී මුළු ඉදිරිපත් කිරීම, අන්තර්ගතය, සැකැස්ම, හෙළි දරව් කිරීම ආදිය ඇගයීමට ලක් කිරීම.

මාගේ විගණනය සිදු කල කාල පරාසය තුල, සුවිශේෂී විගණන හඳුනා ගැනීම, අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතා හා අනෙකුත් ගැටලු කළමණාකරනය සමඟ සන්නිවේදනය කරනු ලැබීය.

2. අනෙකුත් නීතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1 පහත අවශ්‍යතාවයන් සඳහා වන නියත විධිවිධාන 2018 අංක 19 දරණ විගණන පනතේ ඇතුළත් වේ.

2.1.1 තත්ත්වාගණනය කළ විගණන මතයට පරිබාහිරව අනෙකුත් කරුණු සඳහා බලපාන තත්ත්වයන් විස්තර කර ඇති පරිච්ඡේදයේ, මාගේ පරීක්ෂණය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කර ගැනීම් මා විසින් ලබාගත් අතරම, 2018 අංක

19 දරණ ජාතික විගණන පනතේ 12(a) පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් උචිත ගිණුම්කරණ වර්තාවන් පවත්වාගෙන යනු ලැබේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iii) වන පරිච්ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශණයන් පෙර වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iv) වන පරිච්ඡේදය ප්‍රකාරව, සහ මාගේ වාර්තාවෙහි තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා වන පදනම වන පරිච්ඡේදයේ 1.2 (a) හා (b) කොටස හැර මා විසින් පෙර වර්ෂය සඳහා නිර්දේශ කළ නිර්දේශනයන් සහිතව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත.

2.2 ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් කෙරෙහි අනුගමනය කළ ක්‍රියාපටිපාටි සහ ලබා ගත් සාක්ෂි ප්‍රමාණවත් නොවුන බැවින් කිසිවක් මාගේ අවධාණයට පාත්‍ර නොවීය;

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (d) ප්‍රකාරව සිදුකරන ලද ක්‍රියාකාරකම්වලට පරිබාහිරව විශ්වවිද්‍යාලය විසින් එළඹෙන්නා වූ ගිවිසුම් පිළිබඳව, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජිකයකුගේ සෘජු හෝ වක්‍රව ඒ පිළිබඳව උනන්දුවක් දැක්වීම පිළිබඳව කරුණු ගෙන හැර දැක්වීම;

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (f) ඡේදයට අමතරව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අදාල ලිඛිත නීතීන්, සාමාන්‍ය හා විශේෂ උපදේශනයන් සම්බන්ධයෙන් කටයුතු නොකර ඇති තත්ත්වයන් ගෙන හැර දැක්වීම;

නිතිරීති/ නියමයන්වලට අදාල යොමුව	**සටහන**
(a) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි (FR)	
(i) මූල්‍ය රෙගුලාසි 103(1)	විශ්වවිද්‍යාලයෙහි අංශ 18කට අදාල අයිතම 80ක් අස්ථාන ගත වී ඇති ලෙස 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි සඳහන් වේ. කෙසේ වුව ද, මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
(ii) මූල්‍ය රෙගුලාසි 571	මූල්‍ය වටිනාකම රු.18,403,762, වන රඳවා ගත් තැන්පතූන් සහ, ආපසු

	ගෙවිය හැකි තැන්පතූන් ලෙස ලබා ගත් රු.329,000 වටිනාකමකින් යුත් තැන්පතූන් වසර 03 සිට වසර 10ක කාල සීමාවක් දක්වා පියවා එම පිරිස් වෙත ලබා දීමට හෝ විශ්ව විද්‍යාලය ලද ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොමැත.
(b) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය (Establishments Code) ----------	
ආයතන සංග්‍රහයහි අනු කොටස් 5.4 හි XIX පරිච්ඡේදය	2014 වසරෙහි සිට 2022 වසර දක්වා විශ්වවිද්‍යාලයේහි නේවාසික පහසුකම් භාවිතා කරනු ලබන අධ්‍යයන නිළධාරීන් 37ක් සහ පරිපාලන නිළධාරීන් 3 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 20,130,410 මුදලක් අයකරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැත.
(c) උසස් අධ්‍යාපන ආයතනයන් හී හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ආයතන සංග්‍රහයේ අනු කොටස් 3(1)හි XX පරිච්ඡේදය සහ 2017 ජූලි 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛ අංක 10/2017.	මෙම වසර සලකා බැලීමේ දී, අධ්‍යයන නිළධාරීන් මෙන්ම පුස්තකාල කාර්යය මණ්ඩලයෙහි පැමිණීමෙහි සහ පිටවීමෙහි වෙලාවන් තහවුරු කර නොගනිමින් රු.716,558,562 ප්‍රමාණයක් වැටුප් සහ දීමනා ලෙස ගෙවා ඇත.
(d) 2022 අප්‍රේල් මස 26 වන දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛණ අනු කොටස් 03(X) හි 03/2022 චක්‍රලේඛය (2022 අප්‍රේල් මස 26 වන දින නිකුත් කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා මුල්‍ය චක්‍රලේඛ 04/2022)	මෙම චක්‍රලේඛණ ප්‍රතිපාදන ප්‍රකාරව අත් හිටවනු ලැබූ ණය පහසුකම්, මාණ්ඩලික ශ්‍රේණියෙහි නිළධාරීන් 12 දෙනෙකුට රු. 2,556,943ක මුදලක් වැය කරමින් ලබා දීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර ඇත.

(e) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛණ --

2022 පෙබරවාරි මස 23 වන දින නිකුත් කරන ලද මූල්‍ය චක්‍රලේඛණ 03/2022.	2022 වර්ෂය සඳහා රාජ්‍යය විශ්වවිද්‍යාල උප කුලපතිවරුන්ට අදාල මාසික ඉන්ධන පරිභෝජනය ලීටර 145 ක් දක්වා සීමා කර ඇත. කෙසේ නමුදු, විශ්වවිද්‍යාලය විසින් අනුමත ලීටර ප්‍රමාණය ඉක්මවා රු.579,687 පිරිවැය වූ ඉන්ධන ලීටර 1,942 ප්‍රමාණයක් මෙම වසරෙහි ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා පරිභෝජනය කර ඇත.
(f) 2022 අප්‍රේල් මස 26 වන දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛණ 03/2022	මුදල් අමාත්‍යාංශයේ විශේෂ අනුමැතියක් ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන කාර්යයමණ්ඩල නිලධාරීන් 18 දෙනෙකු බඳවා ගෙන ඇති අතර ඒ සඳහා රු. 2,270,995ක මුදලක් ගෙවීම් සිදුකර ඇත.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (g) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කාර්යයන් සහ සිදු කළයුතු කර්තවයන් සිදු කිරීමට අපොහොසත් වී ඇති බව පෙන්නුම් කළ යුතුය.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (h) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි සම්පත් ප්‍රසම්පාදනය සහ භාවිතා කිරීමේ දී ඒවා ආර්ථිකමය, කාර්යක්ෂමතාවයක් සහ සඵලදායකත්වයකින් යුක්තව අදාල කාලසීමාව තුල දී අදාල නිතීමය තත්ත්වයන් තුල කටයුතු නොකිරීම දක්නට ලැබේ.

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a) බාහිර විභාග පාඨමාලාවන්හී වන ශිෂ්‍යය අත්පොත ප්‍රකාරව, කලා උපාධීන්, ව්‍යාපාර පරිපාලනවේදී උපාධීන් හා වාණිජවේදී උපාධීන් නිම කිරීම සඳහා වන

අවම කාලය ලෙස දැක්වෙනුයේ අධ්‍යයන වසර තුනකිණි. කෙසේ වුවද, ඉහත උපාධීන් නිම කිරීම සඳහා අවම වශයෙන් වසර පහක සිට වසර අටක පමණ කාල සීමාවක් ගොස් ඇත. එලෙස උපාධීන් අවසන් කිරීමට ප්‍රමාද වීම නිසා ශිෂ්‍යයන් හට රැකියාවන් සහ රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ දී එය අවාසිදායක ලෙස බලපෑම් ඇති කරනු ලැබේ.

(b) 2017 සිට 2022 වර්ෂ සඳහා, පර්යේෂණ ප්‍රදානයන් ලෙස රු. 15,307,313 මුදලක් අධ්‍යයන නිලධාරීන් තිස් හය දෙනෙකු සඳහා ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, 2023 මැයි 31 වන දින වන විට දී නිලධාරීන් 36 දෙනෙකුගෙන්, නිලධාරීන් 18 දෙනෙකු විසින් මෙම පර්යේෂණයන් නිම කොට නොතිබුණි.

(c) කොන්ත්‍රාත් පිරිවැය රු.138,444,958 (එකතු කළ අගය මත බදු රහිතව) වන මල්වත්ත කෘෂි තාක්ෂණික උද්‍යානයෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කොන්ත්‍රාතුව (වැඩ ඒකක 19 සහිතව) 2021 මාර්තු 29 වන දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර ඇති අතර එය ගිවිසුම් ප්‍රකාරව 2022 ජූනි මස 28 වන දින වන විට නිම කල යුතුව තිබුණි. එහෙත්, 2023 මැයි මස 31 දින වන විට ප්‍රගතිය 45% වන අතර පිරිවැය රු. 39,390,993 වන වැඩ ඒකක 05ක් ආරම්භ කිරීමටවත් කටයුතු කර නොමැත.

(d) 2017 වසරේ සහ 2019 වසරේ දී පිරිවැය රු 87,186,796 දරමින් මිල දී ගෙන තිබූ රසායනාගාර උපකරණ වසර 03 සිට වසර 06ක කාලයක් දක්වා භාවිතයට ගෙන නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

7.9 විගණකාධිපති වාර්තාව සඳහා නිරීක්ෂණ

SEUSL /VC/AR/2023/02

2023 අගෝස්තු මස 28

විගණකාධිපති ,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශණ මත විගණකාධිපති වාර්තාව.

මෙය ඔබ විසින් අප වෙත 2022 ජූලි මස 31 වන දින යොමු කල BTC/C/SEUSL/01/22/01 වාර්තාව සඳහා අප පහත සඳහන් නිරීක්ෂණ ලබා දෙන්නෙමු.

1. මූල්‍ය ප්‍රකාශණ

1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) මේ සම්බන්ධයෙන් කමිටුවන් කිහිපයක් පත්කර ඇත. කෙසේ වුවද, විවිධ හේතූන් මත මෙම කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. මෙම ක්‍රියාවලිය ඉක්මන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(b) රාජ්‍යය තක්සේරු දෙපාර්තමේන්තුව, නැගෙනහිර ප්‍රාදේශිය කාර්යයාලය - මඩකලපුව තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ දැනටමත් සාකච්ඡා කරගෙන ඇති අතර විශ්ව විද්‍යාලය සතු මෙම ඉඩම් 05 නැවත අගය කිරීම සම්පූර්ණ කිරීමට නොදුරු අනාගතයේ දී අපේක්ෂා කෙරේ.

(c) වත්කමේ සත්‍ය අගයය හඳුනාගත් පසු සහ එය ආයතනයෙහි භාරකාරිත්වයට ලැබීමෙන් පසු එය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. මෙහි දී, මෙම වැඩ කටයුත්ත 2022 වසරේ ජූලි මස 19 වන දින නිම කරනු ලැබුව ද, සත්‍යය වටිනාකම හඳුනා ගනු ලැබුවේ 2023 වර්ෂයේ මුල් කාර්තුවේදී , එනම් එම අවසන් බිල ඉදිරිපත් කිරීමෙන් පසුවය. මෙම අවසන් බිල ඉදිරිපත් කරනු ලැබුවේ 2023 වර්ෂයෙහි පෙබරවාරි මසදීය. එමනිසා, 2023 වර්ෂයේ දේපල පිරියත හා උපකරණ යටතේ මෙම වත්කම් හඳුනා ගැනීමට නියමිතය.

1.3 විශ්වවිද්‍යාලයෙහි 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශණ සඳහා කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

2. අනෙකුත් නීතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1

2.1.1

2.1.2

2.1.3

2.2

2.2.1

2.2.2

(a) (i) අදාල අයිතම අස්ථාන ගත වීම් සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම් සපයන ලෙස දන්වමින් අදාල අංශ/ඒකක ප්‍රධානීන් වෙත ලිපි ලබා දීමට කටයුතු කර ඇති අතර එම පාර්ශව විසින් ලබා දෙනු ලබන ප්‍රතිචාරයන්ට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

(ii)

විස්තරය	**අගයය (රු.)** වසර දෙකකට අධික කාලයට වැඩි හිමිකම් නොලද 2023.04.30 වන දිනට යාවත්කාලීන කරන ලද ශේෂයයන්	**තත්ත්වය**
කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල්	12,880,307.04	මූල්‍ය අංශයෙන් ලද දැනුම් දීම මත අදාල ඒකක/ අංශ විසින් සැපයුම්කරුවන්/ සේවය සපයන්නන් සමඟ සාකච්ඡාවන් ආරම්භ කර ඇත. වසර දෙකකට අධික හිමිකම් නොලද අගයයන් විශ්වවිද්‍යාල ආදායමක් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.
සැපයුම්කරුවන්ගේ රැඳවුම් මුදල්	5,386,722.65	
ආපසු ගෙවිය හැකි තැන්පතූන්	265,000.00	

(b) විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ නිලනිවාස නඩත්තු කිරීම් සහ වෙන් කිරීම් සඳහා අතුරුනීතීන් ප්‍රකාරව අදාල අය කිරීම් අදාල නිල නිවාස භාවිතයට ගනු ලබන පිරිසගෙන් මාසික වාරික ලෙස අයකර ගනු ලැබේ.

(c) ශ්‍රී ලංකාවෙහි පවතින විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යයන කාර්යය මණ්ඩලය, සම්මතයක් ලෙස පැමිණීම සහ පිටවීම සටහන් නොකෙරේ. අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් විවිධ ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු, පර්යේෂණ සහ ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන් වල නිරත වන

බැවින් ඔවුන්ගේ වැඩ කටයුතු පැය 08ක කාලයක් දක්වා සීමා කළ නොහැක. එමනිසා මෙය ප්‍රායෝගික නොවේ.

(d) රාජ්‍යය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් මඟින් මාණ්ඩලික ශ්‍රේණියෙහි නිළධාරින්හට ලබාදුන් ණය පහසුම් එම වසර අග භාගය වන තෙක් අත්හිටවා ඇති ලෙස 2022 අප්‍රේල් මස 26 වන දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛණ අනු කොටස් 03(x) හි 03/2022 චක්‍රලේඛය මඟින් දක්වා ඇත.
අත්තිකාරම් 'B' ගිණුම් ඔස්සේ ණය පහසුකම් සපයන ආයතන විසින් අදාල ප්‍රතිපාදනයන් ලබා ගැනීම සඳහා රාජ්‍යය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්හි කටයුතු සම්බන්ධයෙන් ඇස්තමේන්තුන් භාණ්ඩාගාරය වෙත යොමු කල යුතුව ඇත.
එහෙත් එලෙස කුමණ සේවකයකුහට හෝ එනම්, මාණ්ඩලික ශ්‍රේණියෙහි නිළධාරින් ද ඇතුලත්ව ණය පහසුකම් සැපයීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතිය තුල ප්‍රතිපාදන සපයනු නොලැබේ. ඒ වෙනුවට, අදාල කාලපරිච්ඡේදය තුල සේවකයන්ගෙන් ණය වාරික නැවත අයකරවා ගැනීම් මත සේවකයන්හට ණය පහසුකම් සපයනු ලැබේ. තව ද, 1994 ජුලි මස 18 වන දින නිකුත් කරන ලද කොමිසම් සභා චක්‍ර ලේඛ 606 ප්‍රකාරව ආපදා ණය වෙනුවෙන් කිසිදු අතිරේක ප්‍රතිපාදන සලසා නොදෙන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් දක්වා ඇත. එමනිසා, අභ්‍යන්තර ඉපයුම් මඟින් හෝ ආපසු අයකරවා ගැනීම් මඟින් මෙම ණය පහසුකම් සේවකන් හට සලසා දීමට විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂා කෙරේ.
ඉහත සඳහන් කරන ලද කරුණු සලකා බැලීමේ දී, රාජ්‍යය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් මත ලබා දෙන්නාවූ ණය මත පනවන ලැබූ තහනම කිසිදු අයුරකින් විශ්වවිද්‍යාල සේවකයන්හට ලබා දෙන්නාවූ ණය පහසුකම් සම්බන්ධයෙන් අදාල නොවන බව දැක්විය හැකිය.

(e) 2015/13 දරණ පිහිටුවීම් (Establishment Circular) චක්‍රලේඛනය මත, 2022 ජනවාරි මස සිට 2022 ජුනි මස දක්වා අතිරේක ඉන්ධන භාවිතා කිරීම සම්බන්ධයෙන් වන අනුමැතිය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර එය 2022 ඔක්තොම්බර් මස නැවත විශ්වවිද්‍යාලය වෙත ලැබුණි. මෙම ගැටලු ව CVCD කමිටුවෙහි දී ද අවධාරණය සඳහා පාත්‍ර වූ අතර එම නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර චක්‍රලේඛණය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් වන තීරණයන් අපේක්ෂාවෙන් පසුවේ. තව ද, 2022 වසරේ අගෝස්තු මස සිට 2022 වසරේ දෙසැම්බර් මස දක්වා භාවිතා කරන ලද අතිරේක ඉන්ධන සම්බන්ධයෙන් පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත.

(f) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ රාජ්‍යය ප්‍රතිපත්තීන් ලෙස අධ්‍යයන පොදු සහතිකපත් උසස් පෙළ සමතුන් වැඩි පිරිසක් සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා දීමට කටයුතුකරනු පිණිස අධ්‍යයන වර්ෂ 2019/2020 සඳහා අතිරේක බඳවා ගැනීම් ලෙස සිසුන් 432 බඳවා ගැනීමට කටයුතු කෙරිණි. අධ්‍යයන වර්ෂ 2020/2021 සඳහා ද එම ප්‍රමාණයෙන්ම අතිරේක සිසු පිරිසක් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කල අතර බොහෝමයක් පීඨ විසින් තම අධ්‍යයන

වර්ෂයේ කටයුතු ආරම්භ කරනු ලබනුයේ මැයි/ ජූනි මස තුලදීය. තව ද, අතිරේක බඳවා ගැනීම් නිසා සිදු වූ අධික අධ්‍යයන වැඩකටයුතු කලමනාකරණය කර ගැනීම සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පීඨ 06 සඳහා නව පුරප්පාඩුන් 20ක් ස්ථාපනය කිරීම සඳහා අවසර ලබා දුනි.

එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් තාක්ෂණ පීඨයෙහි අධ්‍යයන පුරප්පාඩුන් සපුරාලීම සඳහා 2020 වර්ෂයේ නොවැම්බර් මස 22 වන දින සහ අනෙකුත් පීඨ 5හිම පුරප්පාඩුන් සපුරාලීම සඳහා 2021 මැයි 09 වන දිනවල දී වෙළඳ දැන්වීම් කරනු ලැබීය. 2022 අප්‍රේල් මස 26 වන දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛණ 03/2022 නිකුත් වීමට පෙර මෙම දැන්වීම් පලකිරීමට කටයුතු කරනු ලැබීය.

අතිරේක සිසු බඳවා ගැනීම නිසා ඇති වූ අධ්‍යයන නිලධාරීන්ගේ අධික වැඩ ප්‍රමාණය සීමා කිරීම සඳහා අවශ්‍ය නිළධාරීන් බඳවා ගැනීමට ආදාල අවසරය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ලබා ගන්නා ලදි.

2022.03.29 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන නිළධාරීන් බඳවා ගැනීමට ආදාල අවසරය ලබා දෙන ලදී. (ඇමුණුම-I විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සභාපති විසින් යොමුකරන ලද විද්‍යුත් ලිපිය)

තව ද, වර්තමාන ආර්ථික අභියෝග හමුවේ රාජ්‍යය අංශය වෙත සිදු කරනු ලබන බඳවා ගැනීම් සම්බන්ධව 2022.09.23 දින ගනු ලැබූ කැබිනට් තීරණ අංක 22/1353/605/011 සම්බන්ධයෙන් හදිසි අවධාරණයට පාත්‍ර කරන ලෙස දන්වමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023.02.14 දින දරණ UGC/HR/2/3/1 (ඇමුණුම-II) ලිපිය සමඟ 05/12/2022 දින දරණ PMO/SEC/01/09 ලිපිය අගමැති කාර්යයාලය ලේකම් වෙත යොමු කර ඇත. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023.09.23 දිනට පසු සිදුකරනු ලැබූ අධ්‍යයන නිළධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් පමණක් කරුණු විමසනු ලැබීය. කෙසේ වුවද, ඉහත සඳහන් කළ බඳවා ගැනීම් 18ම 2022.09.23 වන දින ගනු ලැබූ කැබිනට් තීරණයට පෙර සිදුකර ඇත.

2.2.3

2.2.4

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a) ශිෂ්‍යය කණ්ඩායමෙහි ශිෂ්‍යය සංඛ්‍යාව ඉහල අගයක පවතින බැවින් උත්තරපත්‍ර ඇගයීමේ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගත ව ඇති බවට බාහිර උපාධි ඒකකය සහ වෘත්තීය අධ්‍යාපන ඒකකය විසින් පැහැදිලි කිරීම් කර ඇත. එමනිසා, අප විසින් කමිටු ඇගයුම් (panel marking) ක්‍රමයක් හඳුන්වා දුන් අතර මාස තුනක කාලයක් ඇතුලත ප්‍රතිඵල නිකුත්

කිරීමට තීරණය කරන ලදී. ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද වන පිරිස් වෙත ඔවුන්ගේ ගෙවීම් අඩු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබීය.

තව ද, 2014/2015 සහ 2015/2016 වන කණ්ඩායම් සඳහා වන ඇගයුම් කටයුතු පහත හේතූන් මත ප්‍රමාද විය.

1. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ව පැන නැගුණු සීමා කිරීම් සහ තත්ත්වයන්.

2. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් විශ්ව විද්‍යාලය වසා තැබීම සහ මාර්ග ගත ක්‍රමය ඔස්සේ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නව ක්‍රියාපටිපාටීන් බිහිවීම මෙන්ම ඒ සඳහා වන අනුමැතියන් අදාල බලධාරීන් මඟින් ලබා ගැනීම ප්‍රමාදවීම හේතුවෙන්, උත්තරපත්‍ර ඇඟයීමේ කටයුතු සිදු කිරීමට ප්‍රමාද විය.

(b) 2017 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2022 වසරේ දෙසැම්බර් මස 31 වන දින දක්වා අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද පර්යේෂණ දීමනාවන්ට අදාල තොරුතුරු පහත දැක්වේ. කාර්යය මණ්ඩල නිළධාරීන් 14 දෙනෙකු පර්යේෂණ කටයුතු අවසන් කර අවසන් වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර පර්යේෂණ ව්‍යාපෘතීන් 17ක කටයුතු සිදුකරමින් පවතී.

වර්ෂය	පීඨය	නිළධාරීන් සංඛ්‍යාව	ලබා දුන් ප්‍රදානය රු.	පර්යේෂණ කටයුතු අවසන් කර ඇති නිළධාරීන් සංඛ්‍යාව	වර්තමාන තත්ත්වය
2017	FE	02	198000	01	එක් කාර්යය මණ්ඩල නිළධාරියකු – සම්පූර්ණ කර ඇත. එක් කාර්යය මණ්ඩල නිළධාරියකු - ඉල්ලා අස්කර ගනු ලැබිණි.
	FIA		253000		
2018	FMC	06	101235	06	කාර්යය මණ්ඩල නිළධාරීන් හය දෙනෙකු - සම්පූර්ණ කර ඇත.
	FAS		210000		
	FAS		400000		
	FAS		500000		
	FMC		200000		
	FMC		50000		
2019	FAS	08	402700	05	කාර්යය මණ්ඩල නිළධාරීන් පස් දෙනෙකු - සම්පූර්ණ කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – ඉල්ලා අස්කර ගනු ලැබිණි.
	FE		590000		
	FIA		505750		
	FAS		495850		
	FMC		290000		
	FMC		300000		

	FMC		260000		කාර්යය මණ්ඩල නිළධාරීන් එක් අයෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී (2023.12.31ක දක්වා කාලය දිර්ඝ කර ඇත.)
	FMC		100000		
2020	FE	04	200000	02	කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – සම්පූර්ණ කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී (2023.12.30ක දක්වා කාලය දිර්ඝ කර ඇත)
	FE		500000		
	FE		489000		
	FE		499950		
2021	FAS	11	504440		කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – ඉල්ලා අස්කර ගනු ලැබිණි කාර්යය මණ්ඩල නිළධාරීන් නව දෙනෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී
	FT		249300		
	FT		994957		
	FE		580000		
	FAS		499800		
	FMC		546000		
	FMC		240000		
	FT		980466		
	FT		999913		
	FAS		396461		
	FAS		497000		
2022	FAS	05	500000		කාර්යය මණ්ඩල නිළධාරීන් පස් දෙනෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී
	FAS		500000		
	FAS		498191.87		
	FT		496500		
	FT		278800		

(c) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකම කිරීමට ප්‍රමාද වීම සඳහා සාධක කිහිපයක් බලපා ඇත. මෙම ව්‍යාපෘතිය පිරිනමන අවස්ථාවේ දී, කොවිඩ්-19 වසංගතය ලොව පුරා ව්‍යාප්ත වෙමින් පැවතුණි. මෙම ගෝලීය අර්බුධයෙහි ප්‍රතිඵලයන් ලෙස, රට වසා තැබීම වැනි තත්ත්වයන් මත මෙන්ම ගමනාගමන අඩපණ වීම්, ආනයන තහනම්, සම්පත් හිඟය, ශ්‍රමික හිඟය සහ කොන්ත්‍රාත් අමුද්‍රව්‍යවල කඩිනම් මිල උච්ඡාවචණයන් නිසා කොන්ත්‍රාත්කරුට වැඩ කටයුතු ආරම්භ කිරීමට බාධා ඇති කරනු ලැබීය.

තව ද, කඩින් කඩ ඇති වූ වර්ෂාකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම කාර්යයන් ආරම්භ කිරීම සඳහා බාධා ඇති වීම ද, මෙම කර්තවයන් ප්‍රමාද වීමට හේතු විය.

වර්තමානයේ දී, අමුද්‍රව්‍යවල කඩිනම් මිල උච්ඡාවචණයන් නිසා කොන්ත්‍රාත්කරු විසින් ඉතා අභියෝගකාරී තත්ත්වයකට මුහුණ දී ඇත. එමනිසා, විධිමත් ලෙස අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීමක් කර ඇත. ඉන්පසු, මෙම ගැටලුව ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව විසින් සලකා බලනු ලැබීය. මෙම කමිටුවෙහි සමාජිකයන් ලෙස උප කුලපති, තාක්ෂණික පීඨයෙහි පීඨාධිපති, පරිශීලක දෙපාර්තමේන්තුවෙහි නියෝජිතයකු, වැඩබලන ලේඛකාධිකාරී, වැඩබලන මුල්‍යාධිකාරී සහ අභ්‍යන්තර විගණකවරුන්ගෙන් සමන්විත විය. මෙය සම්බන්ධයෙන් නිසිලෙස සලකා බැලීමෙන් පසු, මෙම කමිටුව විසින් අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවසන් කිරීම සඳහා තීරණය කරනු ලැබිණි. මෙම ව්‍යාපෘතියෙහි ක්‍රමානුකූල ලෙස කරගෙන යෑම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් පියවර ගැනීමට නියමිතය.

(d) මෙම විමසුමෙහි අන්තර්ගත අයිතමයන් ගැන නිරීක්ෂණය කිරීමේදී, රසායනාගාර උපකරණ 13ක් අතුරෙන් අයිතමයන් 2ක් පමණක් එනම්, එන්ජින් ඩයිනමෝ මීටර් සහ බ්‍රේක් ටෙස්ට් යන්ත්‍රය (Engine Dynamometer සහ Brake Test Machine) පමණක් භාවිතය සඳහා ගෙන නොමැත. කෙසේ වුවද, අනෙකුත් සියලුම අයිතම සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන අතර නිසි ලෙස නඩත්තු කටයුතු සිදු කරමින් පවතින අතර අදාල අරමුණු වෙනුවෙන් භාවිතයට ගනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද භාවිතයට නොගත් අයිතම ප්‍රාථමික වශයෙන් ස්ථාපනය කිරීමට සහ මඟ පෙන්වීම් කටයුතු කිරීම සඳහා ප්‍රමාදයන් සිදු වූ අතර එම ප්‍රමාදයන් අපගේ පාලනයෙන් අභිබවා පැණ නැගී තත්ත්වයන් වේ. අදාල ආයතනය විසින් වගකීමට බැඳී ඇති අයුරින් සහ එකඟ වූ කාල පරාසය තුල ස්ථාපිත කටයුතු සිදු නොකිරීම මෙම ප්‍රමාදයන් සඳහා හේතු වී ඇත. අදාල ස්ථාපිත කිරීම් කඩිනම් කරමින් සිදු වූ අතර වර්තමනය වන විට එහි සියලු කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ අවසන් කර ඇත.

ඉහත සඳහන් කල භාවිතයට නොගත් අයිතමයන් ද්විත්වයෙහි ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය සලකා බැලීමේ දී, මෙම අයිතම මෙම වසරෙහි ඉදිරි අධ්‍යයන සැසියෙහි දී සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීමට සහ උපයෝජනය කිරීමට කටයුතු කිරීමට නියමිතය. මෙමඟින් මෙම යන්ත්‍රයන් ඵලදායී ලෙස භාවිතයට ගැනීම මෙන්ම යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙහි අගයය ඉහල නැංවීම සඳහා ද වැදගත් වනු ඇත.

සියලුම යන්ත්‍ර සහ උපකරණයන් නිසිලෙස ක්‍රියාත්මකවන බවට තහවුරු කරගන්නා ලදී. එවැනි ක්‍රියාත්මක කිරීම් ප්‍රමාද වීම් සඳහා සහ නිෂ්ක්‍රීය කාලයන් ඉදිරියේ දී ඇතිවීම වලක්වා ගැනීම සඳහා දැඩි අධීක්ෂණයන් සහ අධීක්ෂණ පියවරයන් ගැනීමට නියමිතය.

මහාචාර්ය ඒ. රමීස්
උප කුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

පිටපත: සහකාර අභ්‍යන්තර විගණක

ඇමුණුම

South Eastern University of Sri Lanka

Annexure - I

Thasleen I.L. thasleen <thasleen@seu.ac.lk>

Fwd: Filling of Vacancies of the Academic Staff of the Universities

1 message

Vice Chancellor, South Eastern University of Sri Lanka <vcseu@seu.ac.lk> Tue, Mar 29, 2022 at 4:30 PM
To: "Thasleen I.L. thasleen" <thasleen@seu.ac.lk>
Cc: MZM Rizan <mzmrizan@seu.ac.lk>

Dear DR/ AE,

The below is the approval given by Chairman/ UGC to conduct the interviews for the recruitment of permanent academic staff. Process the short-listing of candidates as quickly as possible.

Thank you.

Prof. Rameez
Vice Chancellor

E/5
file
I

Copy: AR/ OVC

-------- Forwarded message --------
From: **Chairman** <chairman@ugc.ac.lk>
Date: Tue, 29 Mar 2022 at 4:17 PM
Subject: Filling of Vacancies of the Academic Staff of the Universities
To: Wijeratne Chandrika Prof <vc@cmb.ac.lk>, Prof U Dissanayake <vc@pdn.ac.lk>, Vice Chancellor <vc@sjp.ac.lk>, Prof N R De Silva <vc@kln.ac.lk>, Prof N D Gunawardena <vc@mrt.ac.lk>, Vice Chancellor University of Ruhuna <vc@admin.ruh.ac.lk>, Prof F C Ragel <vc@esn.ac.lk>, Vice Chancellor South Eastern University of SriLnka <vcseu@seu.ac.lk>, Dr B A Karunaratne <vcrusl@yahoo.com>, Vice-Chancellor Sabaragamuwa University of Sri Lanka <vc@sab.ac.lk>, Prof J C Edirisinghe Actg. <vc@wyb.ac.lk>, Tilakarathne P.M.C. Prof. <vc@ou.ac.lk>, <vc@uwu.ac.lk>, Vice Chancellor UVPA <vc@vpa.ac.lk>, Vice Chancellor office University of Jaffna <vc-office@univ.jfn.ac.lk>, Mangaleswaran T Dr. <tmangales@yahoo.com>, Prof Janitha A Liyanage <vc@gwu.ac.lk>
Cc: Chandana Udawatte <cpudawatte@gmail.com>, Dishan Jayantha <dishan@ugc.ac.lk>

Vice-Chancellors of All Universities,

Dear all,

This is further to my email dated 02.03.2022 with a copy of the Sinhala letter dated 22.02.2022 sent by the Secretary of the Ministry of Education regarding "Review of Government Expenditure".

Approval has been received from the Secretary, Ministry of Education to go ahead with filling of vacancies in the Academic Positions(temporary and Permanent) of the Universities as per todate.

Thank you.

Snr Prof. Sampath Amaratunge
DLit [Vidyodaya], PhD [Kagoshima], MSc [Saga], MA [Colombo], BA Economics [USJ]
Chairman[UGC] and Chair/ Senior Professor of Business Economics[USJ]
Sri Lanka

Mobile : +94 [0]-714-191-558
Office : +94 [0]-112-696-511
Fax : +94 [0]-114-714-565

Web: https://www.ugc.ac.lk

Fb : https://www.facebook.com/SampathAmaratunge

--
Prof.A.Rameez, Ph.D (NUS), M.Phil (UPDN), PGD (UoB-UK), B.A.Hons.(SEUSL)
Vice Chancellor,
Professor in Sociology
South Eastern University of Sri Lanka,
Oluvil.

P.O. Box 01,
Oluvil,
Sri Lanka.

Academic Establishments
RECEIVED
01 MAR 2023
360
SEUSL - OLUVIL

Annex - II

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானிய ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය எனது இலக்கம் My Number	UGC/HR/2/3/1
ඔබේ අංකය உமது இலக்கம் Your Number	
	14.02.2023

තැපැල් පෙට්ටිය
தபாற் பெட்டி
Post Office Box 1406

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
20, வோட் இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

Reviewing the Recruitment Process in the Public Service

This is with reference to the letter No. PMO/SEC/01/09 dated 05.12.2022 sent by the Secretary to the Prime Minister requesting to pay the urgent attention to the Cabinet decision dated 23.09.2022 made on the Cabinet Paper No. 22/1353/605/011on Reviewing the Recruitment Process in the Public Service, in view of the current economic challenges (Letter sent by the Secretary to the Prime Minister is annexed as **Annex I**).


It has been stated that information has been requested on cases of making appointments for the vacant posts in the public service without proper approval and ignoring the said Cabinet decision. Therefore, you are kindly informed to abide by the above decision until further notice.

Furthermore, you are hereby requested to send a report on the recruitments/appointments and promotions that have been made without the formal approval of the Committee appointed by the Cabinet to review the recruitment process in the public sector as per the above Cabinet Decision, along with your observations after being personally satisfied such information are true and correct, in order to submit the same to such Committee for review.

Your early response in this regard is highly appreciated.

Senior Prof. Sampath Amaratunge
Chairman

දුරකථන தொலைபேசி Telephone	2695301 2695302 2692557	ෆැක්ස් பெக்ஸ் Fax	2680045	ඉලෙක්ට්‍රොනික තැපෑල மின் தபால் Website	http://www.ugc.ac.lk



PRIME MINISTER'S OFFICE

Annexure

15 DEC 2022

15 DEC 2022

1. ප්‍රකාශිකාව දේශීකාව
2. විත්තරකාරිය
3. ඇල්ෆ්‍රඩ් ජූනියර් ඇන්ඩ්‍රිව් ඒබ්‍රහම්
4. ඇල්ෆ්‍රඩ් ජූනියර් ඇන්ඩ්‍රිව් ඒබ්‍රහම්
5. ඇල්ෆ්‍රඩ් ජූනියර් ඇන්ඩ්‍රිව් ඒබ්‍රහම්
6. අධිකරණ ලේඛකාධිකාරී, විනය පාලන අධිකාරී සහ අතිරේක මහේස්ත්‍රාත්, මහේස්ත්‍රාත් අධිකරණය
7. අධිකරණ රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී සහ අතිරේක මහේස්ත්‍රාත්, මහේස්ත්‍රාත් අධිකරණය
8. ඒ.ඒ.ජී. ඇල්විස් ඇන්ඩ්‍රිව් ඒබ්‍රහම්
9. ඇල්ෆ්‍රඩ් ජූනියර් ඇන්ඩ්‍රිව් ඒබ්‍රහම්